ISSN 1391 - 1031
2014 අගෝස්තු
20 වෙළුම 05 කලාපය

ආධාරය රු 30/=

# ඌ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.

"සමාජමය නිෂ්පාදනය හා බෙදා හැරීම විද්‍යාත්මක මාර්ගයක් අනුව පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට, ඒවා වැඩකරන ජනතාවගේ ජීවිතය පහසු කිරීමේ සහ හැකි තරම් දුරට ඔවුන්ගේ යහසාධනය වැඩිදියුණු කිරීමේ අරමුණට යටත් කිරීමටත් ඉඩ සලසන්නේ සමාජවාදය පමණකි. මෙය ඉටුකළ හැක්කේ සමාජවාදයට පමණකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**08 වෙළුම**
**134 - පිටුව**




# නිදහස් සන්ධානයේ
# බිඳවැටීම ඇරඹෙයි!

**සන්ධාන ආණ්ඩුව තුළ වර්ධනය වෙමින් ආ අභ්‍යන්තර අර්බුදය ඌව පළාත් සභා මැතිවරණය පැවැත්වීමටද පෙර පුපුරායාම ඇරඹී තිබේ. එය ඉදිරියේ පැවැත්වෙනු ඇති බවට විශ්වාස කෙරෙන හදිසි ජනාධිපතිවරණයට අතිශය තීරණාත්මක වනු ඇතැයි දේශපාලන විශ්ලේෂකයෝ පවසති.**

විශේෂයෙන් කාලයක් පුරා විවිධ අවස්ථාවන්හි සන්ධාන ආණ්ඩුවේ පක්ෂ අතර ඇති වූ ගැටුම්කාරී තත්වයන් මේ වන විට යටපත් කළ නොහැකි අයුරින් උත්සන්න වී තිබේ. විමල් වීරවංශ අමාත්‍යවරයාගේ ජාතික නිදහස් පෙරමුණ ඌව පළාත වෙනුවෙන් වෙනම තරග කිරීමට තීරණය කිරීම එහි ආසන්නතම පුපුරායාමය. විධායක ජනාධිපති ධූරය සම්බන්ධයෙන් හෙළ උරුමයේ විවිධ කණ්ඩායම් ආණ්ඩුවට එරෙහි මත දැරීම ආණ්ඩුවේ තවත් කණ්ඩායම්වල දැඩි විවේචනයට ලක්වීමද මෙහිදී සැලකිල්ලට ලක්වී තිබේ. එසේම මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ බන්දුල යාලේගම අමාත්‍යවරයා ජනාධිපතිවරයාගේ දෑත් ශක්තිමත් කිරීම සඳහා යැයි කියමින් එ.ජා.ප.යෙන් ආණ්ඩුවට පැමිණි පිරිස් හේතුවෙන් ශ්‍රිල.නි.ප.ය විනාශ වී ඇති බවට බලවත් චෝදනාවක්ද ඉදිරිපත් කළේ පසුගියදාය. ආණ්ඩුවට බලය තිබුණද මොළය නැතැයි ඔහු පවසා තිබිණි. මේ හා සමාන මත පසුගිය කාලයේ ශ්‍රිල.නි.ප.යේ මැති ඇමතිවරුන් ගණනාවකගෙන්ද ප්‍රකාශ විය.

සන්ධානය තුළ වර්ධනය වන මෙම අර්බුදකාරී තත්වය විසින් ප්‍රකාශයට පත්කරමින් ඇත්තේ ආණ්ඩුවේ බලය දුර්වල වෙමින් තිබීම බව විශ්ලේෂකයෝ පෙන්වා දෙති. මෙවැනි අර්බුදයන්ට තුඩු දුන් හේතු අලුත් ඒවා නොවන බව කියා සිටින ඔවුහු ආණ්ඩුව ශක්තිමත්ව තිබියෙදී එකිනෙකා අතර ප්‍රතිවිරෝධතා යටපත්වී පැවතියද ආණ්ඩුව දුබල වීමත් සමග ඒවා නිරාවරණය වීම වැළැක්විය නොහැකි වී ඇති බව කියා සිටිති. මෑතකාලීන දේශපාලන ඉතිහාසය තුළද මෙවැනි වර්ධනයන් අරුමයක් නොවන බව ප්‍රකාශ කරන ඔවුහු 2001 සමයේ පොදු පෙරමුණු ආණ්ඩුව තුළද මෙවැනි පුපුරායෑම් දක්නට ලැබුණු බවත් 1976 වන විට සමගි පෙරමුණු ආණ්ඩුවෙන්ද පර්ශවකරුවන් ඉවත්වෙමින් තිබූ බවත් මතක් කර දෙති.

පසුගිය කාලයේ විවිධ සිදුවීම් තුළ ආණ්ඩුව ජාතිවාදී හා ආගම්වාදී වූ බව කියමින් මුස්ලිම් හා දෙමළ ජන කොටස් ආණ්ඩුව කෙරෙහි කලකිරී සිටින අතර ආණ්ඩුවේ අධිරාජ්‍යගැති හැසිරීම හේතුවෙන් දේශප්‍රේමී මුහුණුවරද බිඳවැටෙමින් තිබේ. මේ තත්වය තුළ සන්ධාන ආණ්ඩුවට සහය පළ කරමින් සිටි හවුල්කාර පක්ෂවල ඡන්ද පදනම් ශීඝ්‍රයෙන් ගරාවැටෙමින් තිබීම ඔවුන් දැඩි කැළඹිල්ලට පත්කරවා ඇත. එසේම රාජපක්ෂ ප්‍රබලයින් ආණ්ඩුව ශක්තිමත් කරගැනීම සඳහා සන්ධානයේ පක්ෂවලින් පුද්ගලයින් බිලීබෑමට කටයුතු කිරීමද පෙරළා එම පක්ෂ හා ආණ්ඩුව අතර විරසකභාවයන් වර්ධනය කර ඇති අතර ආණ්ඩුවේ කැඩී බිඳීයාම හා සමගාමීව එම පක්ෂද බිඳීයාම අනිවාර්යයක් වී තිබේ. මේ අතර තම බලය වර්ධනය කරගැනීම සඳහා ශ්‍රීල.නි.ප.යේ රාජපක්ෂ විරෝධීහුද ඉදිරි මැතිවරණවලදී ආණ්ඩුවේ පරාජය අපේක්ෂා කරමින් සිටිති.

මේ තත්වය තුළ ඌව පළාත් සභා මැතිවරණයේදීද ආණ්ඩුව විශාල පසුබෑමකට ලක්වනු ඇති බව පැහැදිලිය.

**3** **සංවාදය ...**



රාජපක්ෂවරුන්ගේ නියෝජිතයා බවට පත්වූ ශෂීන්ද්‍ර රාජපක්ෂට මෙවර මැතිවරණයේදී තමන්ගේ බලය...

**5** **පහසු මඟද...**



ඔවුන් මේ මොහොතේ දක්වන කඩිසරකම දෙස බලන විට, කලබලය දෙස බලන විට ඔවුන්ගේ ඇත්ත බිය...

**10** **පලවා හැරෙන ධීවරයා...**



ධීවර ප්‍රජාව ඉල්ලා සිටින්නේ ධීවර ආම්පන්න මත බදු ලිහිල් කරන ලෙසය. නමුත් ආණ්ඩුව..

**11** **ප්‍රාග්ධනය සහ ලාභය...**



අතිරික්ත වටිනාකම ලාභයේ ස්වරූපයෙන් පෙනී සිටින විට, විචල්‍ය ප්‍රාග්ධනය...

තරුණ.................... 04
දැක්ම.................... 08
ජාත්‍යන්තර............ 09
කාන්තා................ 12
වේදිකාව............... 13
විශේෂාංග.............. 14

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සියලු සේවක වැටුප් වැඩිකරනු ආණ්ඩුවට බලකරමින් පත්‍රිකා දශලක්ෂයක්



දිනෙන් දින ඉහළ යන ජීවන වියදම හමුවේ වැඩකරන ජනතාවගේ වැටුප් වැඩි කිරීම සඳහා ආණ්ඩුවට බලකරමින් ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකා දශලක්ෂයක් බෙදා හැරීමට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය කටයුතු සූදානම් කර ඇති අතර එහි ආරම්භක පියවර ලෙස පසුගිය 21 දින කොළඹ කොටුවේදී එම අත්පත්‍රිකා බෙදා හැරීම ආරම්භ කෙරිණි. මෙම අවස්ථාවට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති රාමලිංගම් චන්ද්‍රසේකර් ඇතුළු වෘත්තීය සමිති නායකයෝ ගණනාවක් සහභාගි වූහ.

# උපාධිධාරී සටන් ඇරඹේ පත්‍රිකා ලක්ෂයක් බෙදාහැරේ




එක්ලක්ෂ දසදහසකට ආසන්න වූ රාජ්‍ය සේවා උපාධිධාරින්ගේ වෘත්තීය අයිතීන් කප්පාදුව හා වෘත්තීය මට්ටම හැල්ලු කිරීම බරපතල ලෙස සිදුවීම හේතුවෙන් ඉදිරියේදී දැවැන්ත වෘත්තීය ක්‍රියාමාර්ග වෙත යාමට සිදුවන බව රැකියාලාභී උපාධිධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා පවසයි. මේ සම්බන්ධයෙන් තම සංගමය දිගින් දිගටම ආණ්ඩුවට ලිඛිතවත්, උද්සෝෂණ ක්‍රියාමාර්ග මගිනුත් කරුණු දැක්වූවද ආණ්ඩුව තවමත් නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටින බවද ඔහු පෙන්වා දෙයි.

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවය තුළ 93 සිට 2013 දක්වා බඳවා ගනු ලැබූ උපාධිධාරින්ගේ ප්‍රමාණය 110,000 කට ආසන්න වන බවත් මෙම උපාධිධාරීන්ගේ වෘත්තීය හැල්ලු කිරීමට එරෙහිවත්, උපාධිධාරින් සඳහා සුදුසු පිළිගත් වෘත්තීය මට්ටමක් ලබාදෙන ලෙසත් බලකරමින් දැනුවත් කිරීමේ පත්‍රිකා ලක්ෂයක් බෙදා හැරීමේ ජාතික වැඩසටහනක් පසුගිය ජූලි 21 දින සිට දින කිහිපයක් පුරා පැවැත්වීමට කටයුතු යොදා ඇති බවද චන්දන සූරියආරච්චි සහෝදරයා පවසා සිටී.

උපාධිධාරින් සඳහා වසර 20 ක් තිස්සේ අහිමි කර තිබූ ශ්‍රී ලංකා පරිපාලන සේවා (සීමිත) තරඟ විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම පසුගිය දෙසැම්බර් වන විට දිනා ගැනීමට තම සංගමයට හැකි වූ බවද ඔහු වැඩිදුරටත් පවසයි.

# මර්දනය නවතා මාතර ඩිපෝව විවෘත කරනු

## සේපාල ලියනගේ සහෝදරයා
### සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම්



මාතර ඩිපෝවේ සේවකයින්ට 2014 මාර්තු, අප්‍රේල්, මැයි යන මාසවල මාසික වේතන ලබාදෙන ලෙස ඉල්ලා සේවකයින් වෘත්තිය ක්‍රියාමාර්ගයට පිවිස ඇති අතර එහි බස් රථ 56ක් බලහත්කාරයෙන් අකුරැස්ස, කොග්ගල, හක්මන, ගාල්ල යන ඩිපෝවලට ලබාදී මාතර ඩිපෝව වසා දැමීමට කටයුතු කර ඇත. මාතර ඩිපෝවේ හොඳම බස්රථ 56ක් ඉහත ඩිපෝවලට ලබාදී එම ඩිපෝව වසා දැමීමට ක්‍රියා කිරීම තම සංගමය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකින් බව සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම් සේපාල ලියනගේ සහෝදරයා පවසයි.

තමන්ගේ මාසික වේතනය මාස දෙක තුනක් ඉක්ම යන තෙක් ලබානොදුන් විට එම වේතන ඉල්ලා සේවකයින් වෘත්තීය ක්‍රියා මාර්ගයන් ගත් පසු එම ඩිපෝව වසා දැමීම වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්තියද යන්න එම සංගමය බලධාරීන්ගෙන් විමසයි. ශ්‍රී ලංගම සේවකයින්ට මාසික වේතන ලබාදීම සඳහා සෑම මාසයකම රුපියල් මිලියන 1351ක මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංගමයට අනිවාර්යයෙන් ලබාදිය යුතු නමුත් කිසිදු දිනෙක එම මුදල විධිමත්ව නියමිත දිනට ලබානොදේ. එමනිසාම නියමිත දිනට නියමිත වැටුප ලබානොදෙන එකම ආයතනය ශ්‍රී ලංගමය බවට අප රටේ ඉතිහාස ගතවී ඇති බවද සේපාල ලියනගේ සහෝදරයා පවසයි.

# 'අපේ පක්ෂය - අපේ දෑතින්'



සමාජවාදී කම්කරු සංගමය මගින් වාර්ෂිකව තම සාමාජිකයින් සඳහා ලබාදෙන කැට නැවත එකතු කිරීමේ උත්සව අවස්ථාවක් පසුගියදා බොරැල්ලේදී ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

'අපේ පක්ෂය - අපේ දෑතින්' යන තේමා පාඨය සහිතව මෙම කැට සාමාජිකයින් අතරේ බෙදා හරිනු ලැබූ අතර මෙහිදී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා අදහස් දක්වමින් පැවසුවේ ඉතිහාසය තුළ විශාල කැප කිරීම් කරමින් තම පක්ෂය ගොඩනැගීම සඳහා සහෝදරවරුන් දැවැන්ත මැදිහත්වීමක් සිදු කරනු ලැබූ බවත් මෙවැනි කැට ව්‍යාපාරයක් මගින් එහි කොටස්කරුවන් වීමට සියලු දෙනාටම අවස්ථාවක් ලැබී ඇති බවය.

# සහෝදරත්වය, සාමය ආරක්ෂා කිරීමට රාමසාන් දිනයේ අදිටන් කරගනිමු!

## ජනතා විමුක්ති පෙරමුණ

පසුගිය 29වැනි දිනට යෙදුණු රාමසාන් උත්සවය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා විසින් නිකුත් කරන ලද පණිවිඩය මෙසේය.

ශ්‍රී ලාංකේය ඉස්ලාම් බැතිමතුන් මෙන්ම ලෝකවාසී ඉස්ලාම් බැතිමතුන්ද සිය ආගමානුකූලව සමරන රාමසාන් දිනය අදට (29) යෙදී තිබේ.

අදට යෙදෙන රාමසාන් දිනයට පෙර සිට මාසයක කාලයක් පුරා ඉස්ලාම් බැතිමත්තු උපවාස ශීලය රකිති. දුෂ්කර ජීවිත ගත කරන තමන්ගේ සහෝදර ජනයාට උදව් උපකාර කිරීමට එම කාලය තුළ ඔවුහු ක්‍රියා කරති. නැති බැරි අයට උදව් කිරීම සඳහා ඇති හැකි අය මෙම කාලයේ ක්‍රියා කරති. මෙම උපවාස කාලය තුළදී විශේෂයෙන්ම අගය කිරීමට ලක් වන්නේ සහෝදරත්වය හා අල්පේච්ඡතාව, පරාර්ථකාමය ආදී ගුණාංගයන්ය.

සියලූම සම්පත් සහෝදරත්වයේ පදනම මත සියලූ දෙනා අතරේ සමානව බෙදී යා යුතුය යන අදහස මුල් කර ගනිමින් ඉස්ලාම් බැතිමතුන් විසින් සමරනු ලබන මෙම උපවාස කාලය මෙන්ම රාමසාන් උත්සවයද සුවිශේෂී වැදගත්කමකින් යුක්තය. එහි ආදර්ශය ඉස්ලාම් බැතිමතුන්ට පමණක් නොව සෙසු ජනතාවටද වැදගත් යැයි අපි විශ්වාස කරමු.

කෙසේ වෙතත් මේ මොහොතේ ලොව පුරා මුස්ලිම් ජනතාවට මෙන්ම ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට ද එල්ල වී ඇති අධිරාජ්‍යවාදී-සියොන්වාදී අශුද්ධ සන්ධානයේ කුමන්ත්‍රණ හා ප්‍රහාර පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ මුස්ලිම් ජනතාවගේ දැඩි අවධානය යොමු කර සිටී. අධිරාජ්‍යවාදී-සියොන්වාදී අශුද්ධ සන්ධානයේ ලාංකීය ඛණ්ඩය රාජ්‍ය අනුග්‍රහය ලබමින් මුස්ලිම් ජනතාවට එරෙහිව ක්‍රියාත්මක වෙමින් පවතී. එමගින් ජාතික සමගිය බිඳ දැමීමටත් අධිරාජ්‍යවාදයට හා සියොන්වාදයට ශ්‍රී ලංකාවට අත පෙවීමටත් අත්‍යාවශ්‍ය තත්වයන් ඇති කරමින් සිටී. මෙම මිනීමරු කුමන්ත්‍රණ පරාජය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට ආයාචනය කර සිටී.

මේ අවස්ථාවේ රාමසාන් උත්සවය පවත්වන ඉස්ලාම් බැතිමතුන්ට ජනතා විමුක්ති පෙරමුණේ උණුසුම් සුබ පැතුම් පිරිනමමු.

# පලස්තීනයට එරෙහි ඊශ්‍රායල කුමන්ත්‍රණ හෙළා දකිමු!

## සමාජවාදී තරුණ සංගමය

ඊශ්‍රායලය විසින් පලස්තීනයට එරෙහිව සිදුකරන අමානුෂික කුමන්ත්‍රණ සහ ප්‍රහාරයන්ද දැඩි ලෙස හෙළාදකිමින් සමාජවාදී තරුණ සංගමය විසින් පසුගිය 14වැනි දින ජනමාධ්‍ය නිවේදනයක් නිකුත් කරනු ලැබීය.

එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

ඇමරිකාව ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදය විසින් මෙහෙයවනු ලබන රූකඩ රාජ්‍යයක් වන ඊශ්‍රායලය විසින් පලස්තීනය වෙත එල්ල කරනු ලබන අමානුෂික ප්‍රහාර නැවතත් උත්සන්න වී තිබේ. ඊශ්‍රායලයේ ගෝලාන් කඳුකර ප්‍රදේශයේ ඇවිදිමින් සිටි තරුණයින් තිදෙනෙකු පැහැරගෙන ගොස් මරා දැමීමේ සිදුවීම කෙරෙහි පලස්තීනයේ හමාස් සංවිධානය වගකිව යුතු බවට ව්‍යාජ චෝදනා කරමින් ඊශ්‍රායල රජය විසින් මෙසේ නැවතත් පලස්තීනුවන් දඩයම් කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව ඊශ්‍රායල හමුදාව විසින් මේ වන විට එල්ල කරමින් පවතින ගුවන් හා මිසයිල ප්‍රහාරවලින් දැනටමත් පලස්තීනයේ ගාසා තීරයේ වෙසෙන පලස්තීනුවන් සිය ගණනක් ජීවිතක්ෂයට පත්ව ඇත. ජූනි 12 වන දා සිට සති කීපයක කාලයක් තිස්සේ අතුරුදන් වූ තරුණයන් සොයා කරන ලද මෙහෙයුම්වල දී 700කට අධික පලස්තීනුවන් පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති අතර ඉන් 400 දෙනෙකු තවමත් ඊශ්‍රායල අත්අඩංගුවේ පසු වේ.

ඊශ්‍රායල තරුණයින් පැහැරගෙන ගොස් මරා දැමීමේ සිදුවීමට පලස්තීනය වෙත චෝදනා එල්ල කරමින් ඔවුන්ට ප්‍රහාර එල්ල කළද එම සිදුවීම පිටුපස ඇති සැබෑ කුමන්ත්‍රණය මේ වන විට හෙළිදරව් වෙමින් පවතී. ඒ තරුණයන් පැහැර ගැනීමේ සිදුවීමත් සමඟම ඊශ්‍රායල රජය විසින් එරට මාධ්‍ය වෙත පනවන ලද ප්‍රවෘත්ති වාරණය ඉවත් කිරීමත් සමඟිනි. ඇතැම් ඊශ්‍රායල මාධ්‍ය ආයතන සිය රජය වෙනුවෙන් පෙනී සිටිමින් පලස්තීනයට එරෙහි පුවත් පළ කළද එරට බොහෝ ප්‍රගතිශීලී මාධ්‍ය මේ වන විට එම අතිශය බිහිසුණු සිදුවීම පසුපස ඇති සැබෑ කුමන්ත්‍රණය ලොවට හෙළිදරව් කරමින් සිටී. ඒ අනුව මෙම තරුණයන් පැහැරගෙන ගොස් ඝාතනය කිරීම හමාස් සංවිධානයට ප්‍රහාර එල්ල කිරීම සඳහාත් පලස්තීන එක්සත් ආණ්ඩුව බිඳහෙළීම සඳහාත් ඊශ්‍රායල ආණ්ඩුව විසින්ම එහි කුප්‍රකට ශින් බෙට් (Israel Security Agency - ISA ) නම් ඔත්තු සේවාව හා එක්ව සැලසුම් කරන ලද්දක් බව තහවුරු වෙමින් තිබේ. එහෙයින් මේ සිදු වී ඇත්තේ මෑත කාලයේ ෆාටා සහ හමාස් සංවිධාන එක්ව බිහි කළ එක්සත් පලස්තීන රජය බිඳදැමීමටත්, ඊශ්‍රායල විරෝධී පලස්තීන ජනතා විරෝධතා සහ නැගිටීම් යටපත් කිරීමටත්, හමාස් සංවිධානය දඩයම් කිරීම නීත්‍යානුකූල කරගැනීමටත්, නැගෙනහිර ජෙරුසලම පලස්තීනුවන් හට නැවත පවරා දීම ඊශ්‍රායල පාර්ලිමේන්තුව විසින් වළක්වනු ලැබීමටත්, පලස්තීන ප්‍රදේශවලට ගුවන් ප්‍රහාර එල්ල කිරීම ලෝකයා ඉදිරියේ සාධාරණීකරණය කරගැනීම සඳහාත් යනාදී වශයෙන් වන ඊශ්‍රායලීය රජයේ දේශපාලන උවමනාවන් වෙනුවෙන් තමන්ගේම තරුණයන් බිල්ලට දීමත්ය.

එබැවින් ශ්‍රී ලංකාවේ සමාජවාදී තරුණ සංගමය වන අපි මෙසේ ඊශ්‍රායලය විසින් පලස්තීනයට එරෙහිව සිදුකරන අමානුෂික කුමන්ත්‍රණ මෙන්ම ප්‍රහාරයන්ද දැඩි ලෙස හෙළා දකින්නෙමු. එසේම තම දේශපාලන අවශ්‍යතාවයන් වෙනුවෙන් තමාගේම ජනතාව බිල්ලට දෙන ඊශ්‍රායල රජයටත්, මෙම ගැටුමට මැදිහත්කරුවෙකු ලෙස සම්බන්ධ වී පලස්තීනයේ අභ්‍යන්තර දේශපාලනයට අත පෙවීමට උත්සාහ කරන ඇමරිකා එක්සත් ජනපද රජයටත් අපගේ විරෝධය පළ කර සිටින්නෙමු.

පලස්තීනයට එරෙහි ඊශ්‍රායලය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන්ගේ කුමන්ත්‍රණ හෙළා දකිමු!

පලස්තීනයට ජීවත් වීමට ඉඩ දෙනු !

# කොරියානු විශ්‍රාම වැටුප් අරමුදල කොල්ලකෑමේ උත්සාහයක් තිබේද?

## පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා පාර්මේන්තුවේදී ප්‍රශ්න කරයි



පසුගිය 22වැනි දින ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා පාර්ලිමේන්තුවේදී ආණ්ඩුවෙන් මෙසේ ප්‍රශ්නකර සිටියේය.

"කොරියාවේ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් සකස් කිරීමට අවධානය යොමුව ඇතැයි ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපතිනී නීතිඥ සුමනා ආරියදාස මහත්මිය විසින් සිදුකළ ප්‍රකාශයක් නිසා කොරියාවේ සේවය කරන ශ්‍රී ලාංකිකයින් අතර මතුවී තිබෙන මහත් නොසන්සුන්තාවය හා සැකය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනවා.

2014 ජූලි 14 වෙනි දින සිරස රූපවාහිනිය මගින් විකාශය වූ මධ්‍යහ්න 12.00 ප්‍රවෘත්ති විකාශය තුළින් කොරියාවේ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් සකස් කිරීමට අවධානය යොමුව ඇති බවට ප්‍රවෘත්තියක් විකාශය කරන ලැබුවා.

එම ප්‍රවෘත්තියේදී අදහස් දැක්වූ සුමනා ආරියදාස මහත්මිය මෙසේ කියා සිටියා. "පනස්දාහසක් පමණ අපේ ශ්‍රී ලාංකිකයන් කොරියාවේ සේවය කරනවා. කොරියාවේ රජයේ සමාජ ආරක්ෂණය සඳහා යම් මුදලක් ඒ අයට වැටුප්වලින් කර්මාන්ත ශාලා හිමියන් විසින් ඉතිරි කරගෙන තමයි වැටුප් ගෙවන්නේ.

15වැනි පිටුවට

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# “ඉඟුරු වෙනුවට මිරිස්” ගන්නා රාජපක්ෂ දේශපාලනය

“ඉඟුරු දී මිරිස් ගත්තා වගේ” යැයි අපේ ජනවහරේ කියමනක් තිබේ. එය වැඩිපුරම යෙදුණේ අතීතයේ සිටි රජවරු පෘතුගීසි ආක්‍රමණිකයා පැන්නීමට ලංදේසි ආක්‍රමණිකයාට උදව් දී ඔහු ගෙන්වා ගැනීම සම්බන්ධයෙනි. වත්මන් රාජපක්ෂ පාලනයද එම වර්ගයේම ගොන්කමක් කර තිබේ. එය ඉඟුරු දී මිරිස් ගැනීමක් නොව ඉඟුරු එපා කියා මිරිස් ගැනීමකි.

පසුගිය ජූලි 15දා ජනාධිපතිවරයා විසින් ලංකාවේ යුද අපරාධ හා මානව හිමිකම් කඩවීම් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ කමිටුවක් නම් කළේය. එය ලාංකිකයින්ගෙන් සමන්විත අභ්‍යන්තර කමිටුවක් නොව ජාත්‍යන්තර නියෝජිතයින්ගෙන් තිදෙනෙක් ඇතුළත් කමිටුවකි. එම තිදෙනා නම් බ්‍රිතාන්‍ය ජාතිකයින් වන ඩෙස්මන්ඩ් සිල්වා, ජෙෆ්රි නයිස් හා ඇමෙරිකානු පුරවැසියෙකු වන ඩේවිඩ් ක්‍රේන්ය. ලංකාවේ යුද අපරාධ හා මානව හිමිකම් කඩවීම් පිළිබඳ පරීක්ෂා කිරීමට ජනාධිපතිවරයාම කමිටුවක් පත් කිරීම බැලූ බැල්මට හොඳ පියවරක් ලෙස කෙනෙකුට පෙනී යා හැකි වුවද මෙය එක් අතකින් මුග්ධකමකි. අනෙක් අතින් නිවටකම හා තක්කඩිකම පෙන්වන උදාහරණයකි.

ලංකාවේ යුද අපරාධ හා මානව හිමිකම් කඩකිරීම් පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම විසින් ජාත්‍යන්තර පරීක්ෂණ කමිටුවක් නම් කළ විට ආණ්ඩුවත් එහි සිටින ඊනියා දේශප්‍රේමී නළුවෝත් මරහඬ තැලුවේ ජාත්‍යන්තර පරීක්ෂණවලට ඉඩ නොදෙන බව පවසමිනි. විදේශිකයන්ට අපේ රටේ ප්‍රශ්නවලට ඇඟිලි ගැසීමට කිසිවිටෙක ඉඩ නොදෙන බව පවසමිනි. ඔවුන්ට ලංකාවට ඇතුල්වීමට වීසා නොදෙන බවද පැවසුවේ මහා ආඩම්බරයෙනි.

එපමණක් නොවේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම පත්කළ ජාත්‍යන්තර පරීක්ෂණ කමිටුවේ නියෝජිතයන්ට ලංකාවට පැමිණීමට ඉඩ නොදිය යුතුය යන යෝජනාවද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මතකර ගත්තේ, එම යෝජනාවට සහාය නොදුන් අය දේශද්‍රෝහීන් ලෙස හඳුන්වමිනි.

ලංකාවේ ජාතික ප්‍රශ්නය ආරම්භ වූ දා සිටම එය අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්නයක් වන බැවින් ඊට විදේශ මැදිහත්වීම් සිදුකිරීමට විරුද්ධ වූ ජ.වි.පෙ. ආණ්ඩුව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ඉහත යෝජනාවට පක්ෂව ඡන්දය දීමට නම් ඊට සංශෝධනයක් එක් කළ යුතු බව පවසා සංශෝධනයක් එක් කළේය. එම සංශෝධනය වූයේ, ජාත්‍යන්තර පරීක්ෂණ කණ්ඩායමට ලංකාවට පැමිණීමට ඉඩදිය යුතු නැත, යන්න සමග පසුගිය කාලයේ ලංකාවේ මානව හිමිකම් කඩවීම් පිළිබඳ ලංකාව තුළ අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කළ යුතු බවත් ඒ සඳහා අභ්‍යන්තර පරීක්ෂණ කණ්ඩායමක් නම් කළ යුතු බවත්ය. එහෙත් ඊනියා දේශප්‍රේමයෙන් මත්ව සිටි ආණ්ඩුව එම ඉතාම වැදගත් හා නිවැරදි සංශෝධනය පිළිනොගෙන ප්‍රතික්ෂේප කළේය. එලෙස ලංකාවේ සිදුවූ මානව හිමිකම් කඩවීම් පිළිබඳ පරීක්ෂා කිරීමට ලාංකිකයින්ගෙන් සමන්විත අභ්‍යන්තර පරීක්ෂණ කමිටුවක් පත් කිරීම ප්‍රතික්ෂේප කළ රාජපක්ෂ ආණ්ඩුව ඉන් සති කීපයකට පසු ජාත්‍යන්තර නියෝජිතයන්ගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් නම් කළේය. එය ගොන්කමක් නොවේ නම් වෙන කුමක්දැ යි කල්පනා කළ යුතුය. ඊට ටික දිනකට පෙර දකුණු අප්‍රිකානු ආණ්ඩුවේ විශේෂ නියෝජිතයා ලෙස එරට උප ජනාධිපති සිරිල් රම්පෝසාද ලංකාවට පැමිණ ගිය අතර, ආණ්ඩුවේ සමහර ‘දේශප්‍රේමී’ ඇමැතිවරු පැවසුවේ, රම්පෝසා ‘ටුවරිස්ට්’ කෙනෙක් පමණක් බවය. එහෙත් රම්පෝසාගේ පැමිණීම හා ජනාධිපති විදේශිකයන්ගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් පත් කිරීම අතර සැඟවිය නොහැකි සම්බන්ධයක් තිබෙන බව දැන් පැහැදිලිය.

ජනාධිපතිවරයා මීට පෙර උගත් පාඩම් හා ප්‍රතිසංවිධානය පිළිබඳ කමිටුවක් පත්කොට ඉන් වාර්තාවක් එළි දැක්විය. අවසානයේ විදේශ බලවේග එම වාර්තාවේ නිර්දේශ තම අරමුණු වෙනුවෙන් යොදා ගැනීම ඇරඹීය. එම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්නැයි ආණ්ඩුවට දිගින් දිගට තවමත් බලකරන්නේ ජාත්‍යන්තර බලවේග යන්ය. ඒ, ආණ්ඩුව තමන් විසින්ම කපාගත් වළක තමනුත් වැටී රටත් ඇද දැමූ සැටිය. ‘වළක වැටීම මොළේට ලාභයකි’යි වරක් මාවෝසේතුං පවසා තිබුණි. එහෙත් වළක වැටීම ලාභයක් කර ගැනීමට මේ ආණ්ඩුවට හෝ රාජපක්ෂලාට මොළයක් ඇත්තේ නැත. ඒ අනුව රාජපක්ෂ පාලනය දැන් කර තිබෙන්නේ රෑ වැටුන වළට මහදවාලේ රට ඇද දැමීමය.

ලංකාවේ ජාතික ප්‍රශ්නය හා මානව හිමිකම් ප්‍රශ්න අරභයා සිදුවන ජාත්‍යන්තර මැදිහත් වීම හමුවේ මේ ආණ්ඩුව කටයුතු කරන මෙම දෙබිඩි, මුග්ධ හා දීන පිළිවෙත රටට ගෙන එන්නේ, බරපතළ අනතුරකි. එබැවින් වත්මන් ආණ්ඩුව ජනතාව රැවටීම සඳහා, බලය සඳහා, සැබෑ ප්‍රශ්න යට ගැසීම සඳහා විටින් විට පෙන්වන දේශප්‍රේමය, බටහිර විරෝධය අලි බොරුවක් බවත්, බොරු රඟපෑමක් බවත් අපේ රටේ ජනතාව තේරුම්ගත යුතුය. බොරුවට දෙශප්‍රේමී වීරයන් සේ කෑ ගසා ඇත්තටම අධිරාජ්‍යවාදීන් ළඟ දණින් වැටී, ඔවුනට අවශ්‍ය ලෙස කටයුතු කරන රාජපක්ෂලාගේ මෙම තක්කඩි පාලනය අවසන් කිරීම සඳහා සැබෑ දේශප්‍රේමීන් ප්‍රගතිශීලීන් හා මානවවාදීන් වහාම අත්වැල් බැඳගත යුතුය.


# ජනතාව ජ.වි.පෙ. ඉහළ තලයකට ඔසවාවි

***නියමුවා:*** ***සමස්තයක් ලෙස ගතහොත් විසි වසරක ශ්‍රීලනිප ජනාධිපති ධූරයක් යටතේ ඌවේ ජනතාවගේ ජීවිතවල ශේෂ පත්‍රය කවරාකාරද?***

***ජයවර්ධන සහෝදරයා:*** පොදුජන එක්සත් පෙරමුණ 1994දී බලයට එන්නේ අවුරුදු 17ක එ.ජා.ප. පාලනය අවසන් කරලමිනුයි. එතකොට රටේ ජනතාව තමන් එතෙක් විඳපු පීඩාවට ගැලවුම්කාරයෙක් විදියට පොදු පෙරමුණ තෝරා ගත්තා. අද වන විට පොදු පෙරමුණු ආණ්ඩුව වසර 20කට ආසන්න කාලයක් රට පාලනය කර තිබෙනවා. එහෙත් 1994දී මිනිසුන්ගේ ජීවත්වීමේ හැකියාව පවා මේ මොහොත වන විට බරපතළ අර්බුදයකට පත් වෙලා. එදා තමන්ගේ දරුවාට උගන්නගන්න, කන්න දෙන්න තිබුණු හැකියාව, ගෙයක් දොරක් හදාගන්න, ඉඩමක් වවා ගන්න තිබුණු හැකියාව පවා අද ඉතාම දුර්වල අඩියට වැටී තිබෙනවා. එජාපය අවුරුදු 17කට රටේ ආර්ථිකයට කරන ලද විනාශයටත් වඩා වැඩි විනාශයක් ඊටත් වැඩි වේගයකින් පසුගිය අවුරුදු 20 තුළ සිදුවී ඇති බව පෙනී යනවා. මේ මොහොතේ කැපී පෙනෙන යථාර්ථය එයයි.

ආණ්ඩුව මොන තරම් සංවර්ධනයේ පුරාජේරු කතා කීවත් ශ්‍රී ලංකාවේ දුප්පත්ම පළාත් සභාව ඌව පළාත් සභාවයි. ඌව පළාත් සභාවේ තමයි ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරම තිබෙන්නේ. සියඹලාන්ඩුව, කන්දකැටිය, මඩුල්ල, රිදීමාලියද්ද සියල්ල තිබෙන්නේ ඌව පළාත් සභාව තුළයි. ආණ්ඩුවේම සංඛ්‍යා ලේඛනවලට අනුව එය තහවුරු කරනවා. ‘උතුරු වසන්තය’, ‘නැගෙනහිර නවෝදය’ වගේම ආණ්ඩුව ඌවට පාවිච්චි කළේ ‘පුබුදමු වෙල්ලස්ස’ කියන සුන්දර වචනයි. ශෂේන්ද්‍ර රාජපක්ෂ මහ ඇමති වුණාට පස්සේ කිව්වේ ඌව පළාත් ජනතාවට බොන්න වතුර ටික, අධ්‍යාපනය සියලු දේ ලබා දෙනවා කියලයි. එසේ තිබියදී 2013 වාර්ෂික වාර්තාවේ 374 පිටුවේ පැහැදිලිව සඳහන් වෙනවා දරිද්‍රතාවය වැඩිම පළාත ඌව පළාත් සභාව කියලා. වසර ගණනාවක් යුද්ධය පැවතුණු උතුරු නැගෙනහිර පළාත්වලටත් වඩා ඌව පළාතේ දරිද්‍රතාවය වැඩිවෙලා. එහෙනම් ඌව පළාතට ගෙනාපු සංවර්ධනය කෝ? ඒ කතා ආණ්ඩුවේ මිත්‍යාවන් පමණයි. රජරට නවෝදය, කඳුරට නවෝදය, පුබුදමු වෙල්ලස්ස, සබරගමු අරුණාලෝකය, වයඹ පුබුදුව, රුහුණු උදානය, බටහිර රන් අරුණ, වගේ ලස්සන වචන

15වැනි පිටුවට



ජ.වි.පෙ. මොනරාගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක
**ආර්.එම්. ජයවර්ධන සහෝදරයා**

# මේ මැතිවරණය වතුකරයට තීරණාත්මකයි

***නියමුවා:*** ***ඌව පළාත තුළ සැලකිය යුතු වතු කම්කරු ජනතාවක් වාසය කරනවා. වසර සිය ගණනකට පසුත් ඔවුන්ගේ ජීවන තත්වයේ ලොකු වෙනසක් නැහැ. මේ පිළිබඳ ඔබේ අදහස?***

***රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා:*** වතු කම්කරු ජනතාව කියන්නේ අවුරුදු 180කට වැඩි කාලයක් පරම්පරා 04ක් පුරා මේ රටේ තේ ගස්වලට පොහොර වූ ජනතාවක්. සමාජීය, ආර්ථික වශයෙන් ඔවුන්ගේ ජීවිත අන්ත අසරණභාවයට ඇද දමනු ලැබ තිබෙනවා.

උදාහරණයක් ගතහොත් වතුකරයේ පාසල් දරුවන්ගේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵලවලින් ඔවුන්ගේ තත්වය මැනගත හැකියි. පාසල් දරුවන්ගෙන් 25%ක් දෙමළ භාෂාව අසමත්. සියයට 75ක් ඉංග්‍රීසි විෂය අසමත්. ගණිතය අසමත් වූ ප්‍රතිශතය 62%ක් වෙනවා. මේ අනුව වතුකරයේ අනාගතය කොතැනකදැයි හොඳින්ම තේරුම් යනවා. තවදුරටත් මේ අඳුරු අගාධයේම ගිලෙනවාදැයි වතුකරයේ ජනතාව තීරණාත්මකව සිතා බැලිය යුතු අවස්ථාවක් එළඹ තිබෙනවා.

***නියමුවා:*** ***මෙම ජනතාවගේ ඡන්දය කොල්ලකා ගනිමින් වරප්‍රසාද හඹා ගිය ධනපති දේශපාලකයින් පිළිබඳව අද එම ජනතාව කියන්නේ කුමක්ද?***

***රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා:*** මෙතෙක් කාලයක් වතුකරයේ ජනතාවට නායකත්වය ලබාදුන්නේ යැයි කියූ අය විසින් ඒ ජනතාවගේ ජීවිත අඟලකින්වත් ඔසවා තබා නැහැ. ඒ වෙනුවට ඔවුන් කළේ තමන්ගේ ඥාති රැළට වරප්‍රසාද වරදාන ලබාගැනීම වෙනුවෙන් වතුකර ජනතාවගේ ඡන්ද කුට්ටිය පාවිච්චි කිරීමයි. ධනපති ආණ්ඩුවල ඇමති සැප වෙනුවෙන් ඔවුන් වතු ජනතාවගේ ජීවිත උකසට තැබුවා.

තොණ්ඩමන් පරම්පරාවම ගතහොත් ඔවුන්ට වතු කම්කරු ජනතාවගේ දුක් පීඩාවන් පිළිබඳව කිසිම හැඟීමක් නැහැ. අහිංසක වතු ජනතාවගේ ඡන්ද පාවිච්චි කරමින් ඔවුන් ගොඩනැගුවේ පවුල් බලයයි. තවමත් ඔවුන් ගොඩනගමින් සිටින්නේ එයයි. ඔවුන්ට වතු කම්කරුවන් පිළිබඳව කිසිදු අවබෝධයක්, හැඟීමක් නැහැ. ඒත් නායකයින් ලෙස හඳුන්වා දෙනවා. එළඹෙන මැතිවරණයයේදී ඇමති ආරුමුගන් තොණ්ඩමන්ගේ පුතා සහ බෑණා ඉදිරිපත් වෙනවා.

15වැනි පිටුවට



බදුල්ල දිස්ත්‍රික් අපේක්ෂක, සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති
**රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා**

තරුණ




සමාජවාදී තරුණ සංගමය 2008 වසරේ සිට සෑම වසරකම ජූලි 23 වනදා සහෝදරත්වයේ දිනය ලෙස නම් කර ජාතික සමගිය ගොඩනැගීම උදෙසා විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලබයි. 2014 වසරේද සහෝදරත්වයේ දිනය නිමිති කොට ගෙන ජූලි 23 වනදා සිට සහෝදරත්වයේ සතියක් නම් කළ අතර එම කාලය පුරාවටම ජාතීන් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබීය. අනෙක් වසර වලට වඩා මෙවර සහෝදරත්වයේ දිනයේ විශේෂත්වය වූයේ විවිධ සිවිල් සංවිධාන රැසක්, කලාකරුවන් සහ බුද්ධිමතුන්ද ජාතික සමගිය වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය හා අත්වැල් බැඳ ගැනීමයි. මෙම සියලු සංවිධාන සහ පුද්ගලයින් හා එක්ව සහෝදරත්වයේ දිනය වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය විසින් කළ විවිධ වැඩසටහන් මෙසේ පෙළගස්වන්නෙමු.

සහෝදරත්වයේ සතිය ආරම්භ කරමින් ජූලි 23 සහ 24වන දිනයන්හි දිවයින පුරා ජාතික සමගිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම උදෙසා අත්පත්‍රිකා බෙදා දීම සහ "සිංහල, දෙමළ, මුස්ලිම් අපට එක්ව ඉන්නට ඉඩ දෙනු!" යන මැයෙන් ජාතිවාදයට එරෙහිව විරෝධතා බැනරයකට අත්සන් කිරීම සිදු කෙරුණි.

සහෝදරත්වයේ සතිය වෙනුවෙන් සංවිධානය කරන ලද සහෝදරත්වයේ සිත්තම චිත්‍ර කඳවුර ජූලි 26 වනදා දවස පුරා කොළඹ විහාරමහාදේවී උද්‍යානයේදී පැවැත්විණ. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන ආචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතා, විනී හෙට්ටිගොඩ මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චාල්ස් දයානන්ද මහතා, ප්‍රවීණ චිත්‍ර ශිල්පීන් වන අනුර ශ්‍රීනාත් මහතා සහ තලංගම ජයසිංහ මහතා ඇතුලූ ප්‍රවීණ, ආධුනික චිත්‍ර ශිල්පීන් රැසක්ද, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම කුඩා දරුවන්ද මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ. ජාතික සමගිය තේමා කර ගත් මෙම චිත්‍ර කඳවුරට චිත්‍ර ඇඳීමට මෙන්ම චිත්‍ර නැරඹීමටද විශාල පිරිසක් සහභාගී වී සිටිනු දක්නට ලැබුණි. එසේ සහභාගී වූවන් අතර විදේශිකයින් බොහොමයක්ද විය. චිත්‍ර ඇඳීමට සමගාමීව සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ සිසුන් විසින් ජාතික සමගිය තේමා කොට ගෙන සිදුකරනු ලැබූ නිරූපණයන්ගෙන්ද චිත්‍ර කඳවුර සමන්විත විය. ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනි ඉන්දිරා ලෝපේස් මහත්මියද මෙම අවස්ථාවට සහභාගී වී සිටියාය.














ජාතිවාදයට එරෙහිව ජාතික සමගිය වෙනුවෙන් සංවිධානයකරන ලද සහෝදරත්වයේ පා ගමන ජූලි 27 වන දින සවස කොළඹ මාළිගාවත්තේ සිට විහාරමහාදේවී එළිමහන් රංග පීඨය දක්වා විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති අතර එය අවසානයේදී විවිධ සංවිධාන සහ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් සහෝදරත්වයේ රැලියක් පැවැත්විණ. සිංහල, දෙමළ, මුස්ලිම් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම සහෝදරත්වයේ රැලියට ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය නියෝජනය කරමින් එහි සභාපති ආචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතාද, එකමුතුව සඳහා ජනරැලිය සංවිධානය නියෝජනය කරමින් එහි සම ප්‍රකාශක මොහොමඩ් හිෂාම් මහතා, ප්‍රවීණ සාහිත්‍යවේදීන් වන ආරියවංශ රණවීර මහතා සහ හිනිදුම සුනිල් සෙනෙවි මහතා, මාධ්‍ය නිදහස සඳහා ක්‍රියාකාරී කමිටුව වෙනුවෙන් සමන් වගආරච්චි මහතා, සමස්ත ලංකා හින්දු තරුණ සම්මේලනයේ ප්‍රධාන ලේකම් මනෝහරන් මහතා, ජාතික භික්ෂු පෙරමුණේ ජාතික විධායක සභික මහනෙළුබැවේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ, සාමූහික ප්‍රයත්නය සංවිධානය වෙනුවෙන් ලක්මාල් නිරෝෂන් මහතා, ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලයේ සභාපති එම්.එන්. අමීන් මහතා, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක කමිටු සාමාජික නීතිඥ ප්‍රියන්ත ගමගේ මහතා, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය වෙනුවෙන් වසන්ත සමරසිංහ මහතා, ජාතික ක්‍රිස්තියානි සහෝදරත්වයේ ලේකම් රොහාන් ඒකනායන පියතුමා, සමස්ත ලංකා මුස්ලිම් ලීග් තරුණ පෙරමුණු සම්මේලනයේ ජාතික භාණ්ඩාගාරික හිටපු නාගරික මන්ත්‍රී ශාම් නවාස් මහතා සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු නිත්‍ය නියෝජිත සහ කියුබාවේ හිටපු ශ්‍රී ලාංකික තානාපතිනි තමාරා කුගනායගම් මහත්මියද සහභාගී වී සිටියහ.

දිවයිනේ ජනප්‍රිය කලා කරුවන් ස්වේච්ඡාවෙන් දායකත්වය දැක්වූ සහෝදරත්වයේ සංගීත ප්‍රසංග යක්ද රැලිය අවසානයේදී විහාරමහාදේවී එළිමහන් රංග පීඨයේදී පැවැත්විණ. ජිප්සීස් සංගීත කණ්ඩායමේ නායක සුනිල් පෙරේරා, මේරියන්ස් සංගීත කණ්ඩායමේ නායක නලින් පෙරේරා, ඉශාක් බෙක්, දීපාල් සිල්වා සහ සිරස සුපර් ස්ටාර් සහ දෙරණ ඩ්‍රීම් ස්ටාර් සුපිරි තරු වන එම්.ජී. ධනුෂ්ක, උදේෂ් ඉන්දුල, චාමර ප්‍රසාද්, රුක්මන් අසිත යන කලාකරුවන් මෙන්ම සමාජවාදී තරුණ සංගමයේ චේන්ජ් සංගීත කණ්ඩායමේ ගායක ගායිකාවන්ද මෙහිදී ගී ගැයූහ. රැලියේ නිවේදන කටයුතු සඳහා නාරද බක්මීවැව එක්ව සිටියේය. සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වයේ එකමුතුව වෙනුවෙන් ගී ගැයීමට සහභාගී වූ මෙම කලාකරුවන් සියලු දෙනාම පැවසුයේ ජාතික සමගිය ගොඩනැගීම උදෙසා තම වගකීම ඉටු කිරීම පිණිස මෙසේ සමාජවාදී තරුණ සංගමය හා අත්වැල් බැඳගත් බවයි.




















# පහසු නිවැරදි මඟද?



මේ වන විට ලාංකේය දේශපාලනය උණුසුම් වීමට පටන්ගෙන තිබේ. එක් අතකින් රටේ නිර්මාණය වී ඇති දැවැන්ත සමාජ ආර්ථික දේශපාලන අර්බුදයෙන් පීඩා විඳින ජනතාව, ඒ පීඩාවට එරෙහිව ප්‍රතිචාර දැක්වීමට පටන් ගැනීමත්, පවතින තත්වයේ වෙනසක අවශ්‍යතාවය සෑම අතින්ම මතුවීමත්, ඒ අස්සේ රාජපක්ෂ පාලනය ඉක්මන් ජනාධිපතිවරණයකට සූදානම් වීමත් විසින් මෙම දේශපාලන උණුසුමට පසුබිම සකසා තිබේ. වසර 66ක දේශීය ධනපති පංතියේ පාලනය තුළ තට්ටුමාරු ක්‍රමයට, ආණ්ඩු බලයට පත්කොට අවසානයේ දුප්පත්කම හා පීඩාව හැර අන් කිසිවක් නොලද ජනතාව මේ වන විට දේශපාලනයේ වෙනසක් සඳහා පෙළ ගැසීමට පටන්ගෙන තිබේ. වෙනසක් අවශ්‍ය බව ප්‍රකාශකරමින් තිබේ. මෙම තත්වය රටේ සැබෑ දේශපාලන වෙනසකට යා නොදී ධනපති ක්‍රමය තුළම වල්මත් කිරීම සඳහා වූ දේශපාලනයක්ද දැන් මතුව තිබේ. ජනතාව යා යුතු නිවැරදි මග සොයා ගැනීම මේ මොහොතේ ඉතාම වැදගත් වන්නේ ඒ නිසාය.



"ජනතාව මෙම පාඩම ඉක්මනින් ග්‍රහණය කරතිද, නැතහොත්, ඔවුහු කෙතරම් ඉක්මනින් එය ක්‍රියාත්මක කරතිද යන්න අපි නොදනිමු. නමුත් මෙම පාඩමට අමතරව, නොවිසඳිය හැකි අවුලෙන් මිදීමේ වෙනත් මඟක් නොමැති බවත්, ප්‍රතිවිප්ලවවාදීන් දැක්විය හැකි චපලකම් හෝ ම්ලේච්ඡකම්වලින් හෝ කිසිම සෙතක් නොවන බවත්, අපි මැනවින් දන්නෙමු.

පොදු ජනතාව තමන්ගේ නායකයාවන නිර්ධන පංතිය කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම හැර වෙනත් ගැලවීමේ මඟක් නොමැත."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**05 වෙළුම**
**158 - පිටුව**

වර්තමාන ධනවාදී ක්‍රමයත්, වත්මන් රාජපක්ෂ පාලනයත් නිර්මාණය කර ඇති අර්බුදයේ පීඩනය විවිධ ජන කොටස්වලට විවිධ ආකාරයෙන් දැනෙන්නට පටන්ගෙන තිබේ. සමහරුන්ට මෙය දැනෙන්නේ බඩු මිල ඉහළයාම, ආදායම් නොමැතිවීම මගින් ආර්ථික අමාරුකමක් ලෙසය. රජයේ හා පෞද්ගලික අංශයේ සේවකයාට, ගොවියාට, වතු කම්කරුවාට මෙය දැරිය නොහැකි ආර්ථික දුෂ්කරතාවයකි. ඊට ඉක්මන් විසඳුමක් අවශ්‍යය. තවත් අයට මෙය සමාජයේ අපරාධ, මත්ද්‍රව්‍ය වැඩිවීම මගින් දැනෙන සංස්කෘතික පිරිහීමකි. තවත් අයට ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවීම, නීතිය හා යහපාලනය බිඳ වැටීමේ අර්බුදයකි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා 17 වන සංශෝධනය යළි බලාත්මක කිරීම පෙරටු සටන්පාඨ වන්නේ ඒ අයටය. තවත් අයට මෙය ආණ්ඩුව තුළ තමන් නොසැලකිල්ලකට ලක්වීම නිසා ඇති වූ හිත් වේදනාවකි. මෙම සියලු තත්වයන් විසින් මේ වන විට විශාල ආණ්ඩු විරෝධයක් සඳහා විෂය මූල පදනම, සකස්කරනු ලැබ ඇත. එකී ආණ්ඩු විරෝධය පසුගිය බස්නාහිර හා දකුණු පළාත් සභා තුළින් ප්‍රකාශ වූ අතර ඌව පළාත තුළද එය පෙනෙන්නට තිබේ. එසේම සටන් බිම තුළද ආණ්ඩු විරෝධය මතුවී ඇත. ඒ නිසාම සමහර ජනතා විරෝධී ක්‍රියා ආපසු අකුළා ගැනීමට ආණ්ඩුවට සිදුවූ අවස්ථාද තිබේ. දේශපාලනය තුළ මතුව ඇති මෙම විශේෂ තත්වය තුළ, මෙම කැලඹිලිකාරී තත්වය තුළ විවිධ පන්ති වුවමනා නියෝජනය කරන විවිධ දේශපාලන හා සමාජ ක්‍රියාකාරී කණ්ඩායම් තම තමන්ගේ පංති වුවමනාවල සිට ක්‍රියාත්මක වන්නටද පටන්ගෙන තිබේ. ඒ අනුව මෙම සමාජ අර්බුදයෙන් මිදීමට ජනතාවට මඟපෙන්වීමට උත්සාහ දරන විවිධ 'මග පෙන්වන්නන්' බිහිවෙමින් තිබේ. ඉතිහාසයක් පුරා මෙවැනි ව්‍යාජ මඟ පෙන්වන්නන්ට රැවටුණු අපේ ජනතාව නිවැරදි මඟ තෝරාගත යුත්තේ මේ නිසාය.

ධනවාදී ක්‍රමයත්, වත්මන් ආණ්ඩුවත් අර්බුදයට ගොස් ජනතාවට වෙනසක් අවශ්‍යව සිටින, ජනතාව වෙනසක් ඉල්ලන මේ මොහොතේ සියලු ධනපති පංති කණ්ඩායම් හා ඔවුන්ගේ මිතුරන් වූ සකලවිධ ප්‍රතිගාමීහු කලබලයට පත්ව සිටිති. ඒ අන් කිසිවක් නිසා නොව ධනවාදය අර්බුදයට යමින් තිබියදී, සියලු ධනපති දේශපාලන කණ්ඩායම් දේශපාලනිකව බංකොලොත් වෙමින් තිබියෙදී ලංකාවේ වමේ ව්‍යාපාරය ලෙස ජ.වි.පෙ. ශක්තිමත්ව, ජනතා ප්‍රසාදය මැද ඉදිරියට යමින් තිබීමය. වත්මන් අර්බුදකාරී තත්වය තුළ වෙනසක් සොයන ජනතාව තම ක්‍රියාකාරිත්වය ධනවාදයේ වෙනසක් සඳහා, පංතිමය වෙනසක් සඳහා යොදවනු ඇතැයිද, එම ජනතාවට ජ.වි.පෙ. මඟපෙන්වනු ඇතැයිද දැක බියවන, විවිධ ආකාරයෙන් වෙස්වළාගත් ප්‍රතිගාමී කණ්ඩායම් ජනතාව මෙම ධනවාදී ක්‍රමය තුළම වල්මත් කිරීමට විවිධ සටන්පාඨ හා පෙරමුණු ගොඩනගමින් එකිනෙකා හා තරගයට ඉදිරිපත් වෙමින් සිටිති. ඒ සඳහා ඔවුහු ඉතාම පහසු මාවත්ද යෝජනා කරති. ඉන් ප්‍රධානම යෝජනාව වන්නේ, ආණ්ඩු විරෝධී සියලු බලවේග එක්වී රාජපක්ෂ පාලනය

> ඔවුන් මේ මොහොතේ දක්වන කඩිසරකම දෙස බලන විට, කලබලය දෙස බලන විට ඔවුන්ගේ ඇත්ත බිය කුමක්ද යන්න තේරුම් ගත හැක. ඔවුන් ඇත්තටම බියවී සිටින්නේ, රාජපක්ෂ පාලනයේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ගමනට නොව එම ගමන විසින් පීඩාවට පත්වන ජනයා ජ.වි.පෙ. සමග එක්ව සමාජ වෙනසකට මුලපිරීමට ඇති ඉඩ හා අවස්ථාව පිළිබඳවය

පැරදවිය යුතුය යන්නය. එහෙත් ඉන් අනතුරුව පිහිටුවන්නේ කුමන පාලනයක්ද යන ප්‍රශ්නය ඔවුහු සිතමතාම මගහැර යති. ඊටම සම්බන්ධ අනෙක් යෝජනාව වන්නේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කරගෙන සියලු බලවේග එක් පෙරමුණකට එකතුකර ආණ්ඩුව පැරදවීමය. මේවා බැලූ බැල්මට සිත් ඇදගන්නා සුළුය; පහසුය; ආකර්ෂණීයය. එහෙත් නිවැරදි නැත. ජනතාවට ඉන් කිසිදු යහපතක් වන්නේ නැත.

වසර 66ක් වරින්වර රැවටීමට ලක්ව ධනවාදී පාලනය තුළ අතරමං කරනු ලැබූ ජනතාව දැන් සියලු අතීත අත්දැකීම් උපයෝගී කරගෙන කල්පනා කළ යුතුය. ජනතාව දැන් තෝරා ගත යුත්තේ පහසු මඟ නොවේ; නිවැරදි මඟය. බලයේ සිටින ධනපති කණ්ඩායමට එරෙහිව එළියේ සිටින ධනපති කණ්ඩායම කේන්ද්‍ර කරගනිමින් අටවන කවර වර්ගයේ හෝ සංවිධානයක්, දේශපාලන ව්‍යාපාරයක්, පෙරමුණක් ඒවාට යොදන නම කෙතරම් අලංකාර වුවත් අවසානයේ ජනතාව මෙම ධනපති ක්‍රමය තුළම යළි අතරමං කරනු ඇත. රාජපක්ෂලා වෙනුවට වික්‍රමසිංහලාට බලය හදන, ධනවාදය වෙනස් නොකරන කිසිදු දේශපාලන ක්‍රියාමාර්ගයක් ජනතාවට හිතකර වන්නේ නැත.

දැන් මහින්ද රාජපක්ෂ පාලනය පැරදවීමට රට තුළ නිර්මාණය වන හා එළිදක්වන විවිධ 'ව්‍යාපාර', 'පෙරමුණු' හා 'එකතු' තිබෙන්නාසේම 1994දී එ.ජා.ප.යේ 17ක අවුරුදු පාලනය පැරදවීමටද මෙවැනි විවිධ පෙරමුණු හා ව්‍යාපාර බිහිවිය. මව් පෙරමුණු, සූරියකන්ද, ප්‍රජාතන්ත්‍රවාදය, විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දීම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ආදී චිත්තාකර්ෂණීය, සටන්පාඨ පොරොන්දු හා සංවාදවලින් එකලද දේශපාලනය පිරුණි. එම සංවාදවල මූලිකත්වය ගත්තේ වික්ටර් අයිවන්ලා ය. මංගල සමරවීරලාය. අවසානයේ එ.ජා. ප. ආණ්ඩුව බිඳ වැටුණි. එහෙත් ජනතාවට ලැබුණු දෙයක් නැත. ඒ වෙනුවට සිදුවුණේ, ජනතාව එ.ජා.ප. කබලෙන් පොදු පෙරමුණු ලිපට වැටීමය. දැන් එම වික්ටර් අයිවන්ලා ඇතුළු පිරිසම, මංගලලාම එවැනිම සංවිධාන අටවා ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් රාජපක්ෂ පාලනය පෙරළා දැමීමට ජනතාවට ආරාධනා කරති. හාස්‍යයට කරුණ වන්නේ එයයි. මෙම යුගයේ ධනපති පාලනයන්ට ප්‍රජාතන්ත්‍රවාදී විය නොහැකිය යන පරම සත්‍යය ඔවුහු සඟවති.

දැන් විවිධ පෙරමුණු තුළ විවිධ වෙස්බැඳ විවිධ අදහස් පළකරමින් රාජපක්ෂ පාලනය ලෙහෙසියෙන් පෙරළා දැමීමට, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එය පෙරළීමට කථා කරන හැම දෙනාම ඒ අතරම ධනවාදය පෙරළා දැමීම වැළැක්වීමටද එය රැකගැනීමටද කැපවී සිටිති; දැනුවත්වම ඒ වෙනුවෙන් කටයුතු කරති. ඔවුන් මේ මොහොතේ දක්වන කඩිසරකම දෙස බලන විට, කලබලය දෙස බලන විට ඔවුන්ගේ ඇත්ත බිය කුමක්ද යන්න තේරුම් ගත හැක. ඔවුන් ඇත්තටම බියවී සිටින්නේ, රාජපක්ෂ පාලනයේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ගමනට නොව එම ගමන විසින් පීඩාවට පත්වන ජනයා ජ.වි.පෙ. සමග එක්ව සමාජ වෙනසකට මුලපිරීමට ඇති ඉඩ හා අවස්ථාව පිළිබඳවය.

මේ නිසා ඔවුන් එකවර උපක්‍රම කිහිපයක් අනුගමනය කරනු පෙනේ. ඉන් පළමුවැන්න නම් ධනපති ක්‍රමය රකිමින් රාජපක්ෂ පාලනය පමණක් වෙනස් කරන දේශපාලන උපායමාර්ගයක් තුළ ජ.වි.පෙ.ද සිරකර ගැනීමය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදයේ සටන් පාඨ තුළ පමණක් පෙරමුණු හැදීමට ඔවුන් උත්සාහ කරන්නේ මේ නිසාය. එසේ නොමැති නම් ජ.වි.පෙ. හුදකලාකර පහසුවෙන් ආණ්ඩුව පෙරළීමේ 'ජනප්‍රිය' පෙරමුණක් හදා ගැනීමටය. ආණ්ඩුව පෙරළන 'පොදු සටනට' ජ.වි.පෙ. නොපැමිණීම ගැන ඊට දොස් කියමින් තම ප්‍රතිගාමී වුවමනාව සඟවා ගැනීමටය. ඒ මගින් ජනතාව නොමග යවා යළි ධනපති ක්‍රමය තුළම අතරමං කිරීම ඔවුන්ගේ අරමුණ වේ.

උත්සව කාලය ළං වන විට විවිධ අය විවිධ **15වැනි පිටුවට**

# "අපේ දැක්ම " රට පුරා




මැතිවරණයක් ආසන්නයේදී පමණක් බොහෝ දේශපාලන පක්ෂ රට සංවර්ධනය කරන ආකාරය පිළිබඳව විචිත්‍රවත් වැඩ සටහන් ජනතාව වෙත ඉදිරිපත් කරනු ලබයි. එහෙත් ඒවා මැතිවරණ අවසාන වනවාත් සමඟ කුණු කූඩයට විසිවී යන්නේ කිසිවෙකුටත් නොදැනෙන පරිදිය.

නමුත් ජනතා විමුක්ති පෙරමුණ එම සාම්ප්‍රාදායික දේශපාලන පක්ෂයන්ට වෙනස් වන ආකාරයෙන් 'අපේ දැක්ම'යන නමින් වැඩපිළිවෙළක් ඉදිරි පත් කරන ලදී. 'අපේ දැක්ම' පළමු වරට ජනතාව අතට පත් වන විට රට හමුවේ කිසිදු මැතිවරණ ක්‍රියාවලියක් නොතිබුණ අතර එය ඉදිරිපත් කර පසු ගිය ජූලි මාසයට මාස 05ක් පමණ වුවද ඒ පිළිබඳව සමාජයේ ඇති කතාබහෙහි කිසිදු අඩුවක් නොවිය.

මේ සියලු තත්වයන් සැලකිල්ලට ගත් ජ.වි.පෙ. නැවත වටයකින් "අපේ දැක්ම " වැඩපිළිවෙළෙහි අඩංගුව පිළිබදව ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවක් පසුගිය ජූලි මාසය තුළ සුදානම් කර තිබුණි. ගාල්ල, රත්නපුර, කෑගල්ල, මහනුවර, අම්පාර, පොළොන්නරුව සහ බදුල්ල සහ වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි මෙම සම්මන්ත්‍රණ පැවැත්විණි.

ජූලි මස 19 වෙනිනදා වවුනියාවේ අරුන්දතී හෝටලයෙහි පැවති සම්මන්ත්‍රණය සඳහා සිංහල, දෙමළ සහ මුස්ලිම් ජාතිකත්වයන් නියෝජනය කරමින් විශාල පිරිස් සහභාගි වී සිටීම කැපී පෙනෙන්නක් වූ අතර මෙම සියලු සම්මන්ත්‍රණ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

මෙම අවස්ථාව සඳහා වවුනියා දිස්ත්‍රික් ආසන බල මණ්ඩලයේ සභාපති උපාලි සමරසිංහ, කිළිනොච්චි දිස්ත්‍රික් ජ.වි.පෙ. සංවිධායක එස්. රාජේන්ද්‍රන්, සමාජවාදී තරුණ සංගමයේ දිස්ත්‍රික් සාමාජික ආසිරි නුවන් යන සහෝදරවරුන්ද, සමජවාදී කාන්තා සංගමයේ වවුනියා දිස්ත්‍රික් සාමාජිකා අම්බලම් ජේ. චිත්‍රා සහෝදරියද සහභාගි වූහ.

# ජාතිවාදය එපා! ආගම්වාදය එපා!



"ජාතිවාදය එපා, ආගම්වාදය එපා, සිංහල, දෙමළ, මුස්ලිම් අපට එක්ව ඉන්න ඉඩ දෙනු!" යන තේමා පාඨය ඔස්සේ මෙරට ආගමික නායකයින්, උගතුන්, බුද්ධිමතුන්, විද්වතුන්, කලාකරුවන් සහ රාජ්‍යතාන්ත්‍රිකයන් ජාතිවාදයට හා ආගම්වාදයට එරෙහිව එකම වේදිකාවකට ගෙන ඒමට ජ.වි.පෙ.ට අනුබද්ධ සමාජවාදී තරුණ සංගමයට හැකි විය.

සහෝදරත්වයේ දිනය (ජූලි 23) පදනම් කර ගනිමින් ජූලි 27 වෙනිදා සමාජවාදි තරුණ සංගමය ක්‍රියාත්මක කළ සහෝදරත්වයේ සිත්තම, සහෝදරත්වයේ පා ගමන හා සහෝදරත්වයේ රැලිය අති සාර්ථකව පැවැත්විණි.

සහෝදරත්වයේ සිත්තම පැවති අවස්ථාව සඳහා මෙරට කියුබානු තානාපතිනි ඉන්දිරා ලෝපේස් මහත්මිය සහභාගි වුනු අතර සහෝදරත්වයේ පාගමන සහ රැලිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරිනී, කියුබාවේ හිටපු ශ්‍රී ලංකා තානිපතිනි තමාරා කුනනායගම් මහත්මිය මෙන්ම විවිධ සංවිධාන නියෝජනය කරමින් සිංහල, දෙමළ සහ මුස්ලිම් පිරිස්ද සහභාගි වී සිටිනු දක්නට ලැබුණි.

එසේම සුනිල් පෙරේරා, නලින් පෙරෝ, ඉෂාක් බෙග්, එම්.ජී. දනුෂ්ක, දීපාල් සිල්වා, උදේෂ් ඉන්දුල, චාමර ප්‍රසාද් සහ රුක්මන් අසිත ඇතුළු දිවයිනේ ජනප්‍රිය කලාකරුවන් විසින් ජාතික සමගිය තේමා කර ගනිමින් සංගීත ප්‍රසංගයක්ද පැවැත්වීමද මෙහි විශේෂත්වය විය.

# පලස්තීනයට ජ.වි.පෙ. සහය




ඇමරිකානු ගැති ඊශ්‍රායලයේ සියොන්වාදි පාලනය විසින් පලස්තීන ජනතාව ම්ලේච්ඡ ලෙස ඝාතනය කරමින් එම ජනතාවගේ නිදහස් අරගලය විනාශ කිරීමට එරෙහිව පසුගිය ජූලි මාසයේ ලෝකය පුරා ඇති ප්‍රගතිශීලි ව්‍යාපාර විසින් විරෝධතා උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කර තිබුණි.

පසුගිය ජූලි මස 11වෙනිදා ඉතාලියේ නගර කිහිපයකද මෙම උද්ඝෝෂණ ව්‍යාපාර දක්නට ලැබුණු අතර රෝම නගරයේ පැවති උද්ඝෝෂණයට ජ.වි.පෙ. ඉතාලි කමිටුවද සහභාගි විය.

# නේපාල කොමියුනිස්ට් පක්ෂයට සුභ පැතුම්




සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු ලෝක කොමියුනිස්ට්වාදය බිඳ වැටුණයි උදම් ඇනූ අධිරාජ්‍යවාදීන්ට අභියෝගයක් වෙමින්ද ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරයට ශක්තිය හා ධෛර්යය එකතු කරමින් ඡන්දයෙන් බලයට පත් වූ ලෝකයේ පළමු පක්ෂය වන්නේ එක්සත් මාක්ස් ලෙනින්වාදී නේපාල් කොමියුනිස්ට් පක්ෂයයි.

එම පක්ෂයේ 09 වෙනි ජාතික මහ සමුළුව පසුගිය ජූලි මස 03 වෙනිදා සිට 09 වෙනිදා දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවරදී පැවැත්විණි.

එම සමුළුවේ ආරම්භක දිනය වූ ජූලි 03 වැනිදා ජනතා විමුක්ති පෙරමුණේ ජාත්‍යන්තර කටයුතු පිළිබද ලේකම් සෝමවංශ අමරසිංහ සහෝදරයා 09වැනි සමුළුව සදහා ජ.වි.පෙ. සුභ පැතුම් එක් කළ අතර දකුණු ආසියා කලාපයේ සහ රුසියාවේ, තුර්කියේ කොමියුනිස්ට් පක්ෂත්, කම්කරු පක්ෂත් මෙම අවස්ථාවට සහභාගි වී තිබේ.

# ධීවරයින් මහ පාරේ

රාජපක්ෂ ආණ්ඩුව දැන් ක්‍රියාත්මක කරමින් සිටිනුයේ ඔවුන්ගේ මහින්ද චින්තන වැඩ පිළිවෙල නොව පසුගිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් රටට ඉදිරිපත් කළ "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩපිළිවෙළයි. ඒ අනුව මෙරට ආර්ථිකයේ පදනම් වන්නේ සංචාරක ව්‍යාපාරය වේ. එය සමන්විත වන්නේ හුදෙක් මෙතෙක් පැවති ඓතිහාසික ස්ථාන, ස්වාභාවික සෞන්දර්ය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගෙන් නොව කැසිනෝ, ගණිකාවන් සහ මත්කුඩු ඉලක්ක කර ගත් සංචාරකයන් ගෙනි.

ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් එනම් මාර්ග පද්ධති, සී ප්ලේන් ව්‍යාපෘති, සාප්පු හා හෝටල් සංකීර්ණ සහ කැසිනෝ කලාප ඉදිකිරීමට අවශ්‍ය භූමි භාගයන් වෙන් කර ගැනීම් ආණ්ඩුව කඩිනමින් සිදුකරමින් සිටී. එනිසාම ආණ්ඩුවට සෞඛ්‍ය, අධ්‍යාපනය ආදී ක්ෂේත්‍ර එතරම් අදාල නැත. එසේම කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය මෙන්ම අනෙකුත් කර්මාන්තයන් අදාල නැත. එබැවින් මේ කර්මාන්තයන්හි නියුතු වූවන් විසින් ආණ්ඩුවට එරෙහිව මුදා හරිමින් සිටින්නේ ප්‍රබල විරෝධයකි.

මෑත කාලයේදී ධීවර ජනතාව විසින් තම අයිතිවාසිකම් ලබා ගැනීම වෙනුවෙන් කරන උද්ඝෝෂණ ප්‍රධාන වශයෙන් කරළියට පැමිණ ඇත. මේ බොහෝ උද්ඝෝෂණයන්ට ජ.වි.පෙ.ට අනුබද්ධ සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය තම දායකත්වය සපයමින් තිබේ.

පොරොන්දු වූ ඉන්ධන සහනාධාරය නැවත ලබා දෙන ලෙස ආණ්ඩුවට බලකරමින් පසුගිය ජූලි මස 07 වැනිදා සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ මෙහෙය වීමෙන් මාතර කුඩාවැල්ලේදී උද්ඝෝෂණ ව්‍යාපාරයක් පවත්වන ලදී. එම අවස්ථාව සඳහා සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ ජාතික සංවිධායක රත්න ගමගේ සහෝදරයාද සහභාගි විය.



# රු:50,000/= ඉක්මවන ජීවන වියදම් අර්බුදය

2014 අයවැයට අදාළව යෝජනා සකස් කිරීම මේ දිනවල සිදුවමින් පවතී. ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන් නොදන්නා අයවැය යෝජනා සකස් කර ගැනීමට කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයින්, අරලියගහ මැදුරට කැඳවයි. රූපවාහිනී කැමරාවට අපූරුවට ගැලපෙන ලෙස සියලු 'මේකප්' සිදුකර ඇති එම 'දේශීය කර්මාන්තකරුවෝ', 'ව්‍යාපාරිකයෝ' ආර්ථිකයේ කිසිදු අඩුපාඩුවක් නැති බව දසන් විදහා කියති. ඔවුන්ට ඇති එකම ප්‍රශ්නය මෙපමණ කාලයක් ගතවනතුරු ජනාධිපතිතුමාගේ සුන්දර මුහුණ දැක ගැනීමට ප්‍රමාද වීම පමණි. ඒ නිසා ජනාධිපතිතුමා බැහැ දැකීම නිසා සියලු අර්බුද පහවී තෘප්තිය ඉහවහා ගිය බව රූපවාහිනී කැමරාවට සිනාසෙමින් ඔවුහු සියල්ලෝම කියති. ඒ 'ප්‍රශ්න' අනුව ජනාධිපති මුදල් ඇමතිතුමා සහ නිලධාරීන් ඉදිරි වසරට අයවැය සකස් කරනු ඇත.

නමුත්, ඒ අයවැයේ බදු දැලට හිරවෙන පොදු ජනතාවගේ තත්වය ජනාධිපතිතුමා හමුවෙහි අපූරු යෝජනා දෙන්නන්ට වඩා හාත්පසින්ම වෙනස්ය. ඔවුන් අතර, රාජ්‍ය සේවකයෝ සිටිති. ඔවුන්ගේ අවම මූලික වැටුප තවමත් රුපියල් 11,730/=කි. අර්ධ රාජ්‍ය අංශයේ සේවකයාගේ වැටුප රු:13,600/=කි. පෞද්ගලික අංශයේ පඩි පාලක සහා අවම සේවක වැටුප රු: 8220/= කි. වතු සේවකයෙකුගේ දින 20ක් රු:480/= බැගින් වැඩ කරන වැටුප රු: 9600/= කි. ජනාධිපතිතුමා 'සියලු පාර්ශවයන්ගේ' යෝජනා එකතු කර මීට කලින්ද අයවැය යෝජනා සකස් කළේය. නමුත් ඒ කිසිවකින් ඉහත දැක්වූ කිසිදු පාර්ශවයක ජනතාවකගේ වැටුප් රුපියලකින්වත් වැඩි කළේ නැත.

මහින්ද රාජපක්ෂ බලයට පත්වන විට 2005 දී පවුලක ජීවන වියදම රුපියල් 25,344/= ක්ව තිබුණි. එය වැඩියැයි උද්ඝෝෂණ කළ ජනතාව රාජපක්ෂ පාලනය බලයට ගෙන ආවේය. දැන් වසර 09ක රාජපක්ෂ පාලනය කෙළවර පවුලක ජීවන වියදම රුපියල් 50,792/=ක් යැයි කියන්නේ ආණ්ඩුවේ නිල සංඛ්‍යා ලේඛනවලට අනුවමය.





"ප්‍රධානම ගැටලු දෙක වන්නේ, ඉහළ ගිය ජීවන වියදම සහ පහළ ගිය ජීවිත වටිනාකමය."

**(නිර්නාමික ප්‍රකාශයකි)**

### වැටුප සහ ජීවන වියදම

2002 වසරේදී ආණ්ඩුව ගණනය කළ ක්‍රමය අනුව ජීවන අංකයක රුපියල් වටිනාකම ලෙස රුපියල් 180/=ක් සලකන ලදී. ඒ අනුව 04දෙනෙකුගේ පවුලක සාමාන්‍ය ජීවන වියදම රුපියල් 25,344/=ක් විය. (140.8 × 180) 2014 ජූනි 30 වන විට ජීවන අංකය 181.4ක් වූ අතර, ආණ්ඩුවම වෙනස් කළ අගයන් අනුව, 2006 සිට ජීවන අංකයක රුපියල් වටිනාකම රුපියල් 280/=ක් විය. ඒ අනුව, 2014 ජූනි 30 වන විට ජීවන අංකයට අනුව හතර දෙනෙකුගේ පවුලක ජීවන වියදම රුපියල් 50,792/= ක් විය. 2005 සිට 2014 දක්වා රාජපක්ෂ රජ පවුලේ 09 අවුරුදු පාලනයක් තුළ වැඩිවූ ජීවන වියදම රුපියල් 25,448/=කි.



ජීවන වියදමේ වැඩිවීම පමණක් රුපියල් 25,448/=ක් වන විට, රජයේ සේවකයෙකු හට වැටුප් රුපියලක්වත් මූලික වැටුපට වැඩි නොවී, අවම මූලික වැටුප රුපියල් 11,730/=ක් පමණි. ආණ්ඩුවේ පාලන කාලය තුළ ජීවන වියදම වැඩිවීම පමණක් රජයේ සේවකයෙකුගේ මූලික වැටුපද ඉක්මවා යාමෙන් ජීවන වියදම අර්බුදයේ තරම ඔබට තේරුම් ගත හැකිය.

**ජීවන වියදම හා ජීවන වැටුප**

| | | |
|---|---|---|
| 2005 - දී 4 දෙනෙකුගේ ජීවන වියදම | - 140.8 × 180 | = 25,344 |
| 2013 - දී ඔක් 31 වන විට 4 දෙනෙකුගේ ජීවන වියදම | - 176.1 × 280 | = 49,300 |
| 2014 - ජූනි 30 වන විට ජීවන වියදම | - 181.4 × 280 | = 50,792 |
| 2005 - සිට 2014 ට ජීවන වියදම වැඩිවීම | - 50,793 - 25,344 | |
| | - රු:25,448/= | |

### වැටුප සහ උද්ධමනය

වැඩිවන ජීවන වියදමට සරිලන වැටුපක් නොලැබෙන බව දැන් ඉතා පැහැදිලිය. අවම වශයෙන් ජීවන වියදමට කිට්ටුවීමටවත් අවශ්‍ය නම්, වැටුප් දෙගුණයකින් නොව තුන් ගුණයකින්වත් වැඩිවීමක් අවශ්‍යය. එසේ තිබියෙදී, වැටුපට ජීවන වියදමේ බලපෑම මෙන්ම තවත් සැලකිය යුතු විශේෂ සාධකයක් වන්නේ, උද්ධමනයේ බලපෑමයි. වැටුප රුපියල් වටිනාකමින් අතට ලැබුණද, එය වියදම් කළ හැකි වැටුපේ හැකියාව ලබන වැටුපෙන්ද භාගයකටත් වඩා අඩු නම්, ජනතාවගේ සැබෑ ඉරණම ඔබට තේරුම් ගත හැකිය. **වැඩකරන ජනතාවගේ ජීවත්වීම තීරණය වන්නේ, හුදු වැටුප මත නොව වැටුපෙන් සැබෑවටම මිලදී ගැනීමට ඇති හැකියාව මතය.**

2002 වර්ෂයේදී උද්ධමනය ගණනය කිරීමේදී භාවිත කළ කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව, 2002 දී ජීවන අංකය 154.4ක් වූ අතර, එම වසරේදී රුපියල් 1000/=ක මූර්ත වටිනාකම රුපියල් 647.6ක් විය. එය 2013 නොවැම්බර් වන විට 176.5ක් වූ පාරිභෝගික දර්ශකය අනුව රුපියල් 1000/=ක ඇත්ත වටිනාකම රුපියල් 566.6ක් විය. අපි කලින්ද දුටු පරිදි, 2014 ජූනි 30 වන විට ජීවන අංකය 181.4ක් විය. ඒ අනුව, **2014 ජූනි 30 වන විට රුපියල් 1000ක මිලදී ගැනීමේ මූර්ත හැකියාව (1000/1814×100) රුපියල් 551.26කි. රුපියල් 1000/=ක ඇත්ත මිලදී ගැනීමේ හැකියාව 2002 වර්ෂයට සාපේක්ෂව වෙළඳපොළේදී හරි අඩකින් අඩුවී තිබේ.**

මෙය රජයේ සේවකයෙකුගේ අවම වැටුපට අදාළ කළ විට, රුපියල් 11,730/=ක අවම මූලික වැටුපක් උපයන රජයේ සේවකයාගේ ඇත්ත මූර්ත වැටුප් හැකියාව ඉන් අඩකි. එහෙම රුපියල් 5500/=ක් මට්ටමේය. ජීවන වියදමට සරිලන ලෙස වැටුප් වැඩිවන්නේ නම් 04දෙනෙකුගේ පවුලක් රුපියල් 50,792/=ක් වැටුප් ලබන්නේ යැයි උපකල්පනයක් කළද ඔවුන්ගේ වැටුප් මූර්ත හැකියාව රුපියල් 25,000/=ක් තරම් වනු ඇත.

රුපියල් මූර්ත වටිනාකමින් ගණනය කරන්නේ, 'පාරිභෝගික ක්‍රය ශක්තිය' නැතහොත්, පාරිභෝගිකයා සතු මිලදී ගැනීමේ හැකියාවයි. 2012 වසරට සාපේක්ෂව 2013දී රුපියල් 1000/=ක මූර්ත අගය අඩුවීමේ වේගය 12.5%කි. ඒ අනුව වසරින් වසර උද්ධමනය වැඩිවීමට සාපේක්ෂව රුපියලේ මිලදී ගැනීමේ හැකියාව පමණක් නොව ජනතාවගේ ආදායමින් වියදම් කිරීමේ හැකියාවද පහළ වැටේ. ජීවන වියදම අර්බුදයේ සත්‍ය කථාව එයයි. ජනාධිපතිතුමා හමුවී අයවැය හැදීමට 'උපදෙස් දෙන' දේශීය ගොවීන්, කම්කරුවන්, වෙළඳුන්, කර්මාන්තකරුවන් කිසිවෙක් සිනාසී ඡායාරූප ගතවෙනවා හැරෙන්නට මේ අමිහිරි කථාව ජනාධිපතිතුමාට කියා දෙන්නේ නැත. කියා දුන්නාට වැඩක්ද නැත.

### රුපියල් 50,000 අර්බුදය බෙදීයාම

ජීවන වියදම රුපියල් 50,792/= ක් තරමට ඉහළට යනවිට ඒ අර්බුදයට මුහුණ දෙන ජනතාවගේ තත්වයද ඒ තරමින්ම පහළට කඩා වැටී තිබේ. ජීවන වියදමට සරිලන වැටුපක් ඉල්ලන්නේ රජයේ පෞද්ගලික අංශයේ සේවකයින්ය. ඊටත් අමතරව ආණ්ඩුවේ බදු ගිලටීනයට අසුවෙන තවත් ලක්ෂ ගණනක් සිටිති. ඔවුන් ආදායම උපයනවා නොව වියදම් කරන්නවුන් පමණි. ඒ, 2012/13 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුවය. සමස්ත ආදායමෙන් පොහොසත්ම 20%කට ආදායමෙන් 53.5%ක් හිමිවන විට, දුප්පත්ම 20%කට හිමි වී ඇත්තේ 4.4%ක් පමණය. ආණ්ඩුවේ විග්‍රහයට අනුවත්, 60% ක් වන ඉතිරි ජනතාවට උරුම ආදායමෙන් 42.1%කි.

මෙම විෂමතාවයන් වැටුපේ මූර්ත හැකියාවත්, ජීවන වියදමත් යන තීව්‍ර සාධකයන්ම සැලකීමේදී එක දෙයක් පැහැදිලිය. ඒ, ජනතාවගේ ජීවන වියදම නම් ගිනි කන්ද පුපුරා යන මොහොතටම ළංවී ඇති බවය. ධනපති පාලකයින් ඉලක්කම්වලින් කුමන තර්ක සකස් කර ජීවන වියදමේ අර්බුදය සාධාරණීකරණය කිරීමට උත්සාහ කළද එය තවත් අසාර්ථක වැයමක් පමණි.

පවුල හා සමාජය 1

# පවුලේ අර්බුදය හා සමාජ වගකීම

සිය දරු දෙදෙනා නිදි පැදුරේම මරාදමා තමාද දිවිනසා ගැනීමට උත්සාහ කළ පියෙකු පිළිබඳ පුවතක් පසුගියදා මාධ්‍ය වාර්තාකර තිබිණි. මෙය යටියන්තොට ප්‍රදේශයේ සිදුවූ ඛේදවාචකයක් විය. ඊට හේතුව වී තිබුණේ දිළිඳුකමින් පීඩාවට පත් තම පවුල ගොඩ ගැනීම සඳහා මැදපෙරදිග ගිය බිරිඳ එහිදී වෙනත් සම්බන්ධතාවක් ගොඩනගා ගෙන, ආපසු ඒම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඇතිවූ සිත් තැවුලය. පවුලක් ගොඩ ගැනීමට දැරූ උත්සාහය එසේ අවසන්ව තිබුණේ පවුල කැඩීබිඳී දරුවන්ද ඝාතනය වීමෙනි. මෙය හුදකලා සිදුවීමක් නොවේ. මෙවැනි සිදුවීම් දැන් නිතර නිතර අසන්නට ලැබේ. ඉන් පෙනෙන්නේ, මානව සමාජයේ කුඩාම ඒකකය වූ පවුල බරපතළ අර්බුදයකට මුහුණදී තිබෙන බවය.

ඊට අමතරව පවුලේ ඇති වූ කිසියම් ගැටලුවක් නිසා සිය දරුදෙදෙනා මාතර නිල්වලා ගඟට දමා තමන්ද ගඟට පැන දිවිනසාගත් පියෙකු ගැනද, බිරිඳ හා දරුවන් මරා වැළලීමට යැයි ගේ මැද වළක් කැපූ පියෙකු ගැනද අපට අසන්නට ලැබුණි. ඊටත් අමතරව සැමියා විසින් පහරදී මිය යන බිරින්දෑවරුන් ගැන මෙන්ම බිරිඳ විසින් හෝ බිරිඳ සහ අනියම් සැමියා විසින් මරාදමන ස්වාමි පුරුෂයන් ගැනද වාර්තා නිතර නිතර පළවෙමින් තිබේ. ඉන් පැහැදිලි වන්නේද මානව පවුල ඉතාම දරුණු අර්බුදයකට ලක්ව තිබෙන බවය.


### ඉහළ යන දික්කසාද

2014 මාර්තු මාසයේ පළවී තිබූ ප්‍රවෘත්තියක සඳහන් වූයේ ලංකාවේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව ලංකාවේ සෑම දිනකම දික්කසාදවීම් 400ක් වාර්තා වන බවය. කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අංශය කරන ලද සමීක්ෂණයකට අනුව ලංකාවේ (රට පුරා) විවාහවන පවුල්වලින් 25%ක් හෙවත් විවාහ වන සෑම පවුල් 4කින්ම 01ක් දික්කසාද වන බව පැවසේ. එම දික්කසාද ප්‍රමාණය කොළඹදී 57%ක් තරම් ඉහළ අගයක් ගන්නා බවද එම සමීක්ෂණය විසින් අනාවරණය කරගනු ලැබ තිබේ.

මෙම දික්කසාදවීම්වල විශේෂ කාරණය වන්නේ, ඉහත සමීක්ෂණයට අනුවම දික්කසාද වන පවුල්වලින් 58%ක්ම ප්‍රේම සම්බන්ධතා මත විවාහ වූවන් වීමය. ඉතිරි 42% යෝජිත විවාහයන්ය. මෙය ඉතා බරපතළය.

අනෙක් අතට ඉහත සඳහන් වන්නේ නිල දික්කසාද වීම්ය. නිල නොවන ලෙස වෙන්වී සිටින පවුල් ප්‍රමාණයද සුළුපටු නොවේ. සැමියා හෝ බිරිඳ ඔවුනොවුන් හැරදමා යාමේ සිදුවීම්ද විශාල ප්‍රමාණයක් තිබේ. මේ නිසාම සිදුවන ඝාතන, පහරදීම්, දිවිනසා ගැනීම්, දරුවන් දිවිනසා ගැනීමට පෙළඹීම් සංඛ්‍යාවද විශාලය. මේ සියල්ලෙන් පෙන්වන්නේ, අපේ සමාජයේ වත්මන් පවුල ඉතාම බරපතළ අර්බුදයකට මුහුණ දී සිටින බවය. මෙය මානව සමාජයේ පැවැත්මට වාසිදායක නැත; හානිදායකය. එබැවින් වත්මන් පවුල මුහුණදී ඇති මෙම අර්බුදය කුමක්දැයි නිවැරදිව හඳුනාගත යුතුය.

ආදරයේ දෙහදක බැඳීමට වත්මන් පවුල බිඳී යා නොදී තබාගැනීමට නොහැකි නම්, නීතියේ වගන්තිවලට එය රැකගැනීමට නොහැකි නම්, සමාජ සදාචාරය, සිරිත්-විරිත් පවා එය ආරක්ෂා කිරීමට සමත් නොවේ නම් නිසැක ලෙසම එහි අර්බුදයක් තිබේ. එසේ නම්, එය කුමක්ද? එය එසේ සිදුවූයේ ඇයි? ඊට ඇති විසඳුම කුමක්ද? ආදී ප්‍රශ්න රැසකට පිළිතුරු සොයා ගැනීමට මෙහිදී අපට සිදුවේ. ඒ සඳහා මානව සමාජය බිහිවූ, එහි ආරම්භක අවස්ථාවේ පවුල ඒකකයක් ලෙස බිහිවූ අයුරුත් එය අද දක්වා විකාශනය වූ අයුරුත් එය වර්තමානයේ මුහුණ පා ඇති ගැටලු හා ඒවා ඇති වූ ආකාරයත් අධ්‍යයනය කළ යුතුය. මෙම ලිපි මාලාවේ අරමුණ එයයි.



### මානව සමාජයේ කුඩාම ඒකකය ලෙස

පවුල යනු මානව සමාජයේ කුඩාම තැනුම් ඒකකය වේ. එහි න්‍යෂ්ටිය වනුයේ පුරුෂයා හා ස්ත්‍රිය හෙවත් සැමියා හා බිරිඳය. ඔවුන්ගේ දෙමව්පියන් හා ඔවුන්ගේ දරුවන් එක්වීමෙන් මෙම පවුල් තවත් පුළුල් වේ. පවුල හා සමාජය අතර ඇත්තේ වෙන්කළ නොහැකි අන්තර් සම්බන්ධතාවයකි. පවුල පවතින්නේ සමාජය තුළ වන අතර, සමාජය සැදී ඇත්තේ පවුල්වලිනි. මේ නිසා පවුලේ අර්බුදය සමාජ අර්බුදයක් වන අතර, සමාජ අර්බුදය පවුල් තුළින් ප්‍රකාශයට පත්වීමද සිදුවේ.

වර්තමානයේ පවුල් අර්බුදය දකින හා ඊට විසඳුම් ඉදිරිපත් කරන බොහෝ දෙනා ඊට ප්‍රවේශ වන්නේ මතුපිට අර්ථයෙනි. නැතිනම් වැරදි අන්තයකින්ය. ඒ දෙස බලන්නේ, වැරදි දෘෂ්ටිකෝණයකිනි. සමහරු එය පවුලේ සදාචාරය බිඳ වැටීමක් ලෙස, තනි තනි ගැහැණුන්ගේ හා මිනිසුන්ගේ වරදක් ලෙස දකින අතර, සදාචාරය ගොඩනැංවීමෙන් ඊට විසඳුම් සෙවීමට කල්පනා කරති. තවත් සමහරු නීතියේ දුර්වලත්වයන් ලෙස මෙය දකින අතර, නීතියේ පැත්තෙන් විසඳුම් සොයති. ඒ සඳහා පවුල් උපදේශන ආයතන, නීති ආධාර ආයතන බිහිවෙයි. එහෙත් පවුලේ බිඳවැටීම නැවැත්වීමට එම ආයතන සමත්වී නැති බව

> වර්තමානයේ පවුල් අර්බුදය දකින හා ඊට විසඳුම් ඉදිරිපත් කරන බොහෝ දෙනා ඊට ප්‍රවේශ වන්නේ මතුපිට අර්ථයෙනි. නැතිනම් වැරදි අන්තයකින්ය. ඒ දෙස බලන්නේ, වැරදි දෘෂ්ටිකෝණයකිනි. සමහරු එය පවුලේ සදාචාරය බිඳ වැටීමක් ලෙස, තනි තනි ගැහැණුන්ගේ හා මිනිසුන්ගේ වරදක් ලෙස දකින අතර, සදාචාරය ගොඩනැංවීමෙන් ඊට විසඳුම් සෙවීමට කල්පනා කරති.

දිනපතා තහවුරු වෙමින් තිබේ. සමහරවිට එම ආයතනද පිරිහී පවුල් රකින ආයතන නොව, පවුල් කඩන ආයතන බවට පත්වූ අවස්ථාද තිබේ. එබැවින් සදාචාරය පිළිබඳ පාඩමකින් හෝ නීතිරීති දැඩිකිරීමෙන් නැතිනම් නීති ලිහිල් කිරීමෙන් පවුලේ වත්මන් අර්බුදයට පිළියම් සෙවිය නොහැකි බව පැහැදිලිය.

මෙම තත්වය තුළ පවුලේ වත්මන් අර්බුදය හෙවත් වත්මන් අර්බුදකාරී තත්වයට පවුල පත්වූයේ ඇයිද යන්න සොයාගත යුතුය. එහෙත් ඒ සඳහා පවුල බිහිවූ අයුරු, එය එක් එක් සමාජ ක්‍රමයෙන් සමාජ ක්‍රමයට විකාශනය වූ අයුරු, එම විකාශනයේදී එක් එක් කාලවල පවුල තුළ බිහිවූ ලක්ෂණ, වර්තමානයේ එහි පවතින ප්‍රතිවිරෝධතා ආදිය ඓතිහාසිකවත්, විෂයමූලිකවත් සමාජය හා ඇති අන්තර් සම්බන්ධතා තුළත් අධ්‍යයනය කළ යුතුය.

### පවුල දෙස මාක්ස්වාදී ඇසකින්

එකී අධ්‍යයනයේදී අපට යොදාගත හැකි නිවැරදිම හා විශ්වාසනීයම විධික්‍රමය වන්නේ මාක්ස්වාදී විධික්‍රමයයි. පවුලේ බිහිවීම එහි විකාශනය පිළිබඳ විවිධ පර්යේෂණ කළ සමාජ විද්‍යාඥයන්නගේ හා මානව විද්‍යාඥයන්ගේ අධ්‍යයනයන්ගේ සොයා ගැනීම් හා ඔවුන් ඉදිරිපත් කළ කරුණු උපයෝගී කර ගැනීමෙන් භෞතිකවාදී පදනමක් මත පවුල පිළිබඳ මාක්ස්වාදී දැක්ම ගොඩනැගී තිබේ. පවුල පිළිබඳව කරන අධ්‍යයනයකදී එංගල්ස් විසින් රචිත 'පවුල පෞද්ගලික දේපළ හා රජය ඇති වූ සැටි' නම් අගනා කෘතියත් තවත් විවිධ ලිපි හා ලේඛනත් මාක්ස්වාදී දෘෂ්ටියකින් පවුලේ විකාශනය හා වර්තමානය දෙස බැලීමට අපට මඟ පෙන්වයි. ඉන් නොනැවතී පවුලේ අනාගතය පිළිබඳ දළ අනාවැකියක්ද එහි තිබේ.

පවුලේ බිහිවීම හා විකාශනය පිළිබඳ අධ්‍යයනයේදී එංගල්ස් වඩාත් උපයෝගී කරගෙන ඇත්තේ, පරිණාමවාදයත් භෞතිකවාදයත් විශේෂයෙන්ම ඇමෙරිකානු මානව විද්‍යාඥයෙකු වූ ලෙවිස් එච්. මෝර්ගන් (Lewis H. Morgan) ඉගැන්වීමත්ය. මෝර්ගන් 1877දී 'පැරණි සමාජය' (Ancient Society) නමින් පොතක් පළ කළේය. එය මේ ක්ෂේත්‍රයේ නව දැනුමක් එක් කළ හා නව මානයකින් පවුල දෙස බැලීමට ඉගැන්වූ කෘතියක් විය. සිය අධ්‍යයනය සඳහා එංගල්ස් එම කෘතියේ කරුණු පදනම් කරගෙන තිබේ. **"මෝර්ගන්ගේ අනගිතම සේවය වූ කලී අපේ ලිඛිත ඉතිහාසයේ ප්‍රධාන අංග ලක්ෂණ විදහා පෙන්වන ප්‍රාග් ඓතිහාසීය පදනම සොයා ගැනීම සහ එය විදහා පෙන්වීමද, එය ප්‍රතිසංස්කරණය කිරීමද, උතුරු ඇමෙරිකානු රෝමානු සහ ජර්මන් ඉතිහාසයේ මෙතෙක් අභිරහසක්ව පැවති ගැටලු විසඳාලීමට මඟ පෑදීමය. ඔහුගේ මෙම කෘතිය එක දවසකින් නිමවූවක් නොවේ. පූර්ණ නිපුණත්වය ලබන තුරු ඔහු මෙම විෂය වසර 40ක් පමණ කාලයක් මුළුල්ලේ හැදෑරීය. ඔහුගේ මෙම පොත අප කාලයේ උසස්තම කෘතීන් ස්වල්පයෙන් එකක් වනුයේ එබැවිනි."** යනුවෙන් එංගල්ස් 1884දී 'පවුල පෞද්ගලික දේපළ හා රජය ඇති වූ සැටි' (The Origin of the Family, Private Property, and the State) නම් කෘතියේ පළමුවෙනි මුද්‍රණයට ලියූ පෙරවදනේ සඳහන් කළේය. ලෝකය එතෙක් දැන සිටි ලිඛිත ඉතිහාසයට එහා පැවති සමාජයක් හා එහි පවුල් සබඳතා පිළිබඳ මෝර්ගන්ගේ සොයා ගැනීම් එම ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසකට මඟ පෑදීය. එංගල්ස් විසින් කරන ලද්දේ, මෝර්ගන්ගේ පොත සහ මාක්ස් විසින් මෝර්ගන්ගේ පොත ගැන ලියූ සටහන්ද උපයෝගී කරගෙන මෙම විෂය අංග සම්පූර්ණ හා විද්‍යාත්මක ලෙස විග්‍රහ කිරීමය.

එම ඉගැන්වීම්වලට අනුව පවුල කිසිවෙකු විසින් මැවූ දෙයක් නොවේ. එසේම එය හැමදාම පැවතියේ වර්තමානයේ පවතින ආකාරයටද නොවේ. වර්තමාන ධනවාදී සමාජයේ පවතින පවුල යනු අතීත ප්‍රථමික සමාජයේ පැවති පවුල් ආකෘතිය පරිණාමය වීමෙන් සකස් වූ එකකි. පවුලේ වර්තමාන අර්බුදය ඉල්ලා සිටින්නේ, එය මෙයින් ඉදිරියටද සංවර්ධනය විය යුතු බවය. වෙනස් විය යුතු බවය. සමාජයම අර්බුදයට ගොස් තිබියදී පවුල පමණක් ඉන් මුදාගත හැකි යයි සිතීම නිවැරදි නැත. මේ පිළිබඳව අධ්‍යයනයක් කළ යුත්තේ ඒ නිසාය. ඒ සඳහා මීළඟ කලාපයේ සිට අපි මුණ ගැසෙමු.

# BRICS: එක්සත්ජනපද අධිරාජ්‍යවාදයට අභියෝගයක්

ගත වූ මාසය තුළ ජාත්‍යන්තර වශයෙන් වැදගත් සිදුවීම් ගණනාවක්ම ලෝකය පුරා සිදුවුණි. ඒ අතර මැලේසියානු, ඇල්ජීරියානු, තායිවාන සහ ඉන්දියන් ගුවන් යානා කඩා වැටීම්, ඉරාකයට එරෙහි ISIS ත්‍රස්තවාදී ප්‍රහාරය, පලස්තීන ජනතාවට එරෙහි ඊශ්‍රායල් ප්‍රහාර ආදිය කාගේත් අවධානයට ලක් විය. වැඩි කථාබහට ලක් නොවුණ ද ජාත්‍යන්තර දේශපාලන අනාගතයට තීරණාත්මක ලෙස බලපාන්නා වූ වැදගත් සිදුවීම් ගණනාවක් ලතින් ඇමරිකානු කලාපය තුළ ඊට සමගාමීව සිදුවිය.

ලතින් ඇමරිකානු රටවල් අතරින් වඩාත්ම ලෝක අවධානය දිනාගත්තේ බ්‍රසීලයයි. ජුනි මස 12 වනදායින් ආරම්භ වී ජුලි මස 13 වනදායින් අවසන් වූ පාපන්දු ලෝක ශූරතා තරගාවලිය ඊට ප්‍රධානතම හේතුවයි. එහෙත් ඒ අතරම පාපන්දු ලෝක ශූරතා තරගාවලියෙන් පසු බ්‍රසීලයේ ෆෝටලීසා නගරයේ දී ආරම්භ වූ බ්‍රික්ස් (BRICS) සමුළුව ඊට නොදෙවෙනිව ලෝක ජනතාවගේ අවධානය බ්‍රසීලය වෙත ගෙන ඒමට සමත් විය.

BRICS සමුළුව

මෙවර පැවැත් වූ හයවන බ්‍රික්ස් සමුළුව ආරම්භ කෙරුණේ හරියටම පාපන්දු ලෝක ශූරතා තරගාවලිය අවසන් වූ දිනට පසුදිනය. එනම්, ජුලි මස 14වනදාය. එය ජුලි 16 වනදා දක්වා පැවැත්වුණ අතර බ්‍රසීලය, රුසියාව, චීනය, දකුණු අප්‍රිකාව යන රටවල ජනාධිපතිවරු ඊට සහභාගි වූහ. මෙවර විශේෂත්වය වූයේ ඉන්දියාවේ නව අගමැති නරේන්ද්‍ර මෝදි පළමුවරට බ්‍රික්ස් සමුළුවට සහභාගි වීමයි.

බ්‍රික්ස් කණ්ඩායමට අයත් බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව යන රටවල ජනගහනය ලෝක ජනගහනයෙන් 43% කි. මෙම රටවල භූමිය ලෝක භූමි ප්‍රමාණයෙන් 30%කි. මෙම රටවල් පහේ දළ ජාතික නිෂ්පාදිතයන්ගේ එකතුව ලෝක ආර්ථිකයෙන් 18%කට වගකියයි. ඒ අතරම ලෝකයේ ඇති මූල්‍ය සංචිතවලින් 35% ක්ම ඇත්තේ මෙම රටවලයි. එබැවින් බ්‍රික්ස් කණ්ඩායම ලෝක දේශපාලනයේ සහ ආර්ථිකයේ බලපෑම් සහගත එකතුවක් බවට පත්ව තිබේ. විශේෂයෙන් එය එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල ක්‍රියාකාරිත්වයට අභියෝග යක් වන කණ්ඩායමක් බවට වර්ධනය වෙමින් තිබෙනු පෙනෙන්නට තිබේ. හයවන බ්‍රික්ස් සමුළුවේදී ගැණුන තීන්දු විසින් එය තවදුරටත් තහවුරු කර තිබේ.

## BRICS **බැංකුව ආරම්භ කිරීම**

බ්‍රික්ස් රටවල් මෙවර සමුළුව සලකන්නේ එහි ගමනේ දෙවන වටයේ ආරම්භය ලෙසිනි. පළමු සමුළුවේ සිට දකුණු අප්‍රිකාවේ දී පැවති පස්වන සමුළුව දක්වා ඔවුන්ගේ පළමු වටයයි. පළමු වටයේදී මෙම රටවල් ජාත්‍යන්තර ආර්ථිකයේ තමන්ට හිමි ස්ථානය තහවුරු කර ගැනීමට සමත් වූ බවත්, ලෝකයේ වර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් බවට පත්වීමට හැකි වූ බවත් සමුළුව අවසානයේදී ප්‍රකාශයට පත්කළ ෆෝටලීසා ප්‍රකාශනයේ ( Fortaleza Declaration) සඳහන් කර තිබේ.

මෙවර සමුළුවේ දී ගත් වැදගත් තීරණයන්ගෙන් එකක් වන්නේ, නව සංවර්ධන බැකුවක් සහ සංචිත අරමුදලක් පිහිටුවීමට ගත් තීරණයයි. ඒ අනුව ඉදිරියේ දී පිහිටුවන ලබන නව සංවර්ධන බැංකුව බ්‍රික්ස් බැංකුව ලෙසින් හැඳින්වේ. එහි ආරම්භක ප්‍රාග්ධනය එක්සත් ජනපද ඩොලර් බිලියන 100ක වටිනාකමකින් යුක්තය. සෑම සාමාජික රටක්ම ඩොලර් බිලියන 50 ක දායකත්වයක් ආරම්භයේදී දක්විය යුතුය.

බ්‍රික්ස් බැංකුවේ පළමු සභාපති ධූරය ඉන්දියාවට හිමිවේ. පාලක මණ්ඩලයේ පළමු සභාපති ධූරය රුසියාවටත්, අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති ධූරය බ්‍රසීලයටත් හිමිවේ. එහි මූලස්ථානය චීනයේ ෂැංහයි නුවර පිහිටුවනු ලබන අතර ශාඛාවක් දකුණු අප්‍රිකාව තුළ පවත්වාගෙන යාමට නියමිත ය.

අභිනවයෙන් පිහිටුවනු ලබන බ්‍රික්ස් බැංකුව එක්සත් ජනපද වුවමනාවන් අනුව කටයුතු කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් ලෝක බැංකුවටත් එරෙහි විකල්පය බවට පත්වනු ඇති බව ජාත්‍යන්තර දේශපාලන විචාරකයන්ගේ මතයයි. ඒ සමගම ලෝක ආර්ථිකයේ සහ මූල්‍ය ක්ෂේත්‍රයේ එක්සත් ජනපදය පවත්වාගෙන ආ ඒකාධිකාරී බලපෑම මෙම මූල්‍ය ආයතන ක්‍රියාත්මක වීම ආරම්භ වීමත් සමඟ බිඳ වැටෙනු ඇත.

එසේ ම බ්‍රික්ස් සමුළුව අවසානයේදී රටවල් පහේම නායකයන් අත්සන් කළ ප්‍රකාශනය මගින් (එය ෆෝටලීසා ප්‍රකාශනය ලෙස ද හැඳින්වේ.) එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රතිසංවිධානය කළයුතු බව අවධාරණය කර තිබේ. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩල සාමාජිකයන් ලෙස බ්‍රසීලය, ඉන්දියාව සහ දකුණු අප්‍රිකාවද ඇතුළත් කරගත යුතු බවට ඉන් යෝජනා කර තිබේ.

## BRICS **සහ දකුණු ඇමරිකානු රටවල සහයෝගීතාව**

බ්‍රික්ස් සමුළුව අවසන් වූ වහාම බ්‍රික්ස් රටවල් පහේ නායකයෝ දකුණු ඇමරිකානු ජාතීන්ගේ සංගමයේ හෙවත් UNASUR නායකයන් සහ ලතින් ඇමරිකානු හා කැරිබියන් රටවල සංගමයේ (CELAC) නායකයින්ගේ හමුවක් පැවැත්වූහ.

එම අවස්ථාවට ආර්ජන්ටිනා, චිලි, බොලිවියා, වෙනිසුවෙලා, ඉක්වදොර්, කොලොම්බියා, උරුගුවේ, පේරු, පැරගුවේ, සුරිනාම්, ගයනා, කොස්ටරිකා සහ කියුබා යන රටවල රාජ්‍ය නායකයෝ සම්බන්ධ වූහ.

එහිදී බ්‍රසීල ජනාධිපතිනි ඩිල්මා රොසෙෆ් කථා කරමින් පොදු වුවමනාවන් ඇති රටවල් ලෙස දකුණු ඇමරිකානු රටවල් සහ බ්‍රික්ස් රටවල් අතර සාධනීය සංවාදයක් ආරම්භ කළ යුතු යැයි ද, ගෝලීය වශයෙන් ආර්ථික සංවර්ධනය සහ බහු පාර්ශ්වික නියෝජනය ඇති කිරීම වෙනුවෙන් බ්‍රික්ස් බැංකුව ආරම්භ කළ බවද සඳහන් කළාය. බ්‍රික්ස් බැංකුව පිළිබඳ අදහස් දැක්වූ කලාපීය රටවල නායකයෝ ඊට සුභ පැතූ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේත් ලෝක බැංකුවේත් ක්‍රියා කලාපය හෙළා දැක්කහ.

මෙම හමුවේ අරමුණ වූයේ දකුණු ඇමරිකානු රටවල් සහ බ්‍රික්ස් රටවල් අතර දේශපාලන, වෙළඳ, ආයෝජන, විද්‍යා හා තාක්ෂණික, අධ්‍යාපන, සංස්කෘතික යන ක්ෂේත්‍රයන්ගේ සහයෝගීතාව වර්ධනය කිරීමය.

මෙම සමුළුවට සමගාමීව රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් සහ චීන ජනාධිපති ක්ෂී ජින්ග් ජින්ග් කලාපයේ රටවල් ගණනාවක සංචාරයේ නිරත වූහ. එහිදී රුසියාවත් චීනයත් ලතින් ඇමරිකානු සහ කැරිබියන් රටවල් ගණනාවක් සමඟ ද්වීපාර්ශ්වික ගිවිසුම් ගණනාවකට අත්සන් තැබීය. චීනය බ්‍රසීලය සමඟ, වෙළෙඳ විද්‍යා හා තාක්ෂණය, ආරක්ෂක, බලශක්ති, අධ්‍යාපන, ගුවන් ගමන්, ආදී ක්ෂේත්‍ර ගණනාවක විහිදුන නව ගිවිසුම් 54 කට අත්සන් තැබීය. චීන ජනාධිපති ක්ෂිං ජින්ග් ජින්ග් සිය දකුණු ඇමරිකානු චාරිකාවේදී බ්‍රසීලයට අමතරව කියුබාවට සහ ආජෙන්ටිනාවටද පැමිණි අතර ගිවිසුම් ගණනාවකට පිවිසුණි.

බ්‍රසීලය සහ රුසියාව අතර අත්සන් කෙරුණ ගිවිසුම් ක්‍රියාත්මක වීමත් සමඟ රුසියාව සහ බ්‍රසීලය අතර දැනට සිදු කෙරෙන වෙළෙඳ කටයුතු දෙගුණ වනු ඇතැයි බලාපොරොත්තු වේ. අත්සන් කෙරුණ ගිවිසුම් අතරින් වඩාත් වැදගත් වන්නේ, දෙරට අතර අත්සන් තැබුණු යුධ - තාක්ෂණික ගිවිසුමයි. බ්‍රසීලයේ ගුවන් ආරක්ෂාව සම්බන්ධයෙන් රුසියානු සහය ලබා ගැනීමට ඉන් ඉඩ සැලසේ. එසේම සාමකාමී කටයුතු සඳහා න්‍යෂ්ටික තාක්ෂණය භාවිතා කිරිම සඳහාද දෙරට අතර ගිවිසුමක් අත්සන් කෙරුණි.

රුසියන් ජනාධිපතිවරයාගේ කියුබානු සංචාරයේදී ඔහු එරට හිටපු ජනාධිපති ෆිදෙල් ක්‍රස්ත්‍රෝ සහෝදරයාවද, මුණ ගැසුණි. කියුබාවේ වත්මන් ජනාධිපති රාවුල් ක්‍රසත්‍රෝ සමඟ සිදු කෙරන ද්වී පාර්ශ්වීක සාකච්ජා වලදී කියුබාව මේ දක්වා රුසියාවට ගෙවීමට තිබූ ණය අහෝසි කිරිමටද එකඟතාවකට පැමිණියේය.

මෙතෙක් රුසියාව විසින් අත්හැර දමා තිබුණු කියුබාවේ පිහිටි රුසියානු රහස් තොරතුරු මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය නැවත ආරම්භ කිරිමටද රුසියාව තීරණය කර තිබේ. මෙම රහස් තොරතුරු මධ්‍යස්ථානය පිහිටවුන ලැබුවේ 1962දී එවකට සමාජවාදී සෝවියට් දේශය විසිනි. එය කියුබාවේ බටහිර ප්‍රදේශයේ ෆ්ලෝරිඩාවට කි.මී.250ක් පමණ දුරකින් පිහිටා ඇත. එමගින් එක්සත් ජනපදයේ චන්ද්‍රිකා පණිවුඩ හුවමාරු තොරතුරුද, දුරකථන පණිවුඩ හුවමාරු තොරතුරුද කැනවරල් තුඩුවේ පිහිටා ඇති ඇමරිකානු අභ්‍යවකාශ ආයතනයේ (NASA) ක්‍රියාකාරීත්වය පිළිබඳව තොරතුරුද එක්රැස් කෙරුණි. එහෙත් සෝවියට් දේශය බිඳ වැටීමත් සමඟ එය පවත්වා ගෙන යාම හදිසියේම රුසියාව විසින් අත්හැර දමන ලදි. ඒ වන විට කියුබාවේ රහස් තොරතුරුවලින් 75%ක් ලබා ගැනුණේ ඒ හරහාය. ඉන් පසුව එම මධ්‍යස්ථානය නඩත්තු කරනු ලැබුවේ කියුබාව විසිනි.

2004 වසරේ දී රුසියාව හා එක්සත් ජනපදය අතර සබඳතා බිඳ වැටීමෙන් පසු රුසියාව යළි මෙම මධ්‍යස්ථානය වෙත පැමිණීම පිළිබඳව සලකා බලමින් සිටි අතර රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින්ගේ මෙවර සංචාරයේදී ඒ පිළිබඳව එකඟතාවයට පැමිණ තිබේ.

හයවන බ්‍රික්ස් සමුළුවේදී ගැනුණු තීන්දු තීරණත් දකුණු අමරිකානු කලාපය හා බ්‍රික්ස් රටවල් අතර ගොඩ නැගුණු හා ගොඩ නැගිමෙන් පවත්නා වූ සහයෝගීතාවත් ජාත්‍යන්තර දේශපාලනයේ දී ඉතා විශාල වැදගත්කමක් දරයි.

එක්සත් ජනපදය ප්‍රමුඛව බටහිර අධිරාජ්‍යවාදී රටවල් එක්සත් ජාතීන්ගේ සංවිධානයත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වැනි ආයතනත් තමන්ගේ මෙවලම් බවට පත්කර ගනිමින් ලෝකය පුරා අධිපත්‍යය පතුරුවා ගෙන සිටි. ඔවුන් එක් පසෙකින් දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින අතරම අනෙක් පසින් ඉන් මිදීම සඳහා අනෙක් රටවල් මත බලය පතුරවමින්, විවිධ ආකාරයේ ගැටුම් ඇති කර ඒවා දඩමීමා කර ගනිමින් එක් එක් රටවල සම්පත් කොල්ලකමින් සිටී. ආර්ථික හා දේශපාලන වුවමනාවන් වෙනුවෙන් තමන්ට අවනත නොවන රටවල් මත විවිධ බලපෑම් කරමින් සම්බාධක පනවමින් සිටී. ඔවුන්ගේ මෙකී ක්‍රියාකාරිත්වය ලෝක ජනතාවට පමණක් නොව පරිසරයටද දරුණු හානිකර බලපෑම් දැනටමත් සිදු කර ඇත.

සමාජවාදී සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු දකුණු ඇමරිකානු රටවලට කෙරෙන අධිරාජ්‍යවාදී මැදහත්වීමට එරෙහිව වෙනිසුවෙලාවේ හිටපු නායක හියුගෝ චාවේස්ගේත් කියුබාවේත් මෙහෙයවීමෙන් දකුණු ඇමරිකානු ජාතීන්ගේ සංගමය සහ ලතින් ඇමරිකානු සහ කැරිබියන් කලාපීය රාජ්‍යයන්ගේ **15වැනි පිටුවට**





"ලෝකවාසී ජනතාව එක්සත්ව, එක්සත් ජනපද ආක්‍රමණිකයින් සහ ඔවුන්ගේ සියලු දුවන බල්ලන් පරාජය කළ යුතුය! ලෝකවාසී ජනතාව සටන් කිරීමට නොබියව, දුෂ්කරතා විඳදරාගනිමින් රැලි පිට රැලි මත ඉදිරියට යති. එවිට මුළු ලෝකය ජනතාව සතුවනු ඇත. සියලු වර්ගයන්හි අති දුෂ්ටයින් විනාශ කෙරෙනු ඇත."

**මාඕ සේතුං**
**1964**



# මුහුදින් පලවා හැරෙන ධීවරයා

අව්ව, වැස්ස, මාරියාවට මුහුණ දෙමින් තම ජීවිත අවදානම නොතකා මහ මුහුද සමග පොර බදමින් මේ රටේ ධීවර ජනතාව සිදු කරනුයේ සුවිශේෂ කාර්ය භාරයකි. රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමටත් රටේ ජනතාවගේ ආහාර වේලට ප්‍රෝටීන අවශ්‍යතාව සපයාදීමටත් දායකත්වය දැක්වීමත් ධීවර කර්මාන්තයෙන් සිදුවේ. නමුත් රටේ ධීවර ප්‍රජාව පවසන්නේ ඔවුන්ට ස්වකීය රැකියාව කරගෙන යාමට අපහසු බවයි. ධීවර කර්මාන්තයේ නියුතු 220,000ක් පමණ වන ධීවර කාර්මිකයින්ට හා පහළොස් ලක්ෂයකට ආසන්න ඔවුන්ගේ යැපෙන්නන්ටත් මුහුණදීමට සිදුවී ඇත්තේ ඉතා බේදනීය තත්වයකටය. මේ හේතුවෙන් ධීවර ප්‍රජාව තම වෘත්තීය අතහැර වෙනත් වෘත්තීන් කරා යොමුවෙති. පිරිසක් නීති විරෝධී ක්‍රම මගින් විදේශ රටවල රැකියා සඳහා යොමුවෙති.

ගෙවී ගිය හැටහය වසරක පාලන කාලය තුළ කිසිදු ධනපති ආණ්ඩුවක් ධීවර කර්මාන්තය නඟා සිටුවීමට නිවැරදි, විද්‍යාත්මක මැදිහත්වීමක් සිදුකර නොමැත. ඔවුන් ප්‍රකාශ කරන්නේ මේ රට වටා මුහුදක් ඇති බැවින් ධීවර කර්මාන්තය නඟා සිටුවීමට කටයුතු කරන බව යන සුන්දර වචන මාලාව පමණි. රටවටා කිලෝමීටර් 1620 මුහුදු තීරයක් ඇත. එමෙන්ම ව.කි.මී. 517,000ක සාගර කලාපයක් ඇත. එය මේ රට මෙන් අටගුණයකි. එවැනි සාගර සම්පතකින් මානව සම්පත යොදා ගනිමින් ඉහළ මත්ස්‍ය අස්වැන්න නෙළාග ැනීමට ගෙවී ගිය ආණ්ඩු අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවාද? ගෙවීගිය කාලය තුළ ආණ්ඩුව රාජ්‍ය අයවැයෙන් ධීවර අමාත්‍යාංශයට වෙන්කළ මුදල විමසා බලමු. වර්ෂ 2012දී මිලියන 3069කි. 2013 දී මිලියන 2686කි. 2014 දී මිලියන 2216කි. එනම් ක්‍රමයෙන් මුදල් කප්පාදු කර ඇත. මේ අනුව රාජපක්ෂ ආණ්ඩුව ක්‍රියා කර ඇත්තේ ධීවර කර්මාන්තය නඟා සිටුවීමට නොව, ධීවරයා කර්මාන්තයෙන් ඉවත් කිරීමටය.

### සහනාධාර අහෝසිය

2012 වර්ෂයේ ආණ්ඩුව තෙල් මිල ඉහළ දැමූවිට, ධීවර ජනතාව ජීවිත පරිත්‍යාගයෙන් සටන් කළහ. එහිදී ලබාගත් ඉන්ධන සහනාධාරය මේ වනවිට නතර කර මාස 18කට ආසන්නය. මෙයට එරෙහි ධීවර ප්‍රජාව සටන් ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. පසුගියදා මීගමුවේ පැවැති ධීවර උපවාසයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ එළඹෙන සැප්තැම්බර් මාසයේ තෙල් මිල අඩුකරන බවත්, ඒ නිසා උපවාසය නතර කරන ලෙසත්ය. නමුත් ධීවර අමාත්‍යාංශය පවසන්නේ ඉන්ධන සහනාධාරය වෙනුවට විකල්ප සහනාධාරයක් ලබා දෙන බවය. ඒ අනුව පැහැදිලි වන්නේ ඉන්ධන සහනාධාරය නතර කලද, එය නැවත ලබාදීමට හෝ තෙල් මිල පහත හෙළීමට ආණ්ඩුවට වැඩපිළිවෙළක් නොමැති බවය.

ධීවර අමාත්‍යාංශයේ විකල්ප සහනාධාරය යනු කුමක්ද? එක් යාත්‍රාවකට මසකට ලැබෙන සහනාධාරය ප්‍රමාණය මෙන් දොළොස් ගුණයක් (වාර්ෂික ඉන්ධන සහනාධාරය) සමාන දැල් හා ආම්පන්න ලබාදෙන බවයි. එනම් බහුදින යාත්‍රාවට රු:374,000.00ක් (31,200×12), එක්දින යාත්‍රාවකට රු:216,000.00 (18,000×12) කුඩා යාත්‍රාවකට රු:185,000.00 (9375×12) ක් ය. මේ අනුව රටේ සමස්ත යාත්‍රා සඳහා ගණන් බැලූ විට, විකල්ප සහනාධාරය ලබා දීමට රුපියල් මිලියන 3900ක් වැයවේ. නමුත් 2014 වර්ෂයේ සමස්ත ධීවර කර්මාන්තයටම වෙන්කර ඇත්තේ රුපියල් මිලියන 2216කි. මෙය ප්‍රෝඩාවක් බව ධීවර ජනතාවට පැහැදිලිවී ඇත. මෙය "නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත්පට්ටයකුත් තවත් ටිකකුත්" යන්න හා සමාන වේ.

ධීවර ආම්පන්න මිල අධිකවීම, ධීවර කාර්මිකයා මුහුණ පාන බරපතළ ගැටලුවකි. ජාතිය ගොඩනැගීමේ බද්ද, වරාය

> "ධීවර ප්‍රජාව ඉල්ලා සිටින්නේ ධීවර ආම්පන්න මත බදු ලිහිල් කරන ලෙසය. නමුත් ආණ්ඩුව නෑසුනාසේ සිටියි. රජ පැටව් රේස් පදින කාර්වල බදු නිදහස් කරන මේ ආණ්ඩුව, දිවි පරදුවට තබමින් රැකියාවේ නියුතු ධීවරයින්ගේ ආම්පන්න බදුවලින් ලිහිල් කිරීමට කටයුතු නොකිරීම බේදනීය තත්වයකි."

හා ගුවන්තොටුපල බද්ද, වැට් බද්ද ආදී වශයෙන් එකතුවන බදු ප්‍රමාණය 85%ක් පමණ වේ. මෙයට අමතරව ධීවර වරායවල නැංගුරම් ගාස්තු, දොඹකර ගාස්තු 200%කින් ඉහළ දමා ඇත. වත්මන් ආණ්ඩුව පාර්ලිමේන්තු, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වාහන බදුවලින් නිදහස් කරයි. ධීවර ප්‍රජාව ඉල්ලා සිටින්නේ ධීවර ආම්පන්න මත බදු ලිහිල් කරන ලෙසය. නමුත් ආණ්ඩුව නෑසුනාසේ සිටියි. රජ පැටව් රේස් පදින කාර්වල බදු නිදහස් කරන මේ ආණ්ඩුව, දිවි පරදුවට තබමින් රැකියාවේ නියුතු ධීවරයින්ගේ ආම්පන්න බදුවලින් ලිහිල් කිරීමට කටයුතු නොකිරීම බේදනීය තත්වයකි.

### ධීවර වරාය නොමැතිවීම

මේ රටේ ධීවර වරාය 19ක්, නැංගුරම් පොළ 58ක් හා තොටුපළ 860ක් පමණ ඇත. ධීවර වරායවලින් බහුතරයක් ඉදිකර ඇත්තේ විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව නොව, ආණ්ඩුවේ බලධාරීන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ අභිමතයට අනුවය. මේ වන විටත් ධීවර වරාය රැසක් වැලිවලින් පිරී ඇත. යාත්‍රා ඇතුල් කිරීමට නොහැකිව ඇත. විශේෂයෙන්ම කිරින්ද, දොඩංදූව, වස්කඩුව, අම්බලන්ගොඩ උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මේ හේතුවෙන් මෙම වරායන්වලට යාත්‍රා ඇතුල් කළ නොහැකිය. පානදුර හා හලාවත ධීවර වරායන්හි ක්‍රමවත් දිය කඩන නොයෙදීම නිසා වසරකට ධීවර ජීවිත ගණනාවක් මහ මුහුදට බිලිදීමට සිදුව ඇත. විශේෂයෙන්ම උතුරේ ගුරුනගර්, සිලාවතුර ධීවර වරාය එකී ධීවර ජනතාවට සිහිනයක් වී ඇත. උතුරේ ධීවර වරාය කෙසේ වෙතත් තොටුපළක්වත් සංවර්ධනය කර නොමැත. උතුරේ ධීවරයන් පවසන්නේ ආණ්ඩුව බීකන් පහනවත් ලබාදී නොමැති බවය. ඔවුන් තම තොටුපළ මුහුදු බාදනයෙන් වළක්වා ගන්නේ වැලි කොට්ට තැබීමෙනි. මහින්ද රාජපක්ෂ මහතාගේ දැයට කිරුළ නාඩගම වෙනුවෙන් 2013 වසරේ කෝටි 6000ක් වැය කළ අතර, මෙවරද එය ඉක්මවා යන මුදලක් වෙන්කර ඇත. නමුත් මෙම මුදලත් ධීවර වරාය, තොටුපළ සංවර්ධනය වෙනුවෙන් යොදවන්නේ නම් ඵලදායී දෙයක් මේ රටට සිදුකළ හැකිය.

ආණ්ඩුව පසුගිය කාලයේදී 'උතුරට වසන්තයක්' ගෙනා බවට තප්පුලෑවේය. නමුත් උතුරේ ධීවරයාට ලබාදුන් වසන්තයක් නැත. උතුරු මුහුදු තීරයේ ධීවර ජනතාවට ඉන්දීය ධීවර යාත්‍රාවලින් සිදුකරන හානි, ක්‍රමයෙන් වර්ධනය වී ඇත. ඔවුහු මෙරට මුහුදේ මත්ස්‍ය සම්පත කොල්ලකති; ධීවරයින්ට පහර දෙති; ධීවර යාත්‍රා, දැල් ආම්පන්න විනාශ කරති. දිනකට ඉන්දීය ධීවර යාත්‍රා 200-300ක් පමණ මෙරට ගොඩබිම ආසන්නයට පැමිණෙයි. උතුරේ ධීවරයාට සිදුවී ඇත්තේ ගොඩබිමට වී එදෙස බලා හීල්ලීමටය. පසුග ියදා බලයට පත්වූ ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතාගේ පදවි ප්‍රාප්තිය වෙනුවෙන් මෙරට අත්අඩංගුවේ පසුවූ ඉන්දීය ධීවරයින් සියලුදෙනා නිදහස් කිරීමට රාජපක්ෂ ජනාධිපතිවරයා පරිත්‍යාගශීලී විය. නමුත් ඉන්දියාවේ අත්අඩංගුවේ සිටින ශ්‍රී ලාංකික ධීවරයන් නිදහස් කර ගැනීමට ඔහුගේ හදවත උණු නොවීම බරපතළ ගැටලුවකි. මෙරට ආණ්ඩුව ඉන්දියාවට යටත් වෙමින් කරන මෙම දීන ක්‍රියාවලිය වහා නතර කළ යුතුය. දෙරට අතර රාජතාන්ත්‍රික මැදිහත් වීමකින් මේ සඳහා විසඳුමක් ලබා දිය යුතුය.

### කාලගුණයෙන් බැටකෑම

විශේෂයෙන් අප රටේ ධීවර ජනතාවට ස්වභාවික කාලගුණ විපර්යාසයන් පිළිබඳ පූර්ව දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් නොමැත. මේ හේතුවෙන් වාර්ෂිකව ධීවර ජීවිත ගණනාවක් මහමුහුදට බිලිවෙති. අවම තරමේ ජීවිත ආරක්ෂක කබායක්වත් ලබා දීමේ වැඩසටහන් ධීවර අමාත්‍යාංශයෙන් සිදුකර නොමැත. මේ රටේ නාස්තිය, දූෂණය, වංචාවට භාජනය වන මුදල ඉතා පහළය. නමුත් ධීවරයන්ට ජීවිත ආරක්ෂක කබායක් ලබාදීමට ආණ්ඩුව කටයුතු නොකර, ධීවර ඇමතිවරයා පසුගියදා ප්‍රකාශ කළේ, මේ රටේ ධීවර කර්මාන්තයන් විශාල ප්‍රගතියක් ලබාගෙන ඇති බවය. නමුත් ගෙවීගිය කාලය මෙරටට මත්ස්‍ය ආනයනය වැඩිවී ඇති අතර, මත්ස්‍ය අපනයන අඩුවී ඇති බව ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛනවලින් පැහැදිලි වේ. කරවල ආනයනයේදී අයකරන බදු ප්‍රමාණය අඩුවේ. ඒ ආවරණයෙන් මෙරටට මත්ස්‍ය ආනයනය සිදුකිරීම ජාවාරම්කාරයන් සිදු කරයි. මෙම ජාවාරම්කාර පැලැන්තිය ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා පොලිසිය, බන්ධනාගාර සඳහා මත්ස්‍ය බෙදාහැරීම සිදුකරයි. ආණ්ඩුව කළ යුත්තේ එකී අවස්ථාව මෙරට ධීවර ක්ෂේත්‍රයට ලබාදීමය. මෙරට මත්ස්‍ය අස්වැන්න සැපයිය හැක්කේ රෝහල්වලට පමණි. මෙහිදී ආණ්ඩුවේ බලධාරීන් ගසාකෑම නිසා ධීවර ප්‍රජාවට අත්කර දිය හැකි වාසි පවා ආණ්ඩුව අහිමිකර ඇත.

මේ වන විට ධීවර අමාත්‍යාංශය, විදේශීය යාත්‍රා මෙරට මුහුදේ මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීමට අවසර දී ඇත. විශේෂයෙන් චීන යාත්‍රා 40ක් පමණ මෙරට ධජය යටතේ ශ්‍රී ලංකා මුහුදේ මත්ස්‍ය සම්පත නෙලා ගැනීම මහා පරිමාණ ලෙස සිදු කරයි. මේ තුළින් ධීවර අමාත්‍යාංශයෙහි බලධාරීන්ට ලැබෙන කොමිස් මුදල සුළුපටු නොවේ. වත්මන් රාජපක්ෂ ආණ්ඩුව අද ශ්‍රී ලංකා මුහුදේ උතුරු කොටස ඉන්දියාවටත්, දකුණු කොටස චීනයටත් ලබාදී ඇත. මේ නිසා මේ රටේ සමස්ත ධීවර ප්‍රජාවට තම අයිතීන් රැකගැනීමටත් දිනාග ැනීමටත් සංවිධානය විය හැර අන් තෝරාගැනීමක් ඉතිරිවී නැත.

දේශපාලන ආර්ථික විද්‍යාව

# ප්‍රාග්ධන සංකේන්ද්‍රණය සහ ලාභය




අතිරික්ත වටිනාකම බිහිවීම ගැන මූලික අදහසක් මේ වන විට ඔබට ඇත. කර්මාන්තයේ, කෘෂිකර්මාන්තයේ සහ සියලුම ද්‍රව්‍යමය නිෂ්පාදන කර්මාන්තයන්හි නියැළෙන කම්කරුවන් විසින් අතිරික්ත වටිනාකම බිහි කරනු ලැබේ. නමුත් එය කර්මාන්තවල ආයෝජනය කරන ධනපතීන් විසින් පමණක් අත්පත් කර නොගනී. එය වෙළඳුන්, බැංකුකරුවන්, ප්‍රචාරකයින්, ඉඩම් හිමියන් ආදී විවිධ ධනපති කණ්ඩායම් අතර බෙදී යයි. එය ඉතා දැඩි තරගකාරී අරගලයකි. හේතුව හැමෝම ධනපතියන් වීමට ඇති ආශාවය. ධනේශ්වර සමාජයේ මුදල් දෙවියන්ය; මුදල් රජුය. මුදල් රුධිරයටද වඩා වටී. ලාභය බිහිකරන්නේ, මෙම ධනපතියාගේ අතිරික්ත ඉපැයීමේ ක්‍රියාවලිය තුළිනි. අතිරික්ත වටිනාකම නොමැතිව ලාභයක් බිහි කළ නොහැකිය.

සෑම ධනපතියෙකුම තම කර්මාන්තයේ නිෂ්පාදන අලෙවි කරයි. එම නිෂ්පාදන අලෙවියෙන් ඔහු ලබන ආදායමෙන් පළමුව තමාගේ වියදම් හෙවත් නිෂ්පාදන වියදම පියවා ගනී. මෙම පිරිවැයට නිෂ්පාදන මාධ්‍යය මිලදී ගැනීමට සහ කම්කරු ශ්‍රමයට වැටුප් ගෙවා ශ්‍රමය මිලදී ගැනීමට දැරූ වියදම ඇතුළත්ය. මෙය ධනපතියාට භාණ්ඩය නිපදවීමට ගිය පිරිවැය ලෙස හඳුන්වනු ලැබේ. නිෂ්පාදිතය අලෙවි කිරීමෙන් ලැබෙන මුළු ආදායම එය නිෂ්පාදනය කිරීමට වැයවූ මුළු වියදමට වඩා විශාලය. ලාභය යනු, මුළු නිෂ්පාදන පිරිවැය මුළු ආදායමෙන් අඩු කළ පසු ධනපතියාට ඉතිරිවන මුදලය. එනම්, මුළු ආදායම සහ පිරිවැය අතර වෙනසයි. මෙය ලාභයේ බාහිර පෙනුමයි.

## ලාභයේ හරය කුමක්ද?

මීට කලින් අවස්ථාවක සාකච්ඡා කළ පරිදි භාණ්ඩයක් (නිෂ්පාදනයක්) සඳහා පිරිවැය ප්‍රධාන කොටස් 3කින් සංයුක්තය.

(1) ස්ථාවර ප්‍රාග්ධනයේ වටිනාකම (C)
(2) විචල්‍ය ප්‍රාග්ධනයේ වටිනාකම (V)
(3) අතිරික්ත වටිනාකම (M)

හුවමාරු භාණ්ඩයක වටිනාකම T = C+V+M වශයෙන් ගණනය කළ හැකිය. පළමු කොටස් දෙක එකතු කළ විට නිෂ්පාදන පිරිවැය ලැබේ. (C+V), වටිනාකම සහ නිෂ්පාදන පිරිවැය අතර වෙනස T - (C+V) වේ. එසේම, T= (C+V+M) වන හෙයින් T- (C+V) = (C+V+M) - (C+V) = M වේ. මෙම ඉතිරිය M = අතිරික්ත වටිනාකම වේ.

මේ අනුව ලාභය යනු, අතිරික්ත වටිනාකමේ ස්වරූපයකි. භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රාග්ධනය නියෝජනය කරන නිෂ්පාදකයෝ, කර්මාන්ත හිමියෝ සහ වෙනත් ධනපතියෝ ලාභයේ ස්වරූපයෙන් අතිරික්ත වටිනාකම තමන් සතු කර ගනිති.

ලාභය, අතිරික්ත වටිනාකමේ ධනේශ්වර සූරාකෑමේ හරය වසන් කරයි. ධනපතියා ලාභය ගණින විට ආයෝජනය කරන ලද මුළු මුදල සමග ලාභය සංසන්දනය කරයි. නිෂ්පාදනය සඳහා ආයෝජනය කරන ලද මුළු ප්‍රාග්ධනයට අදාළ කොටසේ ලාභය ගණන් බැලීමෙන් ලාභය මුළු ප්‍රාග්ධනය (ආයෝජනය) විසින් ජනිත කරන්නේය යන වැරදි වැටහීමක් දිය හැකිය.

ලාභය ගැන එවැනි අර්ථ නිරූපනයක දී ස්ථාවර හා විචල්‍ය ප්‍රාග්ධනයේ වෙනස නොසලකා හරී. ඒ සියල්ල ප්‍රාග්ධනය ලෙස එක ගොඩකට දමා සිතීමට උගන්වයි. එහෙම එය අතිරික්ත වටිනාකම ලබා ගන්නා නියම මාර්ගය වසන් කරයි. **අතිරික්ත වටිනාකම ලාභයේ ස්වරූපයෙන් පෙනී සිටින විට, විචල්‍ය ප්‍රාග්ධනය විසින් නොව ආයෝජනය කරනු ලැබූ මුළු වටිනාකමින් බිහිකරනු ලැබූවක් ලෙස පෙනී යයි.**

## ලාභ අනුපාතිකය

ධනපතියාගේ අභිලාෂය කෙසේ හෝ තම ලාභ කොටස ඉහළ දමා ගැනීමය. ඔහුගේ ආයෝජනයේ ලාභ කොටස ගණනය කිරීමට ලාභ අනුපාතිකය යොදා ගනී. ආයෝජනය කරන ලද මුළු ප්‍රාග්ධනයට, ප්‍රතිලාභ අතිරික්ත වටිනාකමේ අනුපාතය ප්‍රතිශතයක් වශයෙන් ගණනය කිරීම මෙයින් සිදු කෙරේ.

$$P^1 = \frac{M}{K} x100 \quad - P^1 = \frac{\text{අතිරික්ත වටිනාකම}}{\text{ප්‍රාග්ධනය}} x100$$

$$P^1 = \frac{M}{C+V} x100 \quad - P^1 = \frac{\text{අතිරික්ත වටිනාකම}}{\text{ස්:ප්‍රාග්ධනය+වි: ප්‍රාග්ධනය}} x100$$

මෙහිදී P1 ලාභ අනුපාතකයයි. K යනු, ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයයි.

උදාහරණයක් මගින් මෙය පැහැදිලි කර ගන්නේ නම්, යොදන ලද මුළු ප්‍රාග්ධනය (K) රු:100,000/=යක් යැයි සිතමු. එය පිළිවෙළින් ස්ථාවර හා විචල්‍ය ප්‍රාග්ධනයට රු:85,000/=ක් සහ 15,000/=ක් වශයෙනි. මෙම ආයෝජනය විසින් රු:20,000/=ක අතිරික්ත වටිනාකමක් බිහි කරතැයි අපි උපකල්පනය කළහොත්, එවිට ලාභ අනුපාතය $\frac{20}{85+15}$ x 100 = 20% කි.

ධනේශ්වර ලාභ අනුපාතිකය තීරණය කරන්නේ, ප්‍රධාන සාධක කිහිපයක් විසිනි. ඉන් ප්‍රධාන සාධකය අතිරික්ත වටිනාකම් අනුපාතයයි. අතිරික්ත වටිනාකම අනුපාතය ඉහළ යත්ම ලාභ අනුපාතිකය වැඩි වේ. මෙම ඍජු සම්බන්ධයට හේතුව, අතිරික්ත වටිනාකම් අනුපාතිකයේ වැඩිවීමත්, අතිරික්ත වටිනාකමේ ස්කන්ධයේ වැඩි වීමකට බලපෑමත්, එය පෙරළා ලාභ අනුපාතිකය වැඩි කිරීමට බලපාන නිසාත්ය. එමනිසා අතිරික්ත වටිනාකම වැඩි කිරීමට දරන සියලු උත්සාහයන් ධනපතියාගේ ලාභ කොටස වැඩි කිරීමට ඍජුව දායක වේ.

ප්‍රාග්ධන සංයුතිය වෙනස්වීමද ලාභ අනුපාතිකය අඩු වැඩිවීමට බලපාන සාධකයකි. අතිරික්ත වටිනාකම මුළුමනින්ම විචල්‍ය ප්‍රාග්ධනය විසින් බිහිකරනු ලබන හෙයින්, මුළු ප්‍රාග්ධනයේ විචල්‍ය ප්‍රාග ්ධන කොටස (ශ්‍රම කොටස) වැඩිවෙත්ම ඊට අනුරූපීව අතිරික්ත වටිනාකමේ ස්කන්ධයේ වර්ධනයක් සිදුවන අතර, එමගින් ලාභ අනුපාතිකයන්ද වැඩිවේ. මෙයාකාරයෙන්ම, විචල්‍ය ප්‍රාග්ධනයේ කොටස අඩු වීමක් සිදුවුවහොත්, ලාභ අනුපාතිකය පහත හෙළයි.

ධනපතියා ආයෝජනය කරන ප්‍රාග්ධනයේ කොටසක් අඩුකර නිෂ්පාදන පිරිවැය අඩු කරන විට ද, ඊට අනුරූපීව ලාභ අනුපාතිකය වැඩිවෙයි.

## සාමාන්‍ය ලාභ අනුපාතිකය:

සෑම ධනපතියෙකුගේම අභිලාෂය ලාභ අනුපාතිකය වැඩිකර ගැනීම වන විට, ඔහු තම ප්‍රතිවාදියාට වඩා ලාභයේ තම කොටස වැඩිකර ගැනීමටද නිරතුරුව අපේක්ෂා කරයි. සමාන ප්‍රාග්ධනයක් යෙදවුවද, එහි විවිධ සංයුතීන් තිබේ. සමහර ව්‍යාපාරයන්හි විචල්‍ය ප්‍රාග්ධන කොටස වැඩිවේ. තවත් ව්‍යාපාරයන්හි ස්ථාවර ප්‍රාග්ධන කොටස වැඩිවේ. එමනිසා සමාන ප්‍රාග්ධනයක් යෙදුවද කර්මාන්තයේ ස්වභාවය අනුව ධනපතීහු විවිධ ලාභ ලබා ගනිති. ඒ නිසා සමාන ප්‍රාග්ධනයේද ලාභ අනුපාත වෙනස් වේ.

උදාහරණයකින් මේ තත්වය තවත් පැහැදිලි කර ගැනීම ප්‍රායෝගිකය. සපත්තු කම්හලක් සඳහා රු:100,000ක් ද, යන්ත්‍රෝපකරණ කම්හලකට රු: 100,000/=ක්ද ආයෝජනය කර ඇතැයි සිතමු. සපත්තු සඳහා ප්‍රාග්ධනයේ සංයුතිය, ස්ථාවර ප්‍රාග්ධනය රු:50,000/=ක් සහ විචල්‍ය ප්‍රාග්ධනය රු:50,000/=ක් වශයෙනි. යන්ත්‍රෝපකරණ කම්හලේ තාක්ෂණය උසස් නිසා ස්ථාවර ප්‍රාග්ධන කොටස විචල්‍ය කොටසට වඩා වැඩි වනු ඇත. එය ස්ථාවර ප්‍රාග්ධනය රු:90,000/=ක් ද, විචල්‍ය ප්‍රාග්ධනය කොටස රු:10,000/=ක්ද යැයි උපකල්පනය කරමු. තවත් සරල කර ගැනීම සඳහා මෙම කර්මාන්ත දෙකම වසරකින් අවසන්වී මුළු ප්‍රාග්ධනයේ වටිනාකම නිෂ්පාදනයට මාරු කරන්නේ යැයි උපකල්පනයක්ද කරමු. නිෂ්පාදන කර්මාන්ත දෙක සඳහාම මුළු පිරිවැය රු:100,000/=ක් බැගිනි. එක් එක් කර්මාන්තයට අතිරික්ත වටිනාකම අනුපාතිකය 100%ක් යැයි උපකල්පනය කළහොත්, සපත්තු කම්හල සඳහා රු:50,000/=ක වටිනාකමක් අතිරික්ත වටිනාකම ලෙස බිහි කරනු ඇත. එවිට එහි නිෂ්පාදිතයේ මුළු වටිනාකම රු:150,000/=ක් වනු ඇත.

$t_1$= C+V+M
$t_1$= 50,000+50,000+50,000
= 150,000

නමුත් යන්ත්‍රෝපකරණ කම්හල, රු:10,000/=ක අතිරික්ත වටිනාකමක් බිහිකරනු ලබන අතර, එහි නිෂ්පාදිතයේ වටිනාකම රු:110,000/=කට සමාන වනු ඇත.

$t_1$= C+V+M
$t_1$= 90,000+10,000+10,000
= 110,000

මෙහිදී සපත්තු කම්හල් හිමියාට 50%ක ලාභ අනුපාතයක් ලැබී ඇති අතර, යන්ත්‍රෝපකරණ හිමියාට ලැබී ඇත්තේ 10%ක ලාභ අනුපාතයකි.

සපත්තු කම්හල $p^1 = \frac{m}{c+v}$ x 100

සපත්තු කම්හල $p^1 = \frac{m}{c+v}$ x 100

$$p^1 \quad \frac{50}{50+50} x100 = 50\%$$

$$p^1 \quad \frac{10}{90+10} x100 = 10\%$$

සමාන ප්‍රාග්ධන වැය කිරීම් වුවත් අවසාන ප්‍රතිඵලය වෙනස් වී ඇත්තේ ලාභ උපයන, අතිරික්ත බිහිකරන ප්‍රාග්ධන සංයුතිය කර්මාන්ත දෙකෙහි එකිනෙකට වෙනස් වන නිසාය.

නමුත්, ධනපති වෙළඳපොළේ ඉහත උදාහරණයේ තත්වය හැමවිටම පවතින්නේ නැත. මක්නිසාද, යන්ත්‍රෝපකරණ කම්හල අයිතිකරු මේ තත්වයට එකඟ නොවන නිසාය. ඔහු යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය අඩුකොට එයින් නිදහස්වන ප්‍රාග්ධනය ලාභදායක පාවහන් කර්මාන්තයට මාරු කරනු ඇත. එවිට, යන්ත්‍රෝපකරණ සැපයුම පහත වැටෙන අතර, ඒවායේ අලෙවි මිල ගණන් ඉහළ නගිනු ඇත. යන්ත්‍ර මිල වටිනාකමේ මිලට වඩා වෙළඳපොළේදී ඉහළ යන්නේ ඒ නිසාය. භාණ්ඩයක මිලට වෙළඳ පොළ ඉල්ලුම-සැපයුම සම්බන්ධ වන්නේ එලෙසය. 15වැනි පිටුවට



"ඉතිහාසයේ නව නැම්මක් ඇතිවූ විට, ප්‍රගතිශීලී පක්ෂ පවා කලක් යන තෙක්, නව තත්වය අනුව හැඩගැසීමට නොහැකිව සිටි අවස්ථා බොහෝය. එවැනි අවස්ථාවල, එම පක්ෂ කලින් නිවැරදි වූ, එහෙත් දැන් අර්ථවත් භාවය සම්පූර්ණයෙන්ම ගිලිහුණු, එනම් ඉතිහාසයේ නව නැම්ම ක්ෂණික වූ තරමටම, ක්ෂණික ලෙස එම අර්ථය ගිලිහුණු, සටන්පාඨ ප්‍රතිරාවය යෙදවීමේ යෙදී ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05 වෙළුම**
**180 - පිටුව**



# වෘත්තීය අයිතීන් වෙනුවෙන් වැඩ කරන කාන්තාව සංවිධානය විය යුතුයි

*සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා*

## සමන්මලී ගුණසිංහ සහෝදරිය

පසුගිය ජූලි 23 -27 යන දිනවල ලෝක වෘත්තීය සමිති සම්මේලනය (WFTU) හා වියට්නාම් ජාතික කම්කරු සම්මේලනය (VGCL) එක්ව වියට්නාමයේ හැනෝයි නගරයේ පැවැත්වූ වැඩසටහනට අන්තර් සමාගම් සේවක සංගමය, සමාජවාදී කාන්තා සංගමය, අයිතීන් උදෙසා කාන්තාවෝ යන සංවිධාන නියෝජනය කරමින් සමන්මලී ගුණසිංහ සහෝදරිය සහභාගි වූවාය. සමන්මලී සහෝදරියගේ වියට්නාම් සංචාරය පිළිබඳ ඇය අදහස් නියමුවා වෙත දැක්වූවා.

**ප්‍රශ්නයඃ- ලෝක වෘත්තීය සමිති සම්මේලනය (WFTU) හා වියට්නාම් ජාතික කම්කරු සම්මේලනය (VGCL) එක්ව වියට්නාමයේ පැවැති වැඩසටහනට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ අයගෙන් ඔබත් එක් අයෙක්. එම වැඩසටහන කුමක් අරභයා පැවැති එකක්ද?**

**සමන්මලී සහෝදරියඃ-** අද දවසේ ලෝකයේ වැඩ කරන කාන්තාවන් මුහුණ පා ඇති ගැටලු රාශියක් තිබෙනවා. ඒ ගැටලු මොනවාද යන්න හඳුනා ගැනීමත් වෘත්තීය සමිති ඔස්සේ එම ගැටලු විසඳා ගැනීම සඳහා පුළුල් මැදිහත්වීමක අවශ්‍යතාවයක් මතුව තිබෙනවා. එම නිසා ලෝක වෘත්තීය සමිති සම්මේලනය හා වියට්නාම් ජාතික කම්කරු සම්මේලනය එක්ව ''වැඩ කරන කාන්තාව හා ඔවුන්ගේ වෘත්තීය සමිති භූමිකාව'' යන තේමාව යටතේ කම්කරු කාන්තාවන්ගේ ගැටලු වඩාත් ගැඹුරින් සාකච්ඡා කිරීම මෙහි අරමුණ වුණා. ඒ වගේම ඒ පිළිබඳ තීන්දු තීරණ වලට එළඹී-මත් එහිදී සිදුවුණා.

**ප්‍රශ්නයඃ- එයට සහභාගි වූ වෙනත් රටවල් ගැන සඳහන් කළොත්....**

**සමන්මලී සහෝදරියඃ-** ඒ වැඩසටහන සඳහා ලෝක වෘත්තීය සමිති සම්මේලනය නියෝජනය කරන ආසියා පැසිෆික් කලාපයේ රටවල් 17ක නියෝජිතයින් සහභාගි වුණා. වියට්නාමය, ඉන්දියාව, ශ්‍රී ලංකාව. නේපාලය, බංග්ලාදේශය, මැලේසියාව, පකිස්ථානය, ග්‍රීසිය, ප්‍රංශය, දකුණු කොරියාව, සිරියාව, කාම්බෝජය, ලාඕසය වැනි ආසියා පැසිෆික් කලාපයේ රටවලින් පැමිණි නියෝජිත-වරුන් හා නියෝජිත-වරියන් විසින් ඒ ඒ රටවල කම්කරු කාන්තාවන්ගේ තත්වය පිළිබඳව කරුණු ඉදිරිපත් කරනු ලැබුවා.




**ප්‍රශ්නයඃ- අපේ රටේ කම්කරු කාන්තාවන් පිළිබඳව ඔබ ඉදිරිපත් කළ වාර්තාවේ අඩංගු වූ ප්‍රධාන කරුණු මොනවාද?**

**සමන්මලී සහෝදරියඃ-** ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ලංකාවේ සාමාන්‍ය රැකියා වියුක්තිය 4.1%යි. ඒ අතර කාන්තා රැකියා වියුක්තිය 6.4%යි. ඇත්ත සංඛ්‍යාව මීට වඩා ගොඩක් වැඩි වුවත් මේ සංඛ්‍යාලේඛන වලින් පෙන්නුම් කරන්නේ කාන්තාවන්ගේ රැකියා වියුක්තිය පිරිමින්ගේ රැකියා වියුක්තියට වඩා ගොඩක් වැඩි බවයි. ඒ වගේම කාන්තාවන් හා පිරිමින් අතර වැටුප් විෂමතාවයත් වැඩියි.

එම තත්වය පිළිබඳවත් අපේ රටේ කම්කරු කාන්තාවන් විශේෂයෙන් වතු කම්කරු කාන්තාවන් මුහුණපාන වැටුප් විෂමතා ප්‍රශ්නයත්, ඇඟළුම් ක්ෂේත්‍රය තුළ විශාල වශයෙන් සිදුවන ශ්‍රම සූරාකෑමත්, හාම්පුතුන්ගෙන් හා බාහිර පරිසරයෙන් සිදුවන ලිංගික හිරිහැරත්, අඩු පහසුකම් යටතේ සේවය කිරීමට සිදුව තිබීමත්, විදෙස්ගත කම්කරු කාන්තාවන් මුහුණපාන අතවර, හිරිහැර සම්බන්ධයෙන් හා පෞද්ගලික අංශය තුළ ගැබිනි මව්වරුන්ට හා දරු ප්‍රසූතියේදී අවම පහසුකම් ලැබීම සම්බන්ධයෙනුත් මා කරුණු ඉදිරිපත් කළා.

**ප්‍රශ්නයඃ- වියට්නාමය රටක් ලෙස ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් අත්පත් කරගනිමින් සිටින රටක්. වියට්නාමයේ කම්කරු කාන්තාවන් පිළිබඳව එහිදී මතුවූ කරුණු සම්බන්ධව කෙටියෙන් පැවසුවොත්....**

**සමන්මලී සහෝදරියඃ-** වියට්නාමය සමාජවාදී රටක්. එහි කම්කරු කාන්තාවන් සියලුදෙනාම වසරක් පාසා සම්පූර්ණ සෞඛ්‍ය පරීක්ෂාවකට (Body Checkup) ලක් කරනවා. ගර්භනී සමය තුළ කම්කරු කාන්තාවන් ඊට අදාළ සියලුම පරීක්ෂාවන්ට ලක් කරනවා වගේම ඔවුන් රැකබලා ගැනීමද සිදුවෙනවා. ළදරුවන් රැකබලා ගැනීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන තවදුරටත් ව්‍යාප්ත කිරීමටත් වැටුප් විෂමතාවය 100%කින් අහෝසි කිරීමටත් ඔවුන් පියවර ගනිමින් සිටිනවා. වැඩ කරන කාන්තාවන්ගේ වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු කරමින් සිටින අතරම වියට්නාමයේ සියලුම කම්කරු කාන්තාවන් වියට්නාම් ජාතික කම්කරු සම්මේලනයේ (VGCL) සාමාජිකයන් ලෙස බඳවා ගැනීම හරහා ඔවුන්ගේ වෘත්තීය අයිතීන් සුරක්ෂිත කිරීමටත් පියවර ගනිමින් සිටිනවා.

**ප්‍රශ්නයඃ- එම වැඩසටහන තුළ එළැඹි තීරණ සැකෙවින් විස්තර කළොත්....**

**සමන්මලී සහෝදරියඃ-** කම්කරු කාන්තාවන් ශ්‍රම සූරාකෑමටත් විවිධ හිරිහැරවලටත් අඩු පහසුකම් යටතේ වෘත්තීය අයිතීන් පවා කප්පාදු කළ තත්වයන් යටතේ වැඩ කරනවා. කම්කරු කාන්තා ශ්‍රමය රටක වැදගත් තැනක් ගන්නවා. ඒ නිසා වෘත්තීය සමිති ක්‍රියාකාරිනියන් හා එහි නායිකාවන් බවට කම්කරු කාන්තාවන් පත් කළ යුතු බවටත් වෘත්තීය අයිතීන් දිනා ගැනීම සඳහා සංවිධානය විය යුතු බවටත් එහිදී තීරණය වුණා.

# සිව් දෙසින්

## දාශ්‍යමාන නොවූ කාන්තා ශ්‍රම බලකාය



මිලියන 160ක් වන ඉන්දියාවේ කාන්තා ජනගහනයෙන් වැඩ කළ හැකි වයස් කාණ්ඩවල (අවුරුදු 15-59ත් අතර) පසුවන 88%ක් පමණ කාන්තාවන් ඵලදායි සේවා අංශවල නියුතු වනවාට වඩා ගෙදර දොර වැඩ කටයුතු වල නියැලෙන බව පසුගිය ජූලි මාසයේ ඉන්දියාව නිකුත් කරන ලද ජනසංඛ්‍යාලේඛන දත්තවලින් පෙනී යයි.

2011 වසරේ ඉන්දියාවේ ජනසංගණනයට අනුව කාන්තාවන්ගේ සාක්ෂරතාව 65%ක් වන අතර පුරුෂයින්ගේ සාක්ෂරතාව 82%ක් වේ. මෙසේ සාක්ෂරතාව පහළ මට්ටමක පැවතීම ඉන්දියන් කාන්තාවන්ගේ විරැකියාවට ප්‍රබල හේතුවක්ව ඇති බව එරට විශ්ලේෂකයන් පවසයි.

## ලිංග ඡේදනය හා ළමා විවාහ අවසන් කිරීමට වහා පියවර ගත යුතුයි - යුනිසෙෆ්



ලෝකයේ ගැහැණු ළමුන් මිලියන ගණනකට බලපා ඇති සිරිත් දෙකක් වන ලිංග ඡේදනය හා ළමා විවාහ අවසන් කිරීමට වහා පියවර ගතයුතු බව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්) පෙන්වා දෙයි.

ඔවුන් නිකුත් කළ නවතම දත්තයන්ට අනුව මිලියන 130කට අධික ගැහැණු ළමුන් හා කාන්තාවන් මෙම ලිංග ඡේදන අත්දැකීමට මුහුණ පා ඇති බවත් අප්‍රිකානු හා මැද පෙරදිග රටවල් 29 ක මෙම පීඩාකාරී ක්‍රියාව සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති බවත් පෙන්වා දෙයි.

එසේම වර්තමානයේ ජීවත්වන මිලියන 700කට අධික කාන්තාවන් ඔවුන්ගේ ළමා වයසේදී විවාහ කර දී ඇති අය බවද ඉන් තිදෙනෙකුගෙන් එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් හෙවත් මිලියන 250ක් විවාහ වී ඇත්තේ වයස අවුරුදු 15ට පෙර බවත් එම වාර්තා පෙන්වා දෙයි.

# කාන්තා විමුක්තිය ගැන එංගල්ස්

"පවුල තුළ ශ්‍රම විභජනය විසින් ස්ත්‍රිය හා පුරුෂයා අතර දේපළ බෙදීම විධිමත් කෙරිණි. මේ ශ්‍රම විභජනය නොවෙනස්ව එසේම පැවතිණි. එහෙත් පවුලට පිටතින් ඇති ශ්‍රම විභජනය වෙනස් වූ නිසා පැරණි ගෘහමය සබඳතාවය උඩුයටිකුරු කොට පෙරළා දමන ලදී. ගෘහය තුළ ස්ත්‍රිය ආධිපත්‍යය දැරූ ඒ ගෘහමය වැඩවලට සීමා වීම නිසාම දැන් ගෘහය තුළ පුරුෂයාට ආධිපත්‍යය පැවරිණි. ජීවිකාව කර ගෙන යාම සඳහා පුරුෂයා කරන වැඩ සමග සසඳා බලන විට, ස්ත්‍රියගේ ගෙදර වැඩ වැදගත්කමින් තොර විය. ජීවිකාව කරගැනීම අතිශයින්ම වැදගත් වූ අතර ගෙදර වැඩ කිරීම එතරම් වැදගත් කටයුත්තක් නොවීය. සමාජමය වශයෙන් ඵලදායි වැඩවලින් ස්ත්‍රිය ඈත් කර තිබෙන තුරු, පෞද්ගලික වන ගෙදර වැඩවලට පමණක් ඇය සීමා කර තිබෙන තුරු ස්ත්‍රියගේ විමුක්තිය හා ස්ත්‍රී පුරුෂ සමානත්වය ලබාගත නොහැකිවා පමණක් නොව එය එම තත්වයේම පවතිනු ඇත. විශාල සමාජමය පරිමාණයක් මත නිෂ්පාදනයට සහභාගිවීමට හැකි වූදාට, ඉතාම අඩු කාලයක් යොදා ගෙදර වැඩ කිරීමට හැකිවූදාට ස්ත්‍රියගේ විමුක්තිය ලබාගත හැකිවනු ඇත. විශාල වශයෙන් ස්ත්‍රීන්ට සහභාගිවීමට අවස්ථාව සලසනවා පමණක් නොව, ඇත්ත වශයෙන්ම එසේ කිරීමට කැඳවන්නා වූද, යටත් පිරිසෙයින් පෞද්ගලික ගෙදර වැඩ පවා ප්‍රසිද්ධ කර්මාන්තයක් බවට පෙරළීමට වැර දරන්නා වූද සමකාලීන විශාල පරිමාණ කර්මාන්තයෙන් පමණකි, මෙය කළ හැක්කේ."

*ෆ්‍රෙඩ්රික් එංගල්ස්*
*-පවුල, පෞද්ගලික දේපළ හා රජය ඇති වූ සැටි කෘතියෙන්*

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

ජුනි 05 වැනි දින

# රේගු එතනෝල් අඩු මිලට විකුණන්නේ සමුපකාරය ශක්තිමත් කරන්නද?



පාර්ලිමේන්තු මන්ත්‍රී
**විජිත හේරත් සහෝදරයා**
(කල්තැබීමේ විවාදයට සහභාගි වෙමින්)

අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන මර්මස්ථාන තුනක් තිබෙනවා. ආදායම් බදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා සුරාබදු දෙපාර්තමේන්තුව. ඒවා තමයි ආර්ථිකය මෙහෙයවන ප්‍රධාන එන්ජිම. එතකොට ඒ එන්ජිම ශක්තිමත් වුණොත් තමයි ආර්ථිකය ශක්තිමත් කරගන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා රජයක් විදිහට මැදිහත් වෙනවා නම්, ඒ ආයතනවල නිලධාරීන්ට, සේවකයන්ට, තමන්ගේ වෘත්තිය ආත්ම තෘප්තියෙන් කරගෙන යන්නට පුළුවන් වටපිටාවක් හදන්නට ඕනෑ. එම නිසා තිබෙන සීමාවන්, බාධාවන් ඉවත් කිරීම කාලෝචිතව යහපත්ය කියා අප දකිනවා. නමුත් අද මේ ආණ්ඩුව කොයිතරම් කතා කළත් මේ ආයතන තුන පත්වෙලා තිබෙන තත්වය ගත්තොත් ඉතාම ඛේදනීයයි; ඉතාම කණගාටුදායකයි. මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමැතිතුමා පැහැදිලි කරල කිවුවා, ශ්‍රී ලංකා රේගුව පිළිබඳ පැහැදීමකට පත්වෙනවාය, සතුටු වෙනවාය කියලා. නමුත් මේ ශ්‍රී ලංකා රේගුවෙන්ම තමයි පසුගිය කාලයේ විශාල ආන්දෝලනාත්මක සිදුවීම් කීපයක් සිද්ධ වුණේ.

එතනෝල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවට තිබෙන්නේ ඉතිහාසගත නමක්. මොකද, හැමදාම හොර ස්ප්‍රීතු අල්ලනවා. ඒවාගේම ඒවා හොර පාරෙන් එළියට එනවා. ඒවා අල්ලද්දීත් ඒ කරන මෙහෙයුම් පිටුපස මහා ජාවාරම් ක්‍රියාත්මක වෙනවා. එමනිසා මම කැමතියි, ඒ පිළිබඳවත් යම් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න.

ගිය අවුරුද්දේ 2013 මාර්තු මාසයේ රුපියල් කෝටි 04ක් වටිනා එතනෝල් ලීටර් 65,100ක් අඩංගු කන්ටේනර් 02ක් අත්අඩංගුවට ගත්තා. ඇත්තටම ඒ අත්අඩංගුවට ගැනීම සිද්ධ වුණේ මහා මෙහෙයුමක් ඇතුළේයි. ශ්‍රී ලංකා රේගුවේත්, ඒවාගේම සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේත් මැදිහත් වීමක් තුළ තමයි ඒ මෙහෙයුම් සිද්ධ වුණේ. ඒ මෙහෙයුම සිද්ධ වුණාට පස්සේ ඒ කන්ටේනර් දෙක අත්අඩංගුවට ගත්තා. එහිදී එතනෝල් ලීටර් 65,100ක් අත්අඩංගුවට ගනු ලැබුවා. ඒ පිළිබඳව ශ්‍රී ලංකා රේගුවේ පරීක්ෂණයක් පැවැත්වූවා.

ඇත්තටම ගත්තොත් අද ඉතාම කණගාටුදායක තත්වයක් ඇති වෙලා තියෙනවා. ඒ පරීක්ෂණය සිදුකරන්න මූලික වුණු වත්සලා නානායක්කාර රේගු නිලධාරියා හදිසියේම ත්‍රිකුණාමලයට මාරුකරලා තිබෙනවා. ඔන්න තත්වය. දැන් ඇමැතිතුමා කියනවා, "අපි ශ්‍රී ලංකා රේගුවේ පරීක්ෂණ කටයුතු කරන්න උපරිම මැදිහත් වෙනවා. හොර ස්ප්‍රීතු අල්ලන නිලධාරීන්ට අවශ්‍ය කරන පහසුකම් දෙනවා. ඔවුන්ව දිරිගන්වනවා."යි කියලා. හැබැයි දිරිගන්වනවා කෙසේ වෙතත් අන්තිමට කරලා තිබෙන්නේ ඒ මෙහෙයුමට සම්බන්ධ වුණු, ඒ පරීක්ෂණයට සම්බන්ධ වුණු වත්සලා නානායක්කාර කියන ප්‍රධාන නිලධාරියා වහාම ත්‍රිකුණාමයලට ස්ථාන මාරුකරලා තිබෙන එකයි.

> ඇත්තටම බැලුවොත් ඒවා එන්න තිබුණොත් එතනටම තමයි. මුලදීම බඩු ගෙනාවෙත් ඒ සමාගමට තමයි. ගෙන්වූ පුද්ගලයෝ දෙන්නා විදිහට ජයලත් පීරිසුයි ශසිදරනුයි තමයි මාට්ටු වුණේ. එත් බඩු ගෙනාවේ අහවලාට. අවසානයේ දී අවුරුදු එකහමාරකට පස්සෙ ඒ පුද්ගලයාම බඩුටික ගන්නවා. ගන්නේත් කුණු කොල්ලයට. මේක තමයි අද රේගුව හරහා වන ජාවාරම.

මේකද දෙන ආදර්ශය? රේගුව නිවැරදි කරන්න ක්‍රියාත්මක කරන්නාවූ ප්‍රතිකර්මය මේකද? මේක තමයි ඒ ස්ප්‍රීතු ඇල්ලුවාට, ඇල්ලීම පිළිබඳ පරීක්ෂණය පැවැත්වූවාට නිලධාරීන්ට දෙන දඬුවම. එය ඉතා පැහැදිලියි. එතකොට කොහොමද මේ නිලධාරීන් මීට පස්සෙ එවැනි කටයුත්තකට සම්බන්ධ වෙන්නේ.? මේ ස්ථාන මාරු කිරීම නිසා අනික් නිලධාරීනුත් අධෛර්යයට පත්වෙනවා. මේ පරීක්ෂණය නිසා එළිදරව් වුණු කරුණුවලට අනුව රජයට ලැබිය යුතු මුදල් ලක්ෂ ගණනක මුදලක් ඇත්තටම රජයට අහිමි වුණා. රටට අහිමි වුණා. එක බැරල් එකක ස්ප්‍රීතු ලීටර් 200ක් අඩංගු වෙනවා. ඒවාගේ බැරල් 80ක් එක කන්ටේනරයක තිබෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත් මෙම ස්ප්‍රීතු ලීටර් එකක වෙළඳ පොළ වටිනාකම රුපියල් 2000යි. එහෙම ගත්තොත් එක කන්ටේර් එකකින් ලැබිය යුතු මුදල රුපියල් ලක්ෂ 320යි. ඇත්තටම ගත්තොත් මේ අත්අඩංගුවට ගත් එක කන්ටේනරයකින් ලැබිය යුතු ප්‍රමාණයයි ඒ. නමුත්, ඒ වාගේ කන්ටේනර් 02ක් තිබෙනවා. එතකොට කන්ටේනර් දෙකම ගත්තොත් ඇත්තටම රුපියල් ලක්ෂ 640ක් ලැබිය යුතුව තිබුණා. අද මොකද කරල තිබෙන්නේ ?

අල්ලපු ස්ප්‍රීතු ටික දැන් ලීටර් එකක් රුපියල් 103ගණනේ ටෙන්ඩර් දාලා විකුණනවා. පොල් අරක්කු බෝතලයක් කීයද? ගල් අරක්කු බෝතලයක් කීයද? ඒ ගල් අරක්කු බෝතලයක්, පොල් අරක්කු බෝතලයක් සාමාන්‍යයෙන් රුපියල් 850/=යි 950/=යි. ස්ප්‍රීතු ලීටරයක් කොහොම ද රුපියල් 103කට විකුණන්නේ. කවුද මේ මිල තීරණය කළේ. කවුද රේගු නිලධාරීන්ට ඒ මිලට ටෙන්ඩර් දාන්න අනුබල දුන්නේ. මුදල් විෂය භාර නියෝජ්‍ය ඇමැතිතුමා දැන් ඒකට උත්තර දෙන්න නැහැ.

ස්ප්‍රීතු ලීටරයක් රුපියල් 103/=ට දෙන්නේ අපේ රටේ සමුපකාරය ශක්තිමත් කරන්නද? ඒ ලාභයෙන් මේ රටේ පාරිභෝගිකයන්ට අඩු මිලට හාල්, කිරිපිටි, සීනි විකුණන්නද? ඒකතමයි අපි සොයන්න ඕනෑ.

හරි පැහැදිලිව ජාවාරම් හෙළිදරව් වෙනවා. නීති ගරුකව වැඩකරන නිලධාරීන්ට ත්‍රිකුණාමලයට මාරුවීමට සිදුවෙනවා. "මේ වගේ දේවල් අත්අඩංගුවට ගන්න ගියාම අපටත් Transfers හම්බ වෙනවා." කියලා අනෙක් නිලධාරීන් අධෛර්යවත් වෙනවා. අන්තිමට කොහෙවත් තිබෙන Wayamba Distilleries Lanka (Pvt) Limited එකට ස්ප්‍රීතු ටික එනවා. ඇත්තටම බැලුවොත් ඒවා එන්න තිබුණෙත් එතනටම තමයි. මුලදීම බඩු ගෙනාවෙත් ඒ සමාගමට තමයි. ගෙන්වූ පුද්ගලයෝ දෙන්නා විදිහට ජයලත් පීරිසුයි ශසිදරනුයි තමයි මාට්ටු වුණේ. එත් බඩු ගෙනාවේ අහවලාට. අවසානයේ දී අවුරුදු එකහමාරකට පස්සෙ ඒ පුද්ගලයාම බඩුටික ගන්නවා. ගන්නේත් කුණු කොල්ලයට. මේක තමයි අද රේගුව හරහා වන ජාවාරම.

රුපියල් ලක්ෂ දහසයහමාරයි. දැන් හම්බ වෙන්නේ. හරි විදිහට ගත්තොත් රුපියල් ලක්ෂ 640ක් හම්බ වෙන්න ඕනෑ. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 623කුයි රුපියල් පනස්දාහක් ආණ්ඩුවට පාඩුයි. රජයට පාඩුයි. රටට පාඩුයි. මේක තමයි හොර එතනෝල් ජාවාරම සහ හොර එතනෝල් ටෙන්ඩර් මගඩිය. මෙතන හොර එතනෝල් ජාවාරමකුත් තිබුණා. හොර එතනෝල් ටෙන්ඩරයකුත් තිබුණා. අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මාධ්‍යවලට කියල තිබුණා, මේ ආණ්ඩුවෙ තවත් එතනෝල් සහ කුඩු ජාවාරම්කාරයෝ ඉන්නවා කියලා. මම දැනගන්න කැමති මේ ආණ්ඩුවේ ඉන්න එතනෝල් ජාවාරම් කාරයෝ, කුඩු ජාවාරම්කාරයෝ කවුද කියලා.

ජුනි 04 වැනි දින

# නීති කඩන්න අවසර දෙන දේශපාලන බලය නැවැත්විය යුතුයි



පාර්ලිමේන්තු මන්ත්‍රී
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**
(ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය පනත නියෝග පිළිබඳ විවාදයට එක්වෙමින්)

මේ මොහොත වන කොටත් ඉන්දියානු ධීවර යාත්‍රා ලංකාවේ ධීවර කලාපයට ඇවිල්ලා ඉතා දැවැන්ත විධියට අපේ මත්ස්‍ය කර්මාන්තය විනාශ කරමින් ඉන්නවා. ඒක උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉතා බරපතළ විධියට සිද්ධ වනවා. අපට තේරෙන්නේ නැත්තේ මේකයි. ඉන්දියානු රජය දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න කියලා අපට බල කරන අතර ඉන්දියාවේ ධීවරයෝ ලංකාවට ඇවිල්ලා අපේ ධීවර කර්මාන්තය ඩැහැ ගෙන යන එකට කට පියා ගෙන ඉන්න එකයි.

ඉන්දියාවේ ධීවරයා ඇවිල්ලා ඉන්දියාවේ බෝට්ටු, ඩිංගි බෝට්ටු ඇවිල්ලා සතියකට දින පහක් ලංකාවේ ධීවර කර්මාන්තයට භාවිත නොකළ යුතු සියලුම පන්න ක්‍රම පාවිච්චි කරනවා. තහනම් සියලුම පන්න ක්‍රම පාවිච්චි කරනවා. ඒවා තහනම් වෙලා තිබෙන්නේ අපේ ධීවරයන්ට විතරයි. ඉන්දියාවේ ධීවරයා ලංකාවේ ධීවර කලාපය ඇතුළේ ඒ සියලු ක්‍රම පාවිච්චි කරනවා.

ගිය සතියේ මන්නාරමේ වන්කාලෙයි ප්‍රදේශයේ යාත්‍රා 15ක දැල් කැපුවා. ඒ අය ඇවිල්ලා අපේ කලාපයේ ධීවරයාගේ මාළු ටික අල්ලගෙන යනවා විතරක් නොවෙයි. අපේ ධීවරයට හෙට දවසේ ජීවත් වන්න තිබෙන දැලුත් කපලා යනවා. ඒ දැල් කැපුවාට පස්සේ රුපියල් ලක්ෂ 15ක් විතර පාඩු වුණා. වන්කාලෙයි ප්‍රදේශයේ යාත්‍රා 15ක දැල් කැපුවා. උප්පුවේලි ධීවරයන්ගේ රුපියල් ලක්ෂ 05ක් ක් විතර වටිනා දැල් කපා දමා ගියා. ඒ අය මාළු ටික විනාශ කරනවා විතරක් නොවෙයි තහනම් පන්න ක්‍රම පාවිච්චි කරලා මාළු ටික විනාශ කරනවා විතරක් නොවෙයි. ලංකාවේ ධීවරයාට ජීවත් වන්න තිබෙන ජීවන මාර්ගයත් නැති කරලා තමයි ඉන්දියාවේ බෝට්ටු ලංකාවේ ධීවර කලාපය ආක්‍රමණය කරන්නේ. ආක්‍රමණය කරලා දැල් කපාගෙන යනවා.

ඇත්තටම මේ ප්‍රශ්නයට අද වන කොට අවශ්‍ය වන්නේ රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීමක්. ඒ රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීම කියලා කියන්නේ සාධාරණ මැදිහත් වීමක්. ඉන්දියාවට හොඳ හිත පෙන්නාගන්න මෙහේ සිටින සියලු ඉන්දියානු ධීවරයන් නිදහස් කරලා විතරක් හරි යන්නේ නැහැ. රජය හැටියට රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීමක් මීට වඩා ප්‍රමාණවත් පරිදි සිද්ධ වන්න ඕනෑ කියන එක තමයි අප අවධාරණය කරන්නේ. ඒ නිසා අපි විශේෂයෙන් කියනවා, ධීවර අමාත්‍යතුමා විතරක් නොව මේ ආණ්ඩුවත් මේ රජයත් මැදිහත් වෙන්න ඕනෑ කියා. මේ වෙන කොට ඉන්දියානු අත්අඩංගුවේ සිටින අපේ ධීවරයන් වහා නිදහස් කරන්න කියන බල කිරීම ඉල්ලීම කරන්න. ඒ සම්බන්ධයෙන් ඉන්දියානු රජයත් එක්ක නිශ්චිතව සාකච්ඡා කරන්න.

> "කර්මාන්ත ශාලාවලින් පිටවන අපද්‍රව්‍ය, කැළි කසළ, රසායනික ද්‍රව්‍ය ඇතුළු සියලු කුණු කන්දල් ඒ කළපුවට පිටකරන්න දීපු අවසරය නිසා අද විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඇත්තටම ඒකෙන් පීඩාවට පත්වෙලා සිටින්නේ, ඒ කළපුවෙන් ජීවත් වෙන දහස් ගණනක ධීවර පවුල්."

පුත්තලම කළපුව ආශ්‍රිතව අදත් උද්ඝෝෂණයක් තිබෙනවා. නොරොච්චෝලේ ඉඳලා අනුරාධපුරයට යන අධිබල විදුලි රැහැන් පද්ධතියක් අදින්න යෝජනාවක් තිබෙනවා. ඒ අධිබලැති විදුලි රැහැන් පද්ධතිය අදින්නේ පුත්තලම ධීවර කළපුව හරහා සමහර දූපත්වල ඒ යසටය tension කුලුනු සවි කරනවා. එතකොට මේ විදුලි රැහැන් පද්ධතිය යන්නේ ධීවර කර්මාන්තයේ යෙදෙන, ධීවරයන් ඉන්න මුහුදු ජලය තිබෙන ඒ ජල පද්ධතියට උඩින්. අද ඒ ධීවරයාට ඒකෙන් අනතුරුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ඒ ප්‍රදේශයේ ධීවර ජනතාව පෙන්වලා දෙනවා, ඒ විදුලි රැහැන් කළපුව හරහා ඇදලා ධීවර ජනතාවගේ ජීවිත අවදානමකට ලක්කරන්නේ නැතිව ගොඩබිමින් අදින්න කියලා. එහෙම යන්න පාරක් තිබෙනවා. එහෙම යන්න පාරක් තිබෙන නිසා කළපුවට මැදින් අදින්න එපා කියලා ඒ ධීවර ජනතාව කියනවා. ඒ කළපුව මැදින් ඒ ගෙනයන අධිබල විදුලි පද්ධතිය ඒ ධීවර ජනතාවට බරපතළ ගැටලුවක් ඇති කරලා තියෙනවා.

ඒ විතරක් නොවෙයි එහි තිබෙන අනවසර ඉදිකිරීම් නිසා, ඒවාගේම විවිධ කර්මාන්තශාලාවලින් පිටවන අපද්‍රව්‍ය, කැළි කසළ, රසායනික ද්‍රව්‍ය ඇතුළු සියලු කුණු කන්දල් ඒ කළපුවට පිටකරන්න දීපු අවසරය නිසා අද විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඇත්තටම ඒකෙන් පීඩාවට පත්වෙලා සිටින්නේ, ඒ කළපුවෙන් ජීවත් වෙන දහස් ගණනක ධීවර පවුල්. අද මීගමු කළපුවක් නැති මට්ටමට පත්කරලා තිබෙනවා. ඒකෙ සම්පූර්ණ වගකීම තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි ධීවර අමාත්‍යාංශයට, ධීවර ඇමතිතුමාට. කැළිකසල දාලා, අපද්‍රව්‍ය දාලා, කර්මාන්ත ශාලාවලින් පිටකරන දේවල් දාලා අනවශ්‍ය ඉදිකිරීම් කරලා මීගමු කළපුවට කර තිබෙන විනාශය නිසා අද ධීවර ජනතාවට මීගමු කළපුව අහිමිකරලා තිබෙනවා. නීත්‍යානුකූල නොවන විධියට කර්මාන්තශාලා හදන්න, නිත්‍යානුකූල නොවන විදියට අනවසර ඉදිකිරීම් කරන්න, නිත්‍යානුකූල නොවන විදියට කැළි කසළ දාන්න ඒ සියලු අවසරය යටින් දෙන්නෙත් මේ කට්ටියම තමයි. අවසර දෙන්නේ නැහැ කියලා නීති හදනවා. හැබැයි නීති හමස් පෙට්ටියේ. අනික් පැත්තෙන් ඒ බලය අරගෙන දේශපාලන බල අධිකාරිය ඒ කටයුතු කරනවා. දේශපාලන හයිය නැතිව කවුරුත් එතන මුකුත් කරන්නේ නැහැ. එතන සියලු අනවසර ඉදිකිරීම් කරන්නේ, සියලු කර්මාන්ත කරන්නේ දේශපාලන හයිය ඇතිව තමයි. ඒ නිසා ඒ අවසරය දෙන එක තමයි නවත්වන්න ඕනෑ. තිබෙන මීගමු කළපුව ආරක්ෂා කරගන්න නීති ප්‍රමාණවත්. ඒ නිසා ඒ නීති කඩන්න අවසර දෙන දේශපාලන බලය තමයි නවත්වන්න ඕනෑකම තිබෙන්නේ.

## කවුළුව හැර තබමි

# රම්පෝසා ඇවිත් ගියෝ!



අපේ රටේ මානව හිමිකම් ගැන බලන්නට, ජාතික ගාටලුවට මැදිහත් වන්නට විවිධ කාලවල විවිධ පුද්ගලයෝ විවිධ රටවලින් ආවෝය; ගියෝය. මෑතදීම ආවේ දකුණු අප්‍රිකානු උප ජනාධිපති රම්පෝසාය. ඔහු ආවේ ක්‍රිකට් මැච් එකබලා ජනාධිපතිවරයාගෙන් තේ එකක් බී යාමට නම් එය ගණන් ගත යුතු ප්‍රශ්නයක් නොවේ යැයි මහා දේශප්‍රේමී, දේශපුත්‍ර විමල් මහතා ප්‍රකාශයක්ද කළේය.

රම්පෝසාගේ ලංකාගමනයේ ඇත්ත වසන් කිරීමට ආණ්ඩුවේ ගිරා පෝතකයෝ විහිළු කතා ගණනාවක්ම කීවෝය. එහෙත් රම්පෝසා ඇවිත් නිසි පරිදි මානව හිමිකම් රකින ලෙසත් විශේෂයෙන් දෙමළ ජනතාවගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් නිසි ලෙස මැදිහත්වීමක් කරන ලෙසත් ආණ්ඩුවට තර්ජනාත්මක අවවාදයක්ද දුන්නේය. තවදුරටත් ඔහු දෙමළ ජාතික සන්ධානය හා උතුරේ මහ ඇමති විග්නේෂ්වරන් මහතාද හමුවී සාකච්ඡා කළ බව වාර්තා විය. එහි කරුණු අදටද රහසිගතය.

ලබන මාර්තුවේ ජිනීවාවලදී සාකච්ඡාවට ගන්නා ලංකාවේ මානව හිමිකම් ප්‍රශ්නය ගැන ආණ්ඩුව දැන් ඉන්නේ දෙකොණ පටලවාගෙ නය. ඉතින් රාජපක්ෂ ජනාධිපතිවරයා සහ ආණ්ඩුව බේරා ගැනීම සඳහා ජනාධිපතිවරයා ඇතුළු බලධාරීහු ලොව පුරා රාජ්‍ය නායකයින් සහ විවිධ පුද්ගලයින් පසුපස බඩගාමින් සිටිති. ආණ්ඩුවේ මේ දණගෑම පාවිච්චියට ගන්නා විදෙස් බලවතුන් දැන් කරමින් සිටින්නේ ජිනීවා සමුළුව පෙන්න පෙන්නා රටෙන් විවිධ කප්පම් ගැනීමය. තමාගේ පැවැත්ම සඳහා ඕනෑම කප්පමක් දීමට සූදානම් බව ජනාධිපතිවරයාගේ හැසිරීම විසින් මේ වන විට තහවුරු කර අවසානය. ඉතින් රම්පෝසලා එන්නේ නිකම්ම නොවේ; බොරදියේ මාළු බෑමටය. ඔවුන්ට අවශ්‍ය පරිදි දිය බොර කර දීමේ කටයුත්ත ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුව දැන් කදිමට කරමින් සිටී. අවසානයේ දියේ ගිලී මැරෙන්නේ මේ රටේ ජනතාව බව සිහියට ගැනීම කාටත් ඇඟට හොඳය. එහිදී මේ රට විවිධ කොල්ලකරුවන්ට කැමති පරිදි පානය කිරීම සඳහා කැපවූ කැඳ හැලියක් කිරීමට පාලකයන් දරන උත්සාහය පරාජය කිරීමද රටේ ජනතාවගේ සහ සැබෑ සමාජ ව්‍යාපාරයක වගකීම වන්නේය.

# අරුම පුදුම මැජික් දණ්ඩ - කරවයි රට අන්ද මන්ද



තනිකරම ආණ්ඩුවේ හොරණෑවක් වූ පත්තරයක අපූරු පුවතක් පසුගියදා පළවී තිබුණි. ඒ නම් ජනාධිපතිවරයා සහ බැසිල් රාජපක්ෂ ඇමතිවරයා මැදිහත් වී බදුල්ලේ ජනතා ප්‍රශ්න 50,000ක් දින කීපයක් තුළ විසඳා අවසන් කළ බවය. විශ්වකර්ම ආශ්චර්යමත් පාලකයින් සිටිනා රටේ මෙයත් මහ දෙයක්දැයි කෙනෙකුට සිතිය හැක.

මේ අනුව ගත් විට ජනාධිපතිවරයා සහ බැසිල් රාජපක්ෂ ඇමතිවරයා මේ ලෙසට රට පුරා හැම ආසනයකටම ගියේ නම් මාසයක් දෙකක් ඇතුළත මුළු රටේම ප්‍රශ්න විසඳී යනු ඇත. දින කීපයක් ඇතුළත් බදුල්ලේ පමණක් ප්‍රශ්න 50,000ක් විසඳුවේනම් එතුමන්ලාට එයත් මහ කජ්ජක් නොවේ. මැතිවරණයක් ආසන්න වන විට මේ රටේ පාලකයෝ මෙවැනි විජ්ජා ඕනතරම් පෙන්වති. ඒ නිසා හැමදාම මැතිවරණ තිබේ නම් හොඳ යැයි ජනතාවට සිතිවිල්ලක් පහළ විය හැකිය.

රටේ ජනගහනය මේ වන විට කෝටි 02කට මදක් වැඩිය. අර ප්‍රශ්න විසඳන මැජික් පොලු 02ත් අරගෙන ජනාධිපතිවරයා සහ බැසිල් ඇමතිවරයා දින 45ක් රටපුරා ඇවිද්දේනම් දෙකෝටියක් ජනතාවගේ සියලු ප්‍රශ්න විසඳේ. ඉන්පසු රටේ කිසිදු ප්‍රශ්නයක් ඉතිරි විය නොහැක.

කෙසේ වුවද අපටනම් ප්‍රශ්නය වී තිබෙන්නේ මේ රටේ මිනිසුන් මේ මැජික් 'පොලු'කාරයන්ට තවදුරටත් රැවටීමය. අනෙක් අතට රටේ එලෝ කෝටියක් ප්‍රශ්න තිබියදී සහ ඒවා විසඳීමේ විශ්වකර්ම හැකියාව ඇති පාලකයන් මෙපමණ සිටිත්දීත් අවුරුදු 60කටත් වඩා වැඩි කාලයක් රටේ ප්‍රශ්න මෙච්චර ගොඩ ගැසීමට ඉඩ දී බලා සිටියේ ඇයිද යන්නත් ප්‍රශ්නයකි. එක්කෝ ජනතාවට ප්‍රශ්න ඕනෑකර තිබේ. නැතිනම් රටේ සිටින්නේ, ප්‍රශ්න නැතිව නිදාගැනීමට නොහැකි ජනතාවකි. එවිට පාලකයෝ ජනතාවට මෙසේ කියති. "බලාපල්ල පැයෙන් දෙකෙන් දවසෙන් දෙකෙන් උඹලගේ ප්‍රශ්න විසඳන්න අපට පුළුවන්. උඹලට ඕනකමක් නැනේ. ඒ නිසා අපටත් ඕනකමක් නැහැ."

ඉතින් ජනතාව තේරුම් ගත යුතුව ඇත්තේ තමන් දිය යුතු පිළිතුර කුමක්ද යන්නය.

# සමානත්වයේ තෝතැන්න



මේ දිනවල ඌවේ පළාත් සභා මැතිවරණයට අදාලව පූර්ව ප්‍රචාරක කටයුතුවල හැම පක්ෂයක්ම නියැලී සිටී. මෙහිදී ඌව ජ.වි.පෙ. කණ්ඩායම් නායක සමන්ත විද්‍යාරත්න සහෝදරයා පිළිගැනීම සඳහා ප්‍රදේශවාසීන් සංවිධානය කරන ලද සුහද හමුවක් සඳහා ඔහුගේ ඥාතීහු සහ අසල්වාසීහු විශාල පිරිසක් එක්ව සිටියහ. ඒ, පක්ෂ පාට භේදයකින් තොරවය. එහිදී සමන්ත විද්‍යාරත්න සහෝදරයා තම ජීවිතය ගැන කරන ලද සංවේදී හෙළිදරව් කිරීම් බොහෝ දෙනෙකුගේ නෙතට නැංවූයේ කඳුළකි.

ඉතාම පුංචි තැනකින් ආ මිනිසකුට වුවද පක්ෂයේ ඉහළටම යාමේ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ ජවිපෙ තුළ සත්‍ය ලෙසම තහවුරු කර තිබෙන බවට ඔහුගේ වචන කදිම උදාහරණයකි. ඔහු එම ජනහමුවේදී පවසා තිබුණේ තමා පාසලේ දෙවන පන්තියේ ඉගෙනුම ලබමින් සිටියදී තමාගේ පියා මෙලොව හැර ගිය බවත් ඉන්පසු නංගිලා දෙදෙනෙක් අක්කා ඇතුළු තම පවුලේ සියලු බර කරට ගත්තේ තම මව බවත්ය. ඒ සඳහා ඇය අනේක විධ දුක් කම්කටොළුවලට මුහුණ දුන් බවත්ය. කුලී වැඩ කරමින් තම දරුවන් හදා වඩාගත් ඇය වරෙක පාරවල්වල තාර දැමීම සඳහා අත්වැඩට ගියාය. වරෙක ගල් කොරිවල ගල් කැඩුවාය. වරෙක ගඩොල් පෝරණුවල ගඩොල් කැපුවාය. ඒ අතර තම දරුවන්ට ඉහළට ඉගෙන ගැනීම සඳහා ඉඩකඩ සැලසීමේ වගකීමද ඇය මනාලෙස ඉටුකළාය. එමෙන්ම සමන්ත සහෝදරයා තෝරාගත් දේශපාලන මාවතටද ඇය ආශීර්වාද කළාය. මෙහි විශේෂත්වය නම් ඇය උපතින්ම එජාප පවුලක සාමාජිකාවක් වීමය. මෙම කතන්දරයේ විශේෂය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන බව බොරුවට රටට පෙන්වන බොහෝ පක්ෂ තුළ බලය සහ වස්තුව සඳහා කුලල් කා ගැනීම් පවතිද්දී ඇත්තටම අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ ජවිපෙ තුළ පමණක්ම බව ඔප්පු වීමය. සමන්ත වැනි කුඩා තැනකින් මතු වූ මිනිසකුට පක්ෂය තුළ ඉහළම වගකීම්වලට යාමට මාවත විවර වීමෙන් ඒ බව තහවුරුය.

ලොකු එකාට ලොකු හැන්දෙන් බෙදන පොඩි එකාට පොඩි හැන්දෙන් බෙදන ප්‍රතිපත්තියක් ජවිපෙ තුළ නැත. හැකියාව අනුව කැපකිරීම අනුව පක්ෂයේ ඕනෑම වගකීමකට යා හැකිය. එය ප්‍රායෝගිකව පක්ෂය විසින් තහවුරු කර තිබෙන බවට සමන්ත සහෝදරයා එක් උදාහරණයක් පමණි. ඒ සඳහා සිය දහස් ගණන් උදාහරණ පක්ෂය තුළ ඇත. එනයින් රට භාර දිය යුත්තේ කාටද යන්න රටේ පුරවැසියන් තම හෘද සාක්ෂියෙන් නැවත නැවතත් ප්‍රශ්න කළ යුතු නොවේද?

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පරක්කු වෙලා පංතියට ආවෙ බොරු හදිස්සියක් පෙන්නගෙන. "ගුඩ් මෝනිං ළමයිනේ..."

වසන්තිය "වෙරි ගුඩ් මෝනිං සර්," කියල වටපිට බැලුව, අනිත් අය අත්වැල් ඇල්ලුවෙ නැත්තෙ මොකද කියලා බලන්න.

"ඉන්න සර් වෙලාව බලනකම්," කිවුවෙ කවුද හොයන්න බැරිවුණත් ඒක පොලිටික්කට වැදුණා.

"හරි ළමයිනේ මම ටිකක් පරක්කු වුණා තමයි. මට අද පොඩ්ඩක් නින්ද ගියා. ඊයෙ රෑ නිදි මැරුවනෙ." පොලිටික්ක පටන්ගත්ත ගමන්ම වකූර් කරගන්න බැරි හින්ද කිවුව.

"ඇයි සර් නිදි මැරුවෙ." අනුරුද්දිය ප්‍රශ්නයක් දැම්මෙ පොලිටික්කගෙ අප්සෙට් මූඩ් එක ෆික්ස් කරන්න හිතාගෙන.

"ඇයි ඔය ළමයි නිදි මැරුවෙ නැද්ද?" පොලිටික්කගෙනුත් ප්‍රශ්නයක්.

"ෆුට් බෝල් මැච් ඉවරයිනෙ සර්." කනිය ඇහුවෙ ඇත්තටම මගඇරුණෙ මොන මැච් එකද කියල දැනගන්න.

"මැච් එකක් නෙමෙයි ළමයො. ගායන තරගෙ බැලුවනෙ. කොල්ලගෙ සිංදු ටික මරුනෙ." පොලිටික්ක විඳිනව.

"ආ...සර් කියන්නෙ හිස් ටිං එක ගැනනෙ. අපිත් බැලුව සර්." චමිය සීරියස් ගත්තා.

"අපේ පංතියෙ කතාවනෙ සර්." සමන අර්ථකථන දුන්න.

"ඔව්...හිස් ටිං ගැන සිංදුවක් කිවුව... මොකද්ද අපේ පංතියෙ කතාව කියන්නෙ." පොලිටික්කට කුතුහලේ. "පොලිටිකල් පංතිය ගැනද?"

"හිස් ටිං ගැනවත් මේ ඉලව් පොලිටිකල් පංතිය ගැනවත් නෙමෙයි සර් කිවුවෙ..." සමනගෙත් කට කහනව. "මිනිස්සුන්ගෙ ජීවිතවලට වෙලා තියෙන දේ ගැන. ඒකනෙ අපේ මිනිස්සු තමන් ගැන කතා කරපු ගායකයට එස්එම්එස් ගැහුවෙ."

"සමන් ඉතින් හැම දේකම දේශපාලනේනෙ හොයන්නෙ. අපි වින්දෙ ලස්සන." පොලිටික්ක වටේ බැලුවෙ තමන් හරි නේද කියන්න වගෙ.

"මටනම් දනුෂ්කට හරී... ආදරේ හිතෙනව." වසන්තිය තොඳොලෙ. "එයා හරිම ලස්සනට කිවුව."

"ටීවී එක බලන් හිටියට බිලක් යන්නෙ නැහැ. ඒත් ආදරේ වැඩිවෙලා එස්එම්එස් ගැහුවොත් රුපියල් දහයක් කැපෙනවා. නරකම නෑ." මංජුව ගෙදර කතාබහක් තමන්ගෙ වගේ කිවුව.

"ලස්සන විඳින්න ඕනෙ බව ඇත්ත. හැම එකේම තියෙන දේශපාලනෙත් තේරුම් ගන්න ඕනෙ. අනික මේක පොලිටිකල් පංතියනෙ." සමන වටම ගිහින් ගෙටම ආව. "මිනිස්සු තමන්ගෙ ජීවිතේ හිස් ටින් එකක් වගේ කියපු ගායකයට එස්එම්එස් ගහනව. තමන්ගෙ ජීවිත හිස් ටින් බවට පත්කරපු මිනිස්සුන්ට මනාප ගහනව. ඒක කතා කරන්න ඕන දෙයක් නෙමෙයිද?"

"ඕක නෙමෙයි සමන් ප්‍රශ්නෙ. ධනුෂ්කට හම්බුවෙච්ච ජීප් එක එයාම පාවිච්චි කරයිද නැත්නම් විකුණයිද කියන එක." පොලිටික්ක ආයෙත් දකුණට කැපුව. "මොකද දැන් දනුෂ්කගෙ ජනප්‍රියත්වයෙ හැටියට වාහනයක් ඕනැ. නැද්ද මං කියන්නෙ."

"අන්න හරි සර්. ඕක තමයි ඕනැ සංවාදය." සමන කිවුවෙ දකුණු මහපටැඟිල්ල උස්සල.

"අන්න සමන්ටත් තේරුණා." පොලිටික්කගෙ කට කණේ.

"නැහැ මම කිවුවෙ, ඕක තමයි එයාලට ඕනෙ සංවාදෙ." සමන උස්සල තියෙන්නෙ පොළොවෙ ගහන්න. "දනුෂ්ක ඔය වාහනේ අරගෙන පැද්දත් වික්කත් එයාලට ප්‍රශ්නයක් නැහැ. එයාලට ඕනෙ මිනිස්සු ඒ ගැන කතා කර කර තමන්ගෙ ප්‍රශ්න අමතක කර ගන්න එක. එතකොට හිස් ටින් වගේ මිනිස්සු හැමදාම හිස් ටින්ම තමයි. 'අපි හම්බ කර ගත්තොත් අපි කනව. කොයි ආණ්ඩුව ආවත් අපට එකයි' කියල, එදාවේලට ජන්දෙත් දෙනව. දැන් ආණ්ඩුව ඌවටත් බස්සන්න හදන්නෙ ඒ තියරියමනෙ. දැන් වතුර නැතුව ඉන්න මිනිස්සුන්ට වෙස්සන්තර මූණු දාගෙන වතුර බෙදනව. ඉන්ටවල් ඉවර වුණාම තමයි, මිනිස්සුන්ට අපායෙ රඟේ තේරෙන්නෙ." සමනගෙ බ්‍රේක් නැති කතාව අතරෙ පොලිටික්ක කැන්ටිම පැත්තට ගියේ හිස් ටිං එකකට පයින් ගහගෙන.

## 09 පිටුවෙන් එක්සත් ජනපද ...





සංගමය බිහි කරනු ලැබීය. එහි බලපෑම මත මේවන විට දකුණු ඇමරිකාව පුරා අධිරාජ්‍ය විරෝධී ප්‍රගතිශීලී පාලනයන් ගණනාවක්ම බිහි වී ඇත. දකුණු ඇමරිකාව තුළ වන අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය සහ ලෝකයේ නැගී එන ආර්ථිකයන්ගෙන් යුත් බ්‍රික්ස් රටවල් අතර ගොඩනැගෙන සහයෝගීතාව එකී අධිරාජ්‍ය විරෝධී අරගලයට නව පණක් එක් කරනු ඇතැයි බලාපරොත්තු විය හැකි ය.

එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල් සහ නැගී එන ආර්ථිකයන්ගෙන් යුත් බ්‍රික්ස් රටවල් අතර ස්වාභාවික සම්පත් සහ වෙළඳපළ අරභයා දරුණු තරගයක් පැන නැගී ඇත. එම තරගයේ දී තමන්ගේ මෙවලම් බවට පත්කර ගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව මගින් ලෝක දේශපාලනය තමන්ට අවශ්‍ය ආකාරයට හසුරුවා ගනිමින් වාසි අත්කර ගැනීමට එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවලට හැකි වී ඇත. ලිබියාව, සිරියාව, යුක්රේනය, පලස්තීනය යන සෑම තැනකම සිදුවන්නේ එයයි. එවන් වටපිටාවක් තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අධිරාජ්‍ය ගැති පාර්ශ්වීය ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල කළ හැකි එකතුවක් බිහි වීම ඉතා හොඳ දෙයකි. අධිරාජ්‍යවාදී ආර්ථික ආධිපත්‍ය ලොව පුරා පතුරවනු ලබන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත්, ලෝක බැංකුවටත් එරෙහිව වෙනත් ආර්ථික කේන්ද්‍රයක් බිහි වීමද ඉතා හොඳ දෙයකි. එමගින් එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදය දුර්වල කරනු ඇත. එහෙත් බ්‍රික්ස් සංවිධානය සමාජවාදී අර්ථයකින් අධිරාජ්‍යවිරෝධී යැයි වටහාගත යුතු නැත.

## 05 පිටුවෙන් පහසු මඟද...

දේවල් සකසා ජනතාවට විකුණා ගැනීමට කටයුතු කරන්නා සේ දැන් දේශපාලනයේදීද දේශපාලනය උණුසුම්ව ඇති විට හැම දෙනාම තම තමන්ගේ අරමුණු මේ තුළ ඉටුකර ගැනීමට උත්සාහ දරනු පෙනේ. මේ දිනවල වැඩපිළිවෙළවල්, ප්‍රතිපත්ති මාලා රැසක් ඉදිරිපත් කෙරී තිබෙන අතරම විවිධ වර්ගයේ සංවාද, කථිකා රැසක්ද ආරම්භ වී තිබේ. එහෙත් ඒ කිසිදු ප්‍රතිපත්ති මාලාවක් තුළ කිසිදු සංවාදයක හෝ කථිකාවක ලාංකේය ජනතාව මුහුණ දී සිටින ප්‍රශ්නය නිවැරදිව හඳුනා ගැනීම හෝ ඊට නිවැරදි විසඳුම්ද නැත. ඒ වෙනුවට ඇත්තේ, ප්‍රශ්නය මතුපිටින් ස්පර්ශ කිරීම හා කිසිවිට ධනවාදය තුළ යථාර්ථයක් කළ නොහැකි ලස්සන අලංකාර ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීමය.

මේ තත්වය තුළ ධනවාදයෙන් පීඩාවට පත් සැබෑ වෙනසක් ඉල්ලා සිටින ජනතාවගේත් ජනතා බලවේගයන්ගේත් වගකීම වන්නේ කුමක්ද? මෙම මතුපිට සංදර්ශනවලින් නොමඟ නොයා ඒවායේ ඇති පංතිමය අරමුණු වටහාගෙන නිවැරදි දේශපාලන ගමනක් සඳහා යොමු වීමය.



සරල හා පහසු මාර්ගය වෙනුවට, දුෂ්කර වුවත් නිවැරදි මාර්ගය තෝරා ගැනීමය. රාජපක්ෂවරුන් පලවා හැර ධනවාදය ඉතිරි කරගන්නා විසඳුමක් වෙනුවට රාජපක්ෂ පාලනයත් ධනවාදයත් දෙකම පරාජය කොට නව ජනතාවාදී පාලනයක් ගොඩ නගන දේශපාලන ගමන් මඟක් තෝරා ගැනීමය. ඒ සඳහා ජ.වි.පෙ. සමග අත්වැල් බැඳ සැබෑ ජනතා ව්‍යාපාරයක් ගොඩ නැගීමට දායකවීම මේ මොහොතේ ප්‍රගතිශීලීත්වය අගයන සැබෑ වෙනසක් පතන සැමගේ වගකීමය.

## 02 පිටුවෙන් කොරියානු විශ්‍රාම...

ලංකාවට ආපහු එනකොට ඒ මුදල් ඒ ගොල්ලන්ගේ අතට ලබාදෙනවා. එතකොට ඒ පිරිස් හිතන්නේ එය තමන්ට ලැබුණු වැටුපක් නැත්නම් තමන්ට ඕන විදියට වියදම් කරන්න පුළුවන් කියලා, ලංකාවට ඇවිල්ලා ඒ අය රිසි සේ ඒවා වියදම් කරනවා. හැබැයි ඒ අය අනාගතය ගැන හිතන්නේ නැහැ. ඉතිං ඒ නිසා අපි වැඩපිළිවෙළක් දියත් කර තිබෙනවා. කොරියාවට ගිහිල්ලා, කර්මාන්ත ශාලා හිමිකරුවන් සමග සාකච්ඡා කරලා, ඒ මුදල් සමාජ ආරක්ෂණ මණ්ඩලයට ලබාගෙන ඒ අයට අවුරුදු 60න් පස්සේ විශ්‍රාම වැටුප ලබාදීමේ ක්‍රමවේදයක් අපි දැන් කතා කරලා තිබෙනවා. ඒ වගේම මේක කොරියාවට විතරක් සීමා වන්නේ නැහැ"

කොරියානු රටේ ලංකාවේ පුරවැසියන් රැකියාවක් කරන විට අදාල ශ්‍රමිකයින් රැකියාව අවසන් කර ලංකාවට එනවිට ඔවුන්ගේ මාසික වැටුපෙන් අඩුකරගත් සහ සේවා යෝජකයා විසින් ගෙවන ලද කොටස්වල එකතුව ශ්‍රමිකයින්ට මුදලක් ලෙස ලැබෙනවා. අප දන්නා අන්දමට එම මුදල යොදාගෙන මෙවැනි අරමුදලක් ගොඩනැගීම සම්බන්ධයෙන් කොරියාවේ හෝ වෙනත් රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයින් සමග සාකච්ඡා කොට ඇති බවක් පෙනෙන්නට නැහැ. ඔවුන්ට අයත් අරමුදල් සමාජ ආරක්ෂණ අරමුදල භාරයට ලබාගැනීමට උත්සහ දරන්නේ, හුදෙක් එම සේවකයින්ගේ සුබසිද්ධිය සඳහා නොව ආණ්ඩුව සහ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ අරමුදල මුහුණ දී සිටින මුදල් අර්බුදය සමනය කර ගැනීම සඳහා බව පෙනී යනවා.

කෙසේ නමුත් එවැනි විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් සකස් කළ හොත් ඔවුන්ට ප්‍රතිලාභ ලැබෙන්නේ, ඔවුන්ගේ වයස අවු. 60 පිරීමෙන් අනතුරුවයි. එවිට එම පුද්ගලයින්ට තමන් විසින් අතිශය දුෂ්කරතාවයන් මධ්‍යයයේ උපයාගත් තමන්ගේ මුදල් තමන්ට හැකි පරිදි පරිශීලනය කිරීමට වසර ගණනාවක් බලාසිටිය යුතුයි. උදාහරණයක් ලෙස වයස අවු. 35ක පුද්ගලයකු නම් ඔහුට වසර 25ක් බලාසිටීමට සිදුවෙනවා. එසේම එම මුදල් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට ලබාගත් පසු වසර ගණනාවක් තුළ එම මුදල්වලට කුමක් සිදුවන්නේද යන්නත් පැහැදිලි නැහැ.

එමෙන්ම මීට පෙරද මෙවැනි උත්සාහයක් ආණ්ඩුව විසින් දරන ලද අතර 2011 දෙසැම්බර් මස 16වෙනි දින හෝ අසන්න දිනක මා ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් මේ පිළිබඳව විමසා සිටියා. එම අවස්ථාවේ එයට පිළිතුරු දුන් ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා කියා සිටියේ එය වෙබ් අඩවියක් මගින් ප්‍රචාරය කරන ලද මඩ ප්‍රවෘත්තියක් බවයි. තමන් කොරියානු සංචාරයේදී සිදු කළේ වසර 05කින් ලබාගත යුතු එම අරමුදල ලබාගැනීමට නොහැකිව තිබූ ගැටලු සහගත තත්වය කොරියානු රජය සමග එක්වී විසඳා දුන් බවත් කියනු ලැබුවා. එමෙන්ම කිසිසේත් එම ප්‍රතිලාභීන්ට එම මුදල ලබාගැනීමට අවු. 60 සම්පූර්ණ වන තෙක් සිටිය යුතු නැති බවත් අමාත්‍යවරයා අවධාරණය කරන ලැබුවා.

මේ තත්වය තුළ පොදුවේ විදෙස්ගත ශ්‍රමිකයින් අතරත් විශේෂයෙන් කොරියාව තුළ රැකියා කරන ශ්‍රී ලාංකික සේවක සේවිකාවන් අතරත් ගොඩ නැගී තිබෙන මෙම ව්‍යාකූලත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනවා. එසේම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අයත් ගරු විෂයභාර අමාත්‍යතුමා පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබාදෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

01. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ඉහත ප්‍රකාශ කොට ඇති අන්දමට විදෙස්ගත ශ්‍රමිකයින්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කර තිබේද?

02. එම මුදල් කොරියාව තුළ රැකියා කරන ශ්‍රී ලාංකික සේවක සේවිකාවන්ට අයිති බව පිළිගන්නේද?

03. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව විදෙස්ගතව රැකියා කරන්නන් සමග හෝ ආදාල පාර්ශවයන් සමග යම් සාකච්ඡාවක් කර තිබේද? ඒ සඳහා ඔවුන්ගේ එකඟතාව ලැබී තිබේද?

04. මෙම ප්‍රයත්නය වැරදි බව පිළිගන්නේද? එය නතර කිරීමට පියවර ගන්නේද?

## 03 පිටුවෙන් ජනතාව...

පාවිච්චි කළත් අවසානයේදී ඌව පළාත දරිද්‍රතාවය වැඩිම පළාතක් වී තිබෙනවා.

***නියමුවා: ජනතාව කොතරම් පීඩනයට ලක්වී සිටියත් පසුගිය 2009 පළාත් සභා මැතිවරණයේදී ආණ්ඩුවට 81%ක ඉහළ ප්‍රතිශතයක් ලබාදුන්නේ මොනරාගලයි. ඉදිරි මැතිවරණයේදී ජනතාව කෙසේ හැසිරෙයිද?***

***ජයවර්ධන සහෝදරයා:*** පසුගිය 2009 පළාත් සභා මැතිවරණය පැමිණෙන කොට මොණරාගල දිස්ත්‍රික්කෙ ජීවත් වුණ මිනිස්සුන්ට තිබුණු ප්‍රශ්නෙ වෙනස්. ඒ වෙනකොට මේ රට පාලනය කරපු ඌව පාලනය කරපු පොදු පෙරමුණු සන්ධාන ආණ්ඩු ගෙන ගිය ක්‍රියාදාමය තුළ ඌවේ ජනතාව මහත් පීඩනයට පත්ව තිබුණා. එතකොට ඒ තුළ මොණරාගල දිස්ත්‍රික්කයයේ පාර්ලිමේන්තුව නියොජනය කළ සුමේධලා, සොයිසලා, පුෂ්පකුමාරලා අය ගැනත් පළාත් සභාව නියෝජනය කළ අය ගැනත් ජනතාවගේ විශ්වාසය බිඳ වැටී තිබුණා. මේ නිසා මොණරාගල නොවන කෙනෙක් වුණ ශෂින්ද්‍ර එනකොට ජනතාව ඔහු වටා පෙළ ගැහුණා.

ඒ තමයි රාජපක්ෂ ජනාධිපතිවරයාගේ බලය උච්ඡතම අවස්ථාවට ආපු මොහොත. එක බාප්ප කෙනෙක් රටේ ජනාධිපති. අනෙක් බාප්පා රටේ ආර්ථිකය භාර ඇමතිවරයා. තවත් බාප්ප කෙනෙක් රටේ ආරක්ෂාව මෙහෙයවන ප්‍රධානියා. අනෙක් පැත්තෙන් තාත්තා පාර්ලිමේන්තුවෙ කථානායක. මෙවැනි රාජපක්ෂ පවුලේ නියෝජිතයෙක් තමයි මොණරාගලට එන්නේ. මේ අනුව දිස්ත්‍රික්කයේ ජනතාව දිස්ත්‍රික්කයේ හිටපු දේශපාලන නායකත්වයට එරෙහි ක්‍රියාමාර්ගයක් ලෙස තමයි ශෂින්ද්‍ර රාජපක්ෂව තෝරා ගන්නේ. ඔවුන් සන්ධානයට ඡන්දය දීලා එක මනාපයක් රාජපක්ෂ නියෝජිතයාට දීමට තීරණය කරනවා. ඒ නිසා තමයි 2009දී 81% ක ඡන්ද ප්‍රතිශතයක් මොණරාගලින් ලැබෙන්නේ.

කොහොම වුණත් දැන් තත්වය 2009 තිබුණු වාතාවරණයට වඩා හුඟක් වෙනස්. ආණ්ඩුවට විකුණන්න අලුත් දෙයක් නැහැ. ජනතාව තමන්ගේ ගැලවුම්කාරයා බොරුකාරයෙක් බව තේරුම්ගෙන අවසන්. එම තත්වය ඉදිරි මැතිවරණයේදී නිසැක ලෙසම පෙන්නුම් කරාවි.



***නියමුවා: ඔබ දිස්ත්‍රික් නායකයා ලෙස නම්කිරීම ඇතුළු වෙනස්කම් කරමින් ජ.වි.පෙ. කල්ඇතුවම මැතිවරණ වැඩකටයුතු ඇරඹුවා. ජනතාවගෙන් ඊට ලැබෙන ප්‍රතිචාර කොහොමද?***

***ජයවර්ධන සහෝදරයා:*** මෙම ඌව පළාත් සභා මැතිවරණය ඌව ජනතාවට බලපාන මැතිවරණයක් පමණක් නොව ජාතික දේශපාලනයේ සන්ධිස්ථානයක්. එනිසාම ජ.වි.පෙ. මෙම පළාත් සභා මැතිවරණය ඒ බරින්ම ගෙන කටයුතු කරමින් තිබෙනවා.

ඉතාම ඉහළ ප්‍රතිචාරයක් මේ මොහොත වන විට ලැබෙමින් තිබෙනවා. අපි මාස 1 1/2ක් 2ක් පුරා ගමින් ගමට නගරයෙන් නගරයට යමින් ජනතාව මුණගැසෙමින් ඔවුන් සමග සාකච්ඡා කරමින් ඉන්නවා. එතකොට අපට දැනෙන දෙයක් තිබෙනවා. රාජපක්ෂ පාලනය, රාජපක්ෂ පරම්පරාව පිළිබඳව විශ්වාසය තබා 2009දී ඡන්දය ලබාදුන් ජනතාව මෙදා පාර රාජපක්ෂ පාලනයට දැවැන්ත කණේ පාරක් එල්ල කරන්න සූදානමින් සිටිනවා.

එතකොට රාජපක්ෂවරුන්ගේ නියෝජිතයා බවට පත්වූ ශෂින්ද්‍ර රාජපක්ෂට මෙවර මැතිවරණයේදී තමන්ගේ බලය අත්හැරීමට සිදුවන තත්වයට යන්න සිදුවෙනවා. අපි පෙනෙන්නට තිබෙන්නේ, ජනතා විමුක්ති පෙරමුණට මොණරාගල දිස්ත්‍රික්කය තුළ ඉතාම ඉහළ තලයක ජයග්‍රහණයක් අත්කර ගත හැකි මට්ටමට ජනතාව මේ මොහොතේ අප සමග එක්වෙමින් සිටින බවයි.

සැබෑ විපක්ෂයේ කාර්යභාරය පළාත් සභාවෙත් පාර්ලිමේන්තුවෙත් ප්‍රාදේශීය සභාවෙත් වීදියෙත් මැනවින් ඔප්පු කර පෙන්වූ දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. ඌව පළාත් සභාව තුළ ශක්තිමත් ජයග්‍රහණයක් ස්ථාපිත කළ හැකි යයි අප විශ්වාස කරනවා.

## 03 පිටුවෙන් මේ මැතිවරණය...

ඔවුන් පළාත් සභා යන්න හදන්නේ වතු කම්කරු ජනතාවගේ ප්‍රශ්න විසඳීමට නොවන බව ඉතාම පැහැදිලියි.

වතු ජනතාවගේ ජීවිත මුළුමනින්ම ගැටගසා ඇත්තේ වත්තටයි; වතුකරයටයි. ඔවුන්ට ඔවුන් නියෝජනය කරන්නේ යැයි කියමින් දේශපාලනය කරන ඊනියා නායකයින්ගේ ජීවිත ගැන හොයන්න ඔවුන්ට වෙලාවක් නැහැ. ඒ නිසාම නිවැරදි අදහසක් නැහැ.

කොහෙම වුණත් මේ වන විට වඩා සංවේදී කොටස් මේ තමන් පාවා දෙන නායකත්වයට එරෙහිව විකල්පයක් ගොඩනැගිය යුතු බව තේරුම් ගනිමින් ඉන්නවා. තොණ්ඩමන්ලා, දිගම්බරන්ලා බඩගෝස්තරවාදය වෙනුවෙන් දේශපාලනය කරන අය බව ඔවුන් දකිනවා. ඔවුන් අලුතෙන් හිතන්න පටන් අරන් තිබෙනවා.

***නියමුවා: සමස්ත ලංකා වතු කම්කරු සංගමය තුළ ඔවුන් සංවිධානය කරන ජනතා විමුක්ති පෙරමුණට මෙවර ඔවුන්ගේ ප්‍රතිචාර කවරාකාර වෙයිද?***

***රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා:*** විශාල වශයෙන් නොවුණත් වතු ජනතාව ක්‍රමයෙන් තමන්ව රවටමින් දේශපාලනය කරන සාම්ප්‍රදායික නායකත්වය ප්‍රතික්ෂේප කරමින් ඉන්නවා. විශේෂයෙන් තොණ්ඩමන්ලා සතුව තිබූ අධිකාරිත්වය බිඳී විසිරී යමින් තිබෙනවා. සැලකිය යුතු කොටසක් සමස්ත ලංකා වතු කම්කරු සංගමය වටාත් ඒකරාශි වෙමින් සිටිනවා. ඔවුන් ජ.වි.පෙ. හඳුනාගෙන තිබෙනවා. නොසිතූ ආකාරයෙන් වතු ජනතාවගෙන් අපට හොඳ ප්‍රතිචාර ලැබෙනවා.



මේ වන විට වතු ප්‍රදේශවල අපේ දේශපාලන ක්‍රියාකාරීන්ට විවිධ තර්ජන එල්ල වෙමින් තිබෙනවා. මරණීය තර්ජනත් එල්ල වෙනවා. මේ තුළ අපි හඳුනා ගන්නේ අපේ දේශපාලනය අද වන විට ඔවුනට තර්ජනයක් බවට පත්වී ඇති ආකාරයයි.

## 11 පිටුවෙන් ප්‍රාග්ධනය...

එපරිදිම පාවහන් සැපයුම වැඩිවන අතර, එහි මිල භාණ්ඩයේ වටිනාකමට වඩා පහත වැටෙනු ඇත. මෙම කර්මාන්ත දෙකේම ලාභ සමාන වනතුරු, එනම් කර්මාන්ත දෙකේම ලාභ අනුපාතිකය සමාන වන තුරුම මෙම ප්‍රාග්ධන ගලා යාමේ හුවමාරු ක්‍රියාවලිය සිදුවේ. ඉහත උදාහරණයේදී කර්මාන්ත දෙකේම සාමාන්‍ය ලාභ අනුපාතය 25%කි. එවිට සපත්තු කර්මාන්තයේ රු:100,000/= ආයෝජනයට ප්‍රතිලාභය රු:25,000/=ක් වන අතර යන්ත්‍රෝපකරණ කර්මාන්තයේදී ලාභය රු:25,000/=කි. නමුත්, මෙම ලාභය පිළිවෙළින් මෙම කර්මාන්ත දෙක බිහි කළ අතිරික්ත වටිනාකමට සමාන නොවනු ඇත.

ලාභ අනුපාතය හා අතිරික්ත වටිනාකම අතර, සම්බන්ධය සහ ලාභ අනුපාත සමානවීම අපි සලකා බැලුවේ කර්මාන්ත දෙකක් උදාහරණයට ගනිමිනි. ජාතික ආර්ථිකය පුරාද සිදුවන ක්‍රියාවලිය ද මෙපරිදිය. එම තත්වය ලබන කලාපයෙන් අපි විමසා බලමු.

# ඈ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




සහෝදරත්වයේ දින වේදිකාවෙන්



සහෝදරත්වයට රොද බැඳ




ජාතිවාදයට එරෙහි අත්සනක්



වර්ණවත් වන සහෝදරත්වයේ සිත්තම




පලස්තීනයට ජ.වි.පෙ ඉතාලි කමිටු සහය




ත්‍රිකුණාමලයට ජ.වි.පෙ කාර්යාලයක්

# මේ රට අපේ කාගෙත් රටයි

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



රට සියලු දෙනාගේ රට බවත් රටේ, ජනතාවගේ අනාගතය, උසස්කම රඳාපවතින්නේ සිංහල දෙමළ මුස්ලිම් බර්ගර් මැලේ ජාතික සමගිය ආරක්ෂා කිරීමෙන් පමණක් බවත් ජාතික සමගිය ගොඩනැගිය හැකි වන්නේ සියලු දෙනාගේ සම අයිතිය පිළිගැනීමෙන් පමණක් බවත් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා අවධාරණය කළේය.

ඔහු මේ බව පැවසුවේ පසුගිය 27වැනි දින කොළඹ විහාර මහදේවි එළිමහන් රංගපීඨයේ පැවති සහෝදරත්වයේ රැලිය අමතමිනි.

භාෂාවේ සම අයිතිය, සංස්කෘතියේ සම අයිතිය, ඇදහිලි සහ විශ්වාසයන්ගේ සම අයිතිය පිළිගන්න රටක් අප විසින් ගොඩ නැගිය යුතුව ඇති බව කී ඔහු සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජනතාව මේ රටේ ජීවත්වෙන බවත් මේ රටේ ආර්ථිකයට හවුල් වෙන බවත් මේ රටේ මියැදී මහ පොළවට පස්වෙන බවත් පෙන්වා දුන්නේය.

"මේ රට ඉදිරියට ගෙනයායුතු තාරුණ්‍යයක් අද අවශ්‍යවී තිබෙනවා. ඈත පිටිසර ගම්මානවල කුඹුරත් එක්ක හේනත් එක්ක ශ්‍රමය වගුරන ගොවි ජනතාව වෙනුවෙන් කම්හලේ ගොවිපළේ අනේකවිධ දුක්ඛ දෝමනස්සයන්වලට මුහුණ දෙමින් සිටින ජනතාවට මීට වඩා උසස් සමාජයක් දිනාගන්න සටන් වදින තාරුණ්‍යයක් අද රටට අවශ්‍යවී තිබෙනවා.

සිංහල හෝ මුස්ලිම් හෝ ජනතාවට තිබෙන්නේ වෙන්ව අරගලයක් නොවේ. ජාතික සමගිය වෙනුවෙන් වෙනුවෙන් මෙන්ම සාමානාත්මතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් එක්ව අරගලයක් තිබෙනවා. ඒ අරගලයේ පෙරගමන්කරුවන් වීමට සමාජවාදී තරුණ සංගමයට විශාල කාර්යභාරයක් තිබෙනවා. නාමල්කරණය වූ තාරුණ්‍යය වෙනුවට මේ රටටත් ජනතාවටත් මීට වඩා ආදරයකරන, ප්‍රේම කරන තාරුණ්‍යයක් ගොඩනැගිය යුතුයි. ඒ සඳහා එක්ව අරගල කිරීමට ජයග්‍රහණ සඳහා අරගල මෙහෙයවීමට සටන ඉදිරියට ගෙනියමු." අනුර දිසානායක සහෝදරයා ඇරයුම් කර සිටියේය.

# ආණ්ඩුව නිදහස් සෞඛ්‍ය සේවය මරා දමනවා

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

ආණ්ඩුව අභ්‍යන්තර ගැටලුවලට මුවාවී නිදහස් සෞඛ්‍යය ඇතුළු මහජන සේවා මරා දැමීමට කටයුතු කරමින් සිටින බවත් නිදහස් සෞඛ්‍ය සේවය ආරක්ෂා කර ගැනීම සියලු දෙනාගේ වගකීමක් වන බැවින් ඒ සඳහා පෙළ ගැසෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින බවත් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මෙම අදහස් පළකළේ පසුගිය 02වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවක සේවිකාවන්ට නිදහස් මනසකින් තමන්ගේ වෘත්තීය කටයුතු කිරීමට නොහැකි වී ඇති බවත් ඔවුන් දැඩි මානසික පීඩාවකින් සිටින බවත් පෙන්වා දුන් ටිල්වින් සිල්වා සහෝදරයා මෙහි ප්‍රතිඵලයක් ලෙස රෝගීන් දැඩි අපහසුතාවයකට ලක්වී ඇති බවත් පෞද්ගලිකව ප්‍රතිකාර ලබාගැනීමට නොහැකි දුප්පත් රෝගීන් දැඩි අසරණභාවයකට පත්වී තිබෙන බවත් කියා සිටියේය. "සේවක සේවිකාවන්ගේ ගැටුම දෙසත් වේදනාවට පත්වන රෝගීන් දෙසත් බලමින් ආණ්ඩුව පහත් වින්දනයක් ලබමින් ඉන්නවා." ඔහු පැවසීය.

"ආණ්ඩුව වාර්ෂිකව සෞඛ්‍යය සඳහා වෙන්කරන මුදල වාර්ෂිකව අඩුකර තිබෙනවා. 2006දී දළ ජාතික නිෂ්පාදනයෙන් 1.97%ක් සෞඛ්‍යයට වෙන්කරනු ලැබුවා. එසේ වුවත් 2013දී එය 1.3% දක්වා අඩු කළා. මේ අනුව නිදහස් සෞඛ්‍යය මරා දැමීම ආණ්ඩුවේ අරමුණ බව පැහැදිලියි. දළ දේශීය නිෂ්පාදිතයෙන් 5%ක්වත් සෞඛ්‍යයට වෙන්කළ යුතු බව ලෝකයේ පොදු පිළිගැනීම වී තිබෙනවා.




ලංකාවේ සාපේක්ෂව හොඳ සෞඛ්‍ය සේවයක් පවතිනවා. එය ආණ්ඩුවේ හපන්කමක් නොවෙයි. එහි ගෞරවය හිමිවිය යුත්තේ වෛද්‍යවරුන්ට සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයටයි.

ආණ්ඩුව තමන් විසඳිය යුතු ප්‍රශ්න නොවිසඳා වගකීමෙන් නිදහස් වෙනවා. එය සේවක සේවිකාවන් අතර ගැටලුවක් බවට හෝ රෝගීන් හා සෞඛ්‍ය සේවකයින් අතර ගැටලුවක් බවට පත්වීමට ඉඩහැර තිබෙනවා. එමගින් තමන්ගේ නොහැකියාව වසා ගැනීමට ආණ්ඩුව කටයුතු කරනවා. අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය සමිතිවලින් ඉල්ලා සිටින්නේ ආණ්ඩුවේ මේ උපක්‍රමය තේරුම් ගන්න කියලා." ටිල්වින් සහෝදරයා වැඩිදුරටත් කීය.

# අධිරාජ්‍යවාදයට හා යුදෙව්වාදයට එරෙහිවීම ලොව පුරා ජනතාවගේ වගකීමක්

## ජ.වි.පෙ. ජාත්‍යන්තර කටයුතු ලේකම් සෝමවංශ අමරසිංහ සහෝදරයා



මේ මොහොතේ එක්සත් ජනපදය ප්‍රමුඛව අධිරාජ්‍යවාදී රටවල් වෙනත් ජාතීන් 124ක් ගැටුම්කාරී තත්වයන්ට තල්ලු කර තිබෙන බව පැවසූ ජ.වි.පෙ. ජාත්‍යන්තර කටයුතු ලේකම් සෝමවංශ අමරසිංහ සහෝදරයා, මේ තත්වය හමුවේ යුදවාදී එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ හා අන්ත ප්‍රතිගාමී යුදෙව්වාදයේ අශුද්ධ සන්ධානයට ලෝකය විනාශ කිරීමට ඉඩ දෙනවාද නැතහොත් අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරය ශක්තිමත් කරන්නේද යන දෙකින් එකක් ලොව පුරා ජනතාව විසින් තෝරාගත යුතුව ඇතැයි පෙන්වා දුන්නේය.

ඔහු මෙසේ පැවසුවේ, පසුගිය 03වැනි දින නේපාල කොමියුනිස්ට් පක්ෂයේ 09වැනි සමුළුවේ ආරම්භක අවස්ථාවට සුභපැතුම් එක්කරමිනි.

"1914 වසරේ පළමු ලෝක අධිරාජ්‍යවාදී යුද්ධය ආරම්භ වීමෙන් පසු වසර සියයක් පිරෙන්නේ 2014දීයි. අධිරාජ්‍යවාදී දෙවැනි ලෝක යුද්ධය අවසානයේ ලක්ෂ සංඛ්‍යාත ජනයාද සම්පත්ද විනාශ වුණා. දැන් මේ මොහොතේ අධිරාජ්‍යවාදය තුන්වන ලෝක යුද්ධයකටද ලෝකය තල්ලු කරමින් ඉන්නවා." ඔහු අනතුරු ඇඟවීය.

අධිරාජ්‍යවාදයට හා යුදෙව්වාදයට එරෙහිව සංවිධානය වීම හා සටන් වැදීම ආසියානු කලාපයේ හා ලොව පුරා වෙසෙන අධිරාජ්‍යවිරෝධී ජනතාවගේ වගකීම බවද එහිදී නේපාල කොමියුනිස්ට් පක්ෂයට හා ජනතා විමුක්ති පෙරමුණට පැවරෙන වගකීම ඉටු කිරීමට සමගියෙන් පෙළ ගැසිය යුතු බවද සෝමවංශ සහෝදරයා අවධාරණය කළේය.

# රාජපක්ෂ පවුලේ සා.පෙ. ප්‍රතිඵල රටට හෙළිදරව් කරන්න

## සමාජවාදී ශිෂ්‍ය සංගමය



උසස් පෙළ හැදෑරීම සඳහා ගණිතය විෂය අවශ්‍ය නොවන බවට යෝජනා කරමින් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙන බවට චෝදනා කළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක නලින්ද ජයතිස්ස සහෝදරයා, ගණිතය විෂය ඉවත් කිරීමට පෙර මේ පාර්ලිමේන්තුවේ සිටින මැති ඇමතිවරුන්ගේ හා රාජපක්ෂ පවුලේ සාමාජිකයින්ගේ සා.පෙ. ප්‍රතිඵල රටට හෙළිදරව් කරන ලෙසට අභියෝග කළේය.

ඔහු මෙසේ ප්‍රකාශ කළේ සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය වන ගැටලු පිළිබඳව පසුගිය 17වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය.

# විකල්ප දේශපාලන පෙරමුණක අවශ්‍යතාවය දැනෙමින් තිබෙනවා

## ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා



එක්සත් ජාතික පක්ෂ, ශ්‍රීලනිප සාම්ප්‍රදායික දේශපාලනයට එරෙහිව නව දේශපාලන ක්‍රමයක් අවශ්‍ය වී තිබෙන බවත් එනිසාම විකල්ප දේශපාලන පෙරමුණක අවශ්‍යතාවය දැනෙමින් තිබෙන බවත් කියා සිටි ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ඒ සඳහා අවශ්‍ය වන මූලික පියවරයන් ජ.වි.පෙ. විසින් මේ වන විටත් තබා ඇතැයි ප්‍රකාශ කළේය.

ඔහු මෙම අදහස් පළකළේ පසුගිය 13වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"රනිල් වික්‍රමසිංහගේ පෙරමුණත් මහින්ද රාජපක්ෂ මහතාගේ පෙරමුණත් දෙකම නියෝජනය කරන්නේ මේ කුණුවෙලා තිබෙන ගඳ ගහන ධනපති ක්‍රමයයි. ඒ ක්‍රමයට අපේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න බැහැ. ඒනිසා නව සමාජ ක්‍රමයක් අපේ රටේ ජනතාව ඉල්ලා සිටිනවා. එම අවශ්‍යතාවය ඉටුකරන්න නම් විකල්ප පෙරමුණක් අවශ්‍යයි. එම විකල්ප පෙරමුණ ගොඩනැගීමේ වගකීම තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණටයි. ඒ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් මැලේ සියලු ජනතාවත් එක්ක පුළුල් පෙරමුණක් ගොඩනැගීමේ කටයුත්ත අපි දැනටමත් ආරම්භ කර තිබෙනවා. එය මේ රටේ සමාජ පරිවර්තනයක් දක්වා ගෙන යාම අපේ අරමුණයි."

මෙම මාධ්‍ය හමුවට ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයාද එක්වී සිටියේය.


කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.